## අවිනිශ්චිතත්වයෙන් දිවිගෙවීම

# ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා

ICRC

වා ර් තා ව

ජාත්‍යන්තර රතු කුරුස කමිටුව
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5
ශ්‍රී ලංකාව
දුරකථන +94 (11) 250 33 46, ෆැක්ස් +94 (11) 250 33 48
විද්‍යුත් තැපෑල: colombo@icrc.org
©ICRC

වව්නියාව කාර්යාලය
70, වයිරවර් කෝවිල පාර
වයිරවර්පුලියන්කුලම්
වව්නියාව
ශ්‍රී ලංකාව
දුරකථන +94 (0) 24 222 28 55, ෆැක්ස් +94 (0) 24 222 28 37

මඩකලපුව කාර්යාලය
මන්රීසා පාර
කොතුකුලම්, පිලයාරෙඩි
මඩකලපුව
ශ්‍රී ලංකාව
දුරකථන +94 (0) 65 222 70 70

ICRC

## අවිනිශ්චිතත්වයෙන් දිවිගෙවීම

# ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා

# ස්තුතිය පළ කිරීම

සිය කාලය මිඩංගුකරමින්, ප්‍රශ්නාවලියට පිළිතුරු සපයමින් සහ කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගිවෙමින් පවුල්වල අවශ්‍යතා පිළිබඳ තක්සේරුවට සහභාගිවූ බොහෝ පවුල්වලට මෙම වාර්තාව ප්‍රකාශයට පත්කරන අවස්ථාවේදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ප්‍රථමයෙන් සිය ස්තුතිය පළ කරයි.

අපගේ අපේක්ෂාව වන්නේ රජයට, අතුරුදහන්වූ පුද්ගලයන්ගේ සියළුම පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස පුළුල් ප්‍රතිචාරයක් සකස්කර ගැනීමට මෙම වාර්තාව උපකාරිවන බවයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ වෙනත් ජාතික සහ ජාත්‍යන්තර පාර්ශවකරුවන්ට එම පවුල්වල යහපත පිණිස වැඩසටහන් සම්පාදනය කරගැනීමට එය පදනම් සපයනු ඇත.

# පටුන


**කෙටියෙදුම් සහ සංකේතනාම**

**ප්‍රධාන භාෂිත වචන සහ නිර්වචන** i

**විධායක සාරාංශය** iii

**1. හැඳින්වීම** 1

**2. පසුබිම් තොරතුරු** 3

2.1. අතුරුදහන්වූ පුද්ගලයන්ගේ ජනවිකාශ වගතුග 3

**3. මෙම තක්සේරුවේ අරමුණු** 7

**4. තක්සේරු පැවැත්වීමේ ක්‍රමවේදය** 9

4.1. දත්ත රැස්කිරීම 9

4.2. නියැදියේ ප්‍රමාණය සහ ව්‍යුහය නිර්වචනය කිරීම 10

**5. තක්සේරුවෙන් සොයා ගත් කරුණු** 15

5.1. තමන්ගේ අතුරුදහන් ඥාතින්ට අත්වූ ඉරණම කුමක්දැයි හෝ එම ඥාතියා කොහේ සිටීදැයි දැනගැනීමට පවුල්වලට ඇති අවශ්‍යතාව 16

5.2. මනෝ සමාජීය අවශ්‍යතා 18

5.3. ආර්ථික අවශ්‍යතා 21

5.4. නෛතික සහ පරිපාලන අවශ්‍යතා 23

5.5. යුක්තිය ඉටුවීමේ සහ පිලිගැනුමේ අවශ්‍යතාව 25

**6. නිර්දේශ** 28

6.1. ශ්‍රී ලංකාවේ බලධාරීන් වෙත යොමුකෙරෙන ප්‍රධාන නිර්දේශ 28

6.2. සෙසු පාර්ශවකරුවන් සඳහා වන නිර්දේශ 29

**7. ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වලට හිතකරලෙස ICRC ඉටුකරන කාර්යයන්** 31

**8. අවසාන නිගමනය** 34

# කෙටියෙදුම් සහ සංකේතනාම

| | |
|---|---|
| CBO | Community Based Organisation (ප්‍රජාමූල සංවිධානය) |
| CoA | Certificate of Absence (දක්නට නොමැති සහතිකය) |
| CoD | Certificate of Death (මරණ සහතිකය) |
| DS | Divisional Secretariats (ප්‍රාදේශීය ලේකම් කාර්යාල) |
| FNA | Families' Needs Assessment (තක්සේරුව) (පවුල් අවශ්‍යතා තක්සේරුව) |
| GoSL | Government of Sri Lanka (ශ්‍රී ලංකා රජය) |
| ICRC | International Committee of the Red Cross (ජාත්‍යන්තර රතු කුරුස කමිටුව) |
| IHL | International humanitarian law (ජාත්‍යන්තර මානුෂවාදී නීතිය) |
| INGO | International Non-Governmental Organisation (ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන) |
| LTTE | Liberation Tigers of Tamil Eelam (ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි) |
| MIA | Missing in Action (ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන්වූවන්) |
| NGO | Non-Governmental Organisation (රාජ්‍ය නොවන සංවිධාන) |
| SLA | Sri Lanka Army (ශ්‍රී ලංකා යුද හමුදාව) |
| SLAF | Sri Lanka Air Force (ශ්‍රී ලංකා ගුවන් හමුදාව) |
| SLN | Sri Lanka Navy (ශ්‍රී ලංකා නාවික හමුදාව) |
| SLP | Sri Lanka Police (ශ්‍රී ලංකා පොලීසිය) |

# ප්‍රධාන භාෂිත වචන සහ නිර්වචන

## අතුරුදහන් පුද්ගලයා[1]

අතුරුදහන්වූ පුද්ගලයෙකු යනු එම පුද්ගලයා කොහේ සිටීදැයි ඔහුගේ /ඇයගේ ඥාතීන් නොදන්නා සහ /හෝ විශ්වාස කටයුතු තොරතුරු පදනම් කොට ගෙන, (.....) ජාත්‍යන්තර හෝ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමක්, අභ්‍යන්තර ප්‍රචණ්ඩත්ව තත්වයකට හෝ කැළඹීමකට සම්බන්ධයක් ඇතිව අතුරුදහන් බව වාර්තා කර ඇති පුද්ගලයෙකි.

## අතුරුදහන්වූ පුද්ගලයෙකුගේ පවුල[2]

සාමාන්‍යයෙන් පවුලකට ඇතුළත්වන්නෝ; ළමයින් (විවාහය මඟින් හෝ ඉන් බාහිරව උපදින, දරුකමට හදාගත් හෝ සුළුදරුවන්); සහකරුවන් (නීත්‍යානුකූලව විවාහ වූ හෝ  විවාහ නොවූ); දෙමව්පියන් (සුළුදෙමව්පියන්,  සහ දරු කමට හදාගත් දෙමව්පියන් ඇතුළුව); සහෝදර සහෝදරියන් (අඩසහෝදර සහෝදරියන්, හදාගත් සහෝදර සහෝදරියන් ඇතුළු). එසේවුවත් බොහෝ සමාජ සංස්කෘතික සංදර්භයන්හි පවුල්වල ඉහත සඳහන් කළ කාණ්ඩ අභිබවා එකම නිවසෙහි දිවිගෙවන හෝ  ඔවුනොවුන් අතර සමීප සබඳතා පවත්වා ගෙන යන සාමාජියෝද අයත්වෙති.

## ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන්වූ පුද්ගලයන්

මෙම වාර්තාවෙහි ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන්වූවන් ලෙස සඳහන් යෙදුම, අතුරුදහන් වන අවස්ථාවේදී  ශ්‍රී ලංකා යුද හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලීසියේ සාමාජිකයන්ව සිටි සහ අතුරුදහන් වන අවස්ථාවේදී  රාජකාරියෙහි යෙදී සිටි හෝ  සහ/සක්‍රීය සටන්හි යෙදී සිටි, පුද්ගලයන් හැඳින්වීම පිණිස ශ්‍රී ලංකා බලධාරීන් භාවිත කරන යෙදුම හා සම්බන්ධය.

## පවුල්වල අවශ්‍යතා තක්සේරුව[3]

පවුල්වල අවශ්‍යතා තක්සේරුවක් යනු එම පවුල්වලට සුවිශේෂී වන දුෂ්කරතා, අවශ්‍යතා සහ අපේක්ෂා කවරේද, ප්‍රකාශිත අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස  පවතින සම්පත්, ක්‍රම, සහ සාර්ථකව මුහුණදී පාලනය කරගැනීමට ඇති යාන්ත්‍රණ කවරේද සහ ප්‍රකාශිත අපේක්ෂා සහ ප්‍රයෝජනයට ගැනීමට ඇති සම්පත් අතර පවතින පරතරයන් (සපයනු ලබන සේවා) කවරේදැයි හඳුනා ගැනීම සහ සුදුසු ප්‍රතිචාරයක් නිර්වචනය කිරීම අරමුණු කරගත් ක්‍රියාවලියකි.

## මනෝවිද්‍යාත්මක

'මනෝවිද්‍යාත්මක'යනුවෙන් සඳහන් කරන්නේ පුද්ගලික සිතුවිලි සහ හැඟීම්, සහ පරිසරය තේරුම් ගැනීමේ සහ අවස්ථාවන් විග්‍රහ කිරීමේ මාර්ගයයි. 'මනෝවිද්‍යාත්මක  දුෂ්කරතා 'යන්නෙන් විස්තර කරන්නේ පීඩාව ඇතිකරන තත්වයන්හිදී ගනුදෙනු කිරීමේදී පුද්ගලයන් විසින් අත්දකින ලද දුක්වේදනාවන්ය. මෙම දුෂ්කරතාවලින් හානි සිදුවිය හැකි කරුණු: හැසිරීම, සංවේදනා, දිනපතා කරන වැඩවල විස්තර ගැන සිතීමේ හෝ විග්‍රහකිරීමේ හෝ මතකයට නැගීමේ හැකියාවට, අන්‍යයන් සමග පවත්වන සබඳතාවන්ට සහ පුද්ගලික සෞඛ්‍යයට (ශාරීරික ආබාධවලට සම්බන්ධ නැති වේදනාවන් ආකාරයෙන්)

## මනෝසාමාජීය

මෙම යෙදුමෙන් අවධාරනය කරනු ලබන්නේ පුද්ගලයන් සහ ඔවුන් ගේ පරිසරය අතර ඇති සබඳතාවයි. මෙය අන්‍යොන්‍ය සබඳතාවකි: පුද්ගලයන් ගේ පරිසරයෙහි ඇතිවන වෙනස්කම්වලින් ඔවුන්ගේ සුභසිද්ධියට සහ ඔවුන් සතු සාර්ථකව මුහුණදී පාලනය කරගැනීමේ හැකියාවට බලපෑම් ඇතිවීමට හෝ ප්‍රතිලෝම වශයෙන් සිදුවීමටද හැකිය.

[1] Guiding principles / Model law on the Missing, ICRC 2009, Article 2 "Definitions", *www.icrc.org/eng/resources/documents/misc/model-law-missing-300908.htm.*
[2] Accompanying the Families of Missing Persons: A Practical Handbook, ICRC 2013, Chapter 1: General information, page 17, *https://www.icrc.org/eng/assets/files/publications/icrc-002-4110.pdf.*
[3] Internal guidelines: Assessing the Needs the Families of Missing Persons, ICRC 2011, Key definitions.


Tuan Zaharan/ICRC

# විධායක සාරාංශය

පහත දැක්වෙන වාර්තාවෙන්, 2014 ඔක්තෝබර් මාසයේ සිට 2015 නොවැම්බර් මාසය දක්වා කාලය තුළදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් පවත්වන ලද පවුල්වල අවශ්‍යතා තක්සේරුවෙන් සොයාගත් කරුණු විස්තර කෙරෙයි. එයට අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා ගැන සවිස්තරාත්මක විස්තරයක් අඩංගුවෙයි; ඔවුන්ට ප්‍රයෝජනයට ගැනීමට හැකි දැනට පවතින සම්පත් (හෝ ඒවා නොමැතිකම) සහ වර්තමානයේ ඔවුන් සතුව පවතින සාර්ථකව මුහුණදී පාලනය කරගැනීමේ හැකියාව ඇති යාන්ත්‍රණ. එවැනි අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්විය හැකි ආකාරය සම්බන්ධයෙන් ජාත්‍යන්තර රතු කුරුස කමිටුව දක්වන නිර්දේශද එයට ඇතුළත්ය. මෙම වාර්තාව පළකරනු ලබන්නේ අතුරුදහන් පුද්ගලයන්ට සහ ඔවුන් ගේ පවුල්වලට ආධාර කිරීමට සහ එයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම පිණිසය.

අතුරුදහන් පුද්ගලයන්ගේ ගැටළුව කෙරෙහි ICRC අවධානය යොමුවන්නේ  අතුරුදහන් පුද්ගලයන් සොයා ගැනීමට හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගැනීම සහ ඒ පිළිබඳ තොරතුරු ලබාදීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය විසින් රාජ්‍යයන් කෙරෙහි පනවා ඇති වගකීමක් බැවිනි. තවද ලෝකයේ ගැටුම්වලින් පසුව යළි යථාතත්වයට පත්වෙමින් පවතින රටවල්වලින් ලබා ඇති අත්දැකීමෙන් පෙනී යන්නේ අතුරුදහන් පුද්ගලයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට අදාල ගැටළු නොවිසඳීම හේතුවෙන් ප්‍රතිසංධානයට බරපතල බාධකයක් මතුකළ හැකි බව සහ ගැටුම ගැන සමස්ත සමාජයට ඉදිරියට ඇදෙන සිහිකැඳවීමක් ලෙස එය ක්‍රියාත්මක විය හැකිබවයි. එහෙයින් ශ්‍රී ලංකාවේ කලින් පැවති සන්නද්ධ ගැටුමට සම්බන්ධයක් ඇතිව අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති  ඉරණම සහ ඔවුන් ගේ පවුල්වල අවශ්‍යතා  සම්බන්ධයෙන් අංග සම්පූර්ණව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව ICRC විශ්වාස කරයි.

ICRC අතුරුදහන් වූ පුද්ගලයකු නිර්වචනය කරනු ලබන්නේ එම පුද්ගලයා කොහේ සිටීදැයි ඔහුගේ /ඇයගේ ඥාතීන් නොදන්නා සහ /හෝ විශ්වාස කටයුතු තොරතුරු පදනම් කොට ගෙන, (.....) ජාත්‍යන්තර හෝ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමක්, අභ්‍යන්තර ප්‍රචණ්ඩත්ව තත්වයක් හෝ කැළඹීමක සම්බන්ධයක් ඇතිව අතුරුදහන් බව වාර්තා කර ඇති පුද්ගලයකු වශයෙනි.[4] මෙම පුළුල් නිර්වචනය මඟින්  සන්නද්ධ ගැටුමක් හා සම්බන්ධයක් ඇතිව, ඔවුන් බලහත්කාරයෙන් අතුරුදහන් කළද, ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන්වූවන් වුවද, ඔවුන් ගේ පවුල් සමඟ සබඳතා අහිමිවීමෙන් අතුරුදහන්වූවද, එම සියල්ලන්ම අතුරුදහන්වූවන් වශයෙන් ඇතුලත් කිරීමට ඉඩසැලසෙයි.

වෙනත් ආකාරයේ බොහෝ දුක්වේදනා සමඟ සසඳන විට අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් නිරතුරුවම චිත්තවේගී අරගලයකට මුහුණපාති. ඔවුහු 'අතුරුදහන්වීමේ අවිනිශ්චිත භාවය'[5] යනුවෙන් ප්‍රකට සංසිද්ධියකින් පෙලෙති. එනම් මානසික සහ සමාජීය අංගවලින් වටවූ දුක්වේදනා ස්වරූපයකි. මේ නිසා බලාපොරොත්තුව සහ බලාපොරොත්තු නැතිකර ගැනීම අතර දෙගිඩියාව නැති කර ගැනීම වලක්වන අතර අතුරුදහන්වීමට තුඩුදුන් නියම හේතුව සැමවිටම සොයන තත්වයට පත්කිරීමක් සහ පවුල්වලට ඔවුන් ගේ දිවිපෙවත යළි ඇරඹීමට ඇති හැකියාවට හානියක් සිදුකරයි. ලොවපුරා අතුරුදහන් පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් ක්‍රියාකිරීමෙන් ලබා ඇති අත්දැකීම් සමුදාය අනුව ICRC මේ ආකාරයේ පුද්ගලයන් අහිමිවීමේ පවතින සංකීර්ණ ස්වභාවය අවබෝධ කරගනු ලබයි.

අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා ඔවුන්ගේ දුක්වේදනා මෙන්ම සුවිශේෂයි. එහෙයින් ICRC මෙම පවුල්වල අවශ්‍යතා පිළිබඳ තක්සේරු කිරීම ආරම්භ කළේ මෙම අවශ්‍යතා ගැන ගැඹුරු අවබෝධයක් ලබාගැනීම තුළින් මෙයට සම්බන්ධ බලධාරීන්ට සහ වෙනත් පාර්ශවකරුවන්ට ප්‍රමාණවත් ප්‍රතිචාරයක් සකස්කර ගැනීමට ඉඩ සැලසෙන බවට විශ්වාසයක් ඇතිවය.

ICRC නිත්‍ය ලෙස  ශ්‍රී ලංකාවේ සිය සේවා ඉටුකිරීම 1989 දී ආරම්භ කළ දින සිට ශ්‍රී ලංකාවේ කලින් පැවති සන්නද්ධ ගැටුම ආශ්‍රිතව පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමේ, පවුල්වලින් වෙන්වීමේ සහ පුද්ගලයන් අතුරුදහන්වීමේ සිද්ධි පිළිබඳ පැමිණිලි ලියාපදිංචි කිරීම සහ විසඳීම සිදු කරනලදි. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකින්ම ලැබී ඇති, දැනට විසඳුම් ලැබී නැතිව පවතින මෙවන් සිද්ධි සංඛ්‍යාව 16,000 ඉක්මවයි. ඒ අතර ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන්වූ ආරක්ෂක හමුදාවලට අනුයුක්තව සිටි පුද්ගලයෝ 5100 ට වැඩි පිරිසක්ද වෙති. එහෙයින් අවශ්‍යතා තක්සේරුව සෑම දිස්ත්‍රික්කයකම සිදුකිරීමට ICRC තීරණය කළේය.

හැකිතරම් එම දත්ත වලින් හොඳ නියෝජනයක් ලබාදීම පිණිස සහ නිවැරැදි බව සහතික කිරීම පිණිස මෙම තක්සේරුවේ දත්ත රැස්කිරීමට මිශ්‍ර ක්‍රමවේද යොදා ගන්නා ලදී. ලැබී ඇති තොරතුරු, තක්සේරුව ආරම්භ කිරීමට පෙර,  ලිපි ලේඛන පරීක්ෂාවට  පමනක් සීමාවූ පරීක්ෂණයක් කිරීම (අභ්‍යන්තර සහ බාහිර මූලාශ්‍ර යන දෙකම සැලකිල්ට ගනිමින්); සියලුම දිස්ත්‍රික්කවල අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් සමග අර්ධ-ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා 395 (විවෘත සහ ආවෘත ප්‍රශ්න සම්මිශ්‍රයකින් සමන්විත); දිස්ත්‍රික්ක 11 කදී කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා පැවැත්වීම (තමන්ගේ පවුලේ සාමාජිකයන් ගැන නිදහසේ කතා කිරීමට පුද්ගලයන්ට අවකාශ සැලසීමට සහ පුද්ගලයන් සමග පැවැත්වූ සාකච්ඡාවලින් ඉදිරිපත් වන විශේෂිත විෂයන් ගැන අවධානය යොමු කිරීමට); සහ අවසන් වශයෙන් ප්‍රධාන පාර්ශවකරුවන් හමුවීම (රාජ්‍ය ආයතන සහ සිවිල් සමාජ සාමාජිකයන්) මෙම ක්‍රමවේදයට අයත්විය.

මෙම තක්සේරුවේදී හඳුනාගත් පවුල්වල අවශ්‍යතා පුළුල් වශයෙන් පහත සඳහන් ආකාරයෙන් වර්ගීකරණය කළ හැකිය. තමන්ගේ අතුරුදහන්වූ ඥාතීන්ට අත්වූ ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි  දැනගැනීමට පවුල්වලට ඇති අවශ්‍යතාව (අතුරුදහන්වීමට තුඩුදුන් තත්වය ගැන තොරතුරු ද සමඟ); මානසික, ආර්ථික සහ නෛතික/පරිපාලන අවශ්‍යතා; සහ අවසන් වශයෙන් පිළිගැනීමේ සහ සාධාරණය ඉටුකිරීමේ අවශ්‍යතාව. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලින්, සම්මුඛ සාකච්ඡාවලට සම්බන්ධවූ පවුල් අතුරින් වැඩි සංඛ්‍යාවකට අනුව, වඩාත් වැදගත් අවශ්‍යතාව වන්නේ දැනගැනුම සඳහා ඇති අවශ්‍යතාව වන අතර දෙවන අවශ්‍යතාවය ලෙස  ආර්ථික ආධාර සඳහන් කරන ලදි. තමන්ගේ අතුරුදහන්වූ ඥාතීන්ට අත්වූ ඉරණම ගැන පිළිතුරක් නොමැතිවීම සමඟ පීඩාකාරි ආර්ථික උද්වේග සංයෝග වූ විට ඊලඟ වඩාත් පීඩාකාරි  ගැටළුව වන මානසික සහ මනෝසමාජීය ගැටළු නිර්මාණය කරනු ලබයි. බලධාරීන් විසින් ගනුලබන ක්‍රියාමාර්ග අනුව ඔවුන්ගේ ඥාතියා (ඥාතීන්) සම්බන්ධයෙන් ලැබෙන පිළිතුරුවලින්, මූල්‍ය ආධාර වලින් ඔවුන් ගේ ප්‍රශ්න විසඳෙනු ඇතැයි පවුල්වලින් බහුතරය විශ්වාස කරනු ලබයි.

[4] Guiding principles / Model law on the Missing, ICRC 2009, Article 2 "Definitions", *www.icrc.org/eng/resources/documents/misc/model-law-missing-300908.htm.*
[5] Pauline Boss – Ambiguous loss in families of the missing, P39. The LANCET Supplement, Medicine and Conflict, Vol 360, December 2002.

අතුරුදහන්වූ තම ඥාතීන්ට අත්වූ ඉරණම සම්බන්ධයෙන් ඔවුන් තුළ පවතින විශ්වාසයන් සම්බන්ධයෙන් විමසූ විට, සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ සියලු පවුල් අතුරින්, 36% ක් විශ්වාස කරන්නේ ඔවුන්ගේ ප්‍රියාදරයන් මියයන්නට ඇති බව වන අතර 31% ක් තවමත් ඔවුන් ජීවතුන් අතර සිටින බව ඒත්තුගෙන සිටිති. 33% ක් අවිනිශ්චිතතාව පළකළහ. ඔවුන් ගේ විශ්වාසය කුමක් වූවත් එම සියළුම පවුල්වල බලාපොරොත්තුව සහ බිය අතර නිරතුරුව දෙගිඩියාවක් පවතින බව සටහන් කොට ඇත. ඔවුන්ගේ ඥාතීන් මියයන්නට ඇතැයි විශ්වාසය පළ කළ අය ඔවුන් තවමත් ජීවතුන් අතර සිටිය හැකි බවට බලාපොරොත්තු තබා ඇත. තවමත් ඔවුන් ජීවතුන් අතර සිටින බව විශ්වාස කළ අය තවමත් තම ඥාතීන් මිය ගොස් ඇතැයි සැකයෙන් පසුවෙති. තමන්ගේ අතුරුදහන් ඥාතීන් මියගිය බවට විශ්වාස කිරීමෙන් හෝ ඔවුන්ගේ ඉරණම ගැන සහතිකවීමෙන්, තම අතුරුදහන් ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට බලධාරීන්ගෙන් තවත් විස්තරාත්මක තොරතුරු ලබාගැනීමට අවශ්‍ය බවට අදාල පවුල් අදහස් පළ කිරීම වැලැක්විය නොහැක. සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල් අතුරින් තුනෙන් දෙකකට වැඩිපිරිසක් එවැනි අවශ්‍යතාවක් පළ කොට ඇත. සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල් අතුරින් 79% ක් අඩු වශයෙන් එක්වරක් වත් සඳහන් කළේ මළසිරුර වැළලූ ස්ථාන ගැන තොරතුරු අවශ්‍ය බව සහ/හෝ තම ඥාතීන්ගේ හඳුනාගත් මළසිරුරු ලබාගැනීමට අවශ්‍යබවයි. ගම්‍යමානවන පරිදි, තවමත් තම අතුරුදහන් වූ ඥාතීන් ජීවතුන් අතර සිටින බව විශ්වාස කරන අයට ඔවුන් සිටින්නේ කොහේදැයි දැනගැනීමට අවශ්‍යව තිබේ.

තම අතුරුදහන් ඥාතීන්ට අත්වූ ඉරණම සහ ඔවුන් සිටින ස්ථානය නොදැනසිටීමේ අවිනිශ්චිතතාව නිසා ඇතිවන අහිමිවීමේ සැකසහිත බව මඟින්, සදාකාලිකව දුක්වේදනා ගෙනදෙන තත්වයක් අනිවාර්යයෙන්ම උපදවයි. එහිදී ශෝකවීමේ ස්වාභාවික ක්‍රියාවලිය නිශ්චලනය වෙමින්, ඉච්ඡාභංගය සහ අසරණවීමක් ඇතිකර අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල දිවිපෙවෙත නතරවීමක් සිදුවෙයි. සමාජීය තලයේදී මෙම ශෝකය සමාජීය වශයෙන් කොන්වීමකට, මිතුරන් හෝ ඥාතීන් විසින් තමන් තේරුම් නොගන්නා හැඟීමකට, ප්‍රජාව විසින් බැහැර කිරීමට හෝ අවමානයට ලක්කිරීමට පවා මගපෑදිය හැකි ය. මෙම දුක් වේදනා ආර්ථික, පරිපාලන සහ වෙනත් ආතති සාධක සමඟ මුසුවූ විට සාංකාව සහ අවපීඩනය ඇතුළු බරපතල සෞඛ්‍ය ප්‍රශ්නවලට මඟපාදන බව සනාථවී ඇත. මෙම සැකසහිත නැතිවීමේ විද්‍යාමානවීම් සමාජ සහ සබඳතා පැවැත්වීමේ ගැටළු පෙන්නුම් කරයි; ඒවා ආතතියට හා සැකසහිත බවට හේතුවන බාහිර සාධකවල මුල්බැසගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල් මානසික ව්‍යාධි ලෙස උපකල්පනය කරන දේ සඳහා යම් උපදේශන සේවාවක් ලැබීමට අපේක්ෂා නොකරති; සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල් 395 න් 2% ක් පමණ යෝජනා කළේ උපදේශනය ප්‍රයෝජනවත් විය හැකි බවයි. අනික් අතට 70% ක් ප්‍රකාශ කළේ අවබෝධයක් ඇතිව කතාකරන අය සමග තම අතුරුදහන් වූ ඥාතීන් ගැන කතා කිරීමට කැමැති බවයි. 75% ක් ප්‍රකාශ කළේ තම අතුරුදහන් වූ ඥාතීන් අනුස්මරණය පිණිස කණ්ඩායම් වශයෙන් එක්ව පවත්වන උත්සවවලට සහභාගිවීමට අවශ්‍යබවයි. මානසික රෝගවලින් පෙලෙන පුද්ගලයන්ට ප්‍රතිකාර ලබාදීම පිණිස පවුල්වලට උපකාර කිරීමට ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල සේවා සැපයීම් ඇතත් මේවා බොහෝසෙයින් මනෝචිකිත්සා සත්කාර සහ උපදෙස් දීමේ උපදේශන සේවා වෙනුවෙන් සකසා ඇත. එබැවින් ප්‍රජාවන් විසින් ඒවා උපකල්පනය කරනු ලබන්නේ මානසික රෝගීන් සඳහා ඇති සේවා ලෙසය. සැකසහිත නැතිවීමෙන් පෙලෙන පවුල්වලට ප්‍රමාණවත් ප්‍රතිකාර ආවරණයක් හෝ උචිත සත්කාරයක් ලබාදීමට සුදුසු මට්ටමක ඒවා නොපවතී.

අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් තුල අවිනිශ්චිත නැතිවීම, ආර්ථික දුෂ්කරතා සහ මානසික සෞඛ්‍ය ගැටළු අතර සහසම්බන්ධතාවක් ඇති බව තක්සේරුව පවත්වන කාලයේදී සංඛ්‍යාලේඛනවලින් පෙන්නුම් කෙරිනි. උදාහරණයක් වශයෙන් ආර්ථික දුෂ්කරතා ගැන ප්‍රකාශ කළ 56% ක පවුල් අතුරින් 86% ක් සාංකාව සහ අධිපීඩන ලක්‍ෂණ පෙන්නුම් කළහ.

අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් ප්‍රකාශ කළ ආර්ථික දුෂ්කරතාවලට සාධක ගණනාවක් මුල්වී ඇත; ආදායම් උපයන්නා අහිමිවීම, දේපොළ විනාශවී තිබීම, ගැටුම නිසා ව්‍යාපාරික කටයුතු අඩාලවීම සහ අතුරුදහන් වූ පුද්ගලයා සෙවීම පිණිස දැරීමට සිදුවූ වියදම් ඒවාය. මෙම කරුණු හේතුකොට ගෙන එම පවුල් භයානක ලෙස මුදල් නොමැතිකමෙහි දැඩි අමාරුකම්වලට මුහුණදෙති. එමගින් ඔවුන් අඛණ්ඩ ණයකරුවන්වීම, ළමයින්ගේ අධ්‍යාපනයට බාධා ඇතිවීම, ගෙදර කටයුතු ඉටුකර ගැනීමේ දුෂ්කරතාවලට මැදිවීම සිදුවෙන බව තක්සේරුවෙන් අනාවරණය විය. සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ සියළුම පවුල් අතර විරැකියා අනුපාතය ඉහල මට්ටමක පවතී.(56%) සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වල 93% ක අතුරුදහන් ඥාතියා පිරිමියෙකි. එයින් පෙන්නුම්කරන්නේ එවැනි බොහෝ පවුල්වල කාන්තාවන්ට සිදුවී ඇත්තේ ආදායම් ඉපයීමේ කටයුත්තක යෙදීමට හෝ එසේ නැත්නම් වෙනත් පිරිමි ඥාතීන් ගේ ආධාර කෙරෙහි විශ්වාසය තබා ක්‍රියා කිරීමටයි. ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් රජයේ අනුග්‍රහය ලබන වන්දිගෙවීම් මාලාවකට සුදුසුකම් ලැබීම නිසා එම පවුල්වලට මෙම සංසිද්ධියේ බලපෑම බොහෝ සෙයින් අඩුබව පෙනෙන්නට ඇත.

සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වල්වලින් බහුතරය වාර්තා කළේ අතුරුදහන් වූ පුද්ගලයාගේ නමින් ලියාපදිංචි කළ පවුලේ වත්කම් කළමනාකරණයේදී බරපතල පරිපාලන ප්‍රශ්නවලට තමන් මුහුණපාන බවයි. ශ්‍රී ලංකාවේ බලපවත්වන නීතියෙන් පුද්ගලයෙකු ගේ තත්වය 'අතුරුදහන්' ලෙස පිළිනොගන්නා හෙයින් මූලික පරිපාලන කටයුතු ඉටුකර ගැනීම පිණිස පවුල්වලට මරණ සහතිකයක් ලබාගැනීමට බලකෙරෙයි. (උදාහරණ: අතුරුදහන් වූ පුද්ගලයාගේ බැංකු ගිණුමට ප්‍රවේශය/අවසන් කිරීම, සේවායෝජකයා විසින් තැන්පත් කරන ලද අතුරුදහන් වූ පුද්ගලයාගේ මාසික වැටුප ලබාගැනීම, හෝ අතුරුදහන් වූ පුද්ගලයාට හිමිව තිබූ ඉඩම්වල හිමිකම ලබාගැනීම) මෙවැනි තත්වයක් පැවතියත් මරණය සිදුවී ඇති බව සහතික කරන තුරු මරණ සහතිකයක් පිලිගැනීම තමන් ප්‍රතික්ෂේප කර ඇති බව සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වල්වලින් 66% ක් ප්‍රකාශ කොට ඇත. සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වලින් තුනෙන් එකක් පමණ මරණ සහතිකයක් භාරගෙන ඇති අතර එයින් අඩක් පමණ පවසා ඇත්තේ 'දක්නට නොමැති සහතික' නිකුත් කිරීමක් තිබුණේ නම් තමන් එය ලබාගැනීමට මනාපය දක්වන බවයි. ප්‍රතිලාභ යෝජනා ක්‍රමවලින් ප්‍රයෝජන ලබා ගැනීමේදී කවුරු කුමන යෝජනා ක්‍රමවලට සුදුසුකම් ලබන්නේ දැයි දැනගැනීමට නිරවුල්ව තොරතුරු නොමැතිකම, අයදුම්පත් ඉදිරිපත් කළ විට ප්‍රතිචාරයක් නොදැක්වීම, අවශ්‍යව ඇති ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකියාව වැනි පරිපාලන ගැටළු තමන්ට ඇතැයි එම පවුල් වාර්තා කළහ. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් සහ වෙනත් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සඳහා පවතින යෝජනා ක්‍රම අතර ද නොගැලපීමක් දක්නට ඇති බව මෙම තක්සේරුවෙන් පෙන්නුම් කෙරිණ.

සන්නද්ධ ගැටුමේ වින්දිතයන්වූ වෙනත් පවුල්වලට ඇති බොහෝ අවශ්‍යතා වලට සමාන අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලටද ඇති නමුත් ඔවුන් ගේ විශේෂ ප්‍රමුඛතාව වන්නේ තොරතුරු දැනගැනීමේ අවශ්‍යතාවයි.[6] එම අතුරුදහන්වීමට වගවියයුත්තේ කවුරුන්දැයි දැනගැනීම ඇතුළුව තම අතුරුදහන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට ඔවුන්ට අවශ්‍යතාවක් ඇත. තක්සේරුව පවත්වන කාලය තුළදී ICRC යුක්තිය සහ වගවීම ගැන විශේෂ ප්‍රශ්න නොඇසුවේය. එසේවුවත් සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල් සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවෙමින් සිටියදී ස්වකැමැත්තෙන් මෙම ගැටළු මතු කළහ. යුක්තිය ඉටුවීම අවශ්‍යබව ඔවුන් ගෙන් 34% ක් ප්‍රකාශ කළහ. මෙයින් බහුතරය එනම් (17%) හානිපූරණ යුක්තිය ඉටුකිරීම ඉල්ලා සිටි අතර 11% ක් ඉල්ලා සිටියේ විපාකදායි යුක්තියයි. 6% ක් එම දෙකම ඉල්ලා සිටිති. හානිපූරණ යුක්තිය වෙනුවෙන් බහුතර ඉල්ලීම වූයේ මූලාධාරවූවත් එය සිදුවිය යුත්තේ ඔවුන්ගේ දුක්වේදනා සහ දුෂ්කරතා බලධාරීන්ගේ පැත්තෙන් පිළිගැනුමක් සමගින් පමණක් බවත් එය ස්වකීය ප්‍රියාදරයාගේ ජීවිතය සඳහා සරල මුදල් වන්දියක් ලෙස පිරිනැමීමක් නොවිය යුතු බවත්ය. පවුල්වලින් 23% ක් ඉල්ලා සිටියේ බලධාරීන් විසින් පිළිගැනීමක ආකාරයෙන් ඔවුන්ගේ පාඩුව සම්බන්ධයෙන් සංකේතාත්මකව (සිහිවටනයක්, මාර්ගයක් නම් කිරීම වැනි ආකාරයෙන්), චාරිත්‍රානුකූලව හෝ වෙනත් ආකාරයෙන් (උදාහරණ, අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් දිනයක් ප්‍රකාශයට පත්කිරීම, ප්‍රසිද්ධියේ පිළිගැනුම, ගෞරව/වරප්‍රසාද පිරිනැමීම)

මෙම පවුල්වල ඉහලම ප්‍රමුඛතාව වන්නේ මෙම අතුරුදහන්වීමට සම්බන්ධ පරිවේෂණීය සාක්ෂි සමගින් තම අතුරුදහන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමේ අවශ්‍යතාව බව අවසානයේ මෙම තක්සේරුවෙන් හෙළිවිය. තම අතුරුදහන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට ඔවුන්ට තොරතුරු නොමැතිවීමෙන් මෙම පවුල් සංවේදනාත්මකව විඩාවට පත්කෙරෙති. ඔවුන්ට ආර්ථික වශයෙන් තිරසාර දිවිපෙවතක් ගතකිරීමට ඇති හැකියාව  ඇතුළු ඔවුන්ගේ එදිනෙදා කටයුතුවල හැමදෙයකටම එය අහිතකර ලෙස බලපායි.

එහෙයින්  ඔවුන් තම අතුරුදහන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමේ අපේක්ෂාවෙන් පසුවෙමින් සිටියදී ඔවුන්ගේ ආර්ථික සහ සංවේදනාත්මක අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීම පිණිස  එම පවුල්වලට ප්‍රමාණවත් සේවා සහ ප්‍රතිලාභ සපයාදීම වැදගත්ය. මෙම පවුල් අතුරින් රාජ්‍ය සේවයෙන් ප්‍රතිලාභ අත්වන පවුල්වලට තම ඥාතීන් ගේ සැකසහිත අහිමිවීම නිසා උද්ගතව ඇති තත්වයට සාර්ථකව මුහුණදී පාලනය කරගැනීමට හැකියාව පෙනෙන්නට තිබෙන බව නිරීක්ෂණය කරන ලදී. තම ඥාතියාගේ සැකසහිත අහිමිවීම නිසා උද්ගතව ඇති තත්වය යටතේ  දිවිගෙවමින්, තම අතුරුදහන් ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමේ පිළිතුරු අපේක්ෂාවෙන් පසුවෙන පවුල්වලට ආධාර කරන අතරම නීති සහ පරිපාලන සාධක ආමන්ත්‍රණය කළ යුතුව ඇත. තම අතුරුදහන් ඥාතීන්ට අත්වූ ඉරණම සම්බන්ධයෙන් සාක්ෂියක් නොමැතිව, පවුල්වලට 'තීරණය කිරීමට' බලකිරීමකින් තොරව ඔවුන් ගේ  මියගිය ඥාතියාගේ තත්වය  නීතිමය වශයෙන් පිළිගැනෙන 'දක්නට නොමැති සහතිකය' පිළිගැනීම, මෙම පවුල් මුහුණපා සිටින පරිපාලන/නෛතික ප්‍රශ්න ලිහිල් කිරීමට තැබූ වැදගත් පියවරකි. මෙම පවුල්වල ඥාතියාගේ 'සැකසහිත අහිමිවීම'  සහ දුක්වේදනා නිලවශයෙන්  බලධාරීන් විසින් පිළිගනු ලැබීම මෙන්ම ඔවුන්ගේ ඥාතියා  අතුරුදහන්වීම ගැන වගවීමට සුදුසු පියවර ගැනීමට වගබලා ගැනීම, අවසානයේ මීට සම්බන්ධ අතුරුදහන් වූ පුද්ගලයන් ගේ සහ ඔවුන්ගේ පවුල්වලත් ඇත්ත වශයෙන්  සමස්තයක් වශයෙන් මුළු සමාජයේත් කල්පවතින සාමය සාක්ෂාත් කරගැනීම පිණිස තැබූ වැදගත් පියවරක් වන බව සනාථවනු ඇත.

මෙම පවුල්වල බහුවිධ අවශ්‍යතා ප්‍රශස්ත ලෙස ආමන්ත්‍රණය කළ හැකි ආකාරය ගැන ICRC සවිස්තරාත්මක නිර්දේශ ලැයිස්තුවක්  මෙම  වාර්තාවේ 6 වැනි ඡේදයේ අඩංගු වෙයි.

[6] ICRC වාර්තාවඃ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ  පවුල් - රාජ්‍ය හා රාජ්‍ය නොවන විශේෂඥයන්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට පෙර පැවති වැදගත් සිදුවීම්වලදී නැගුණු කරුණු අනුව සකස්කරන ලද නිගමනවල සාරාංශය (2003 පෙරවාරි 19 - 23, පිටුව 83 *https://www.icrc.org/eng/assets/files/other/icrc_themissing_012003_en_10.pdf.*


Tuan Zaharan/ICRC

# 1. හැඳින්වීම

සන්නද්ධ ගැටුම් හෝ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්වල සෘජු ප්‍රතිඵලයක් වශයෙන් සහ හෝ ඒවාට සම්බන්ධයක් ඇතිව පුද්ගලයන් අතුරුදහන්වීම ලොවපුරා අවාසනාවන්තව බහුලව සිදුවන සත්සිද්ධියකි. අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වල නොනැසී පවතින අඛණ්ඩ සංවේදනාත්මක අරගලය අනුපමේය දුක්වේදනා ගෙනදෙයි.

අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් ලෝකයේ රටවල් ගණනාවක වැඩකිරීමෙන් ICRC ලබා ඇති අත්දැකීම්වලින් පෙන්නුම් කරන්නේ තම අතුරුදහන් ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි යන්න ගැන ඔවුන්ට විශ්වාස කළ හැකි පිළිතුරු නොමැතිවීමෙන් මෙම පවුල්, අඛණ්ඩව එම අතුරුදහන්වීමේ සිද්ධියේ අභිප්‍රාය සහ එය සිදුවූ නියම තත්වය සොයන බවයි.

මෙම පවුල් එදිනෙදා දිවිපෙවෙත ගෙනයාමට සහ ඒ සමගම ස්වකීය ඥාතියා සෙවීම යන අභියෝග දෙකට මුහුණදී සිටිති. තවද තම අතුරුදහන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම ගැන පවතින අවිනිශ්චිතතාව මගින් ඔවුන්ට උරුමකරදෙන්නේ අපේක්ෂාව සහ නෂ්ටාවපේක්ෂාව අතර සදාකාලික පැල්මකි.

සමස්තයක් වශයෙන් සමාජයට, ගැටුමේ ප්‍රතිඵලයක් වශයෙන් අතුරුදහන්වූ පුද්ගලයන්ට අදාල නොවිසඳුනු ප්‍රශ්න යුද්ධය මතක්කිරීමක් ලෙස ක්‍රියා කරයි.[7] ශ්‍රී ලංකාවේ උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ 2011 වාර්තාවෙහි නිර්දේශ කර ඇත්තේ "අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීම පිණිස විස්තීර්ණ ප්‍රවේශයක් හදිසි අවශ්‍යතාවක් ලෙස සලකා සකස්කරගත යුතු අතර එසේ නොවුවහොත් එය යම්කිසි සියල්ලන්ම ඇතුළත් සහ දිගුකාලීන ප්‍රතිසංධාන ක්‍රියාවලියකට බරපතල බාධකයක් වෙයි."[8]

සන්නද්ධ ගැටුම් නිසා අතුරුදහන්වී ඇතැයි වාර්තාකොට ඇති පුද්ගලයන් සෙවීම පිණිස හැකි සෑම පියවරක්ම ගැනීම සහ ඒ පිළිබඳ පවතින සියලු තොරතුරු ඔවුන්ගේ ඥාතීන් වෙත ලබාදීම ජාත්‍යන්තර මානුෂවාදී නීතිය[9] විසින් රාජ්‍යයන් වෙත පනවා ඇති නෛතික වගකීමකි.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්, සන්නද්ධ ගැටුමක වින්දිතයන්ගේ උප කණ්ඩාමකින් සමන්විතවන අතර සිරිතක් වශයෙන් ඔවුන්ගේ ඇතැම් අවශ්‍යතා ඇතැම් හෝ සියළුම වින්දිතයන් සමග බෙදා ගැනේ. තවද අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වලට අතුරුදහන්වූ ඥාතියාට (ඥාතීන්ට) අත්වූ ඉරණම ගැන පිළිතුරක් දැනගැනීමට බලාපොරොත්තුවෙන් සිටීමේ සුවිශේෂී අවශ්‍යතාවක් ඇත.[10] ඒ පසුබිම තුළ ද සුවිශේෂී අවශ්‍යතා වර්ධනය වෙයි. එහෙයින් අතුරුදහන් පුද්ගලයන් හෝ ඔවුන් ගේ පවුල්වල යහපත පිණිස යම් ක්‍රියාමාර්ගයක යෙදීමට පෙර අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා ගැන තක්සේරු කිරීම අත්‍යාවශ්‍යවේ.

එහෙයින් ශ්‍රී ලංකාවේ කලින් පැවති සන්නද්ධ ගැටුමට සම්බන්ධයක් ඇතිව අතුරුදහන්වූ පුද්ගලයන් ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණ කිරීමේදී දායකවීම පිණිස, 2014 ජනවාරි මාසයේදී ICRC අතුරුදහන් පුද්ගලයන් ගේ පවුල්වල නිබඳව පවතින බහුවිධ අවශ්‍යතා අවබෝධ කරගැනීමට, මෙම අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේදී යොදාගැනීමට ඇති සම්පත් විග්‍රහ කිරීමට සහ හඳුනාගත් අවශ්‍යතා සහ ප්‍රයෝජනයට ගැනීමට තිබෙන සම්පත් අතර පවතින පරතරය පියවිය හැක්කේ කෙසේද යන කරුණු ගැන අවබෝධයක් ලබාගැනීම පිණිස සවිස්තරාත්මක තක්සේරුවක් කිරීමට ඇති තමන්ගේ කැමැත්ත ශ්‍රී ලංකා රජයට දැනුම්දුන්නේය.

2014 ඔක්තෝබර් මාසයේදී මෙම තක්සේරුව කිරීමට ශ්‍රී ලංකා රජයේ බලධාරීන්ගෙන් ICRC යට ලිඛිතව අවසර ලැබිණ. එම මාසයේදීම ICRC අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් සමග සහ කේන්ද්‍රීය කණ්ඩායම් සමග දීර්ඝ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම සහ කලින් ICRC සිදුකොට තිබූ අධ්‍යයනවල වාර්තා ඇතුළු ලැබී තිබූ ලිපිලේඛන සහ රටේ ගැටුමේ ස්වභාවය සහ එහි විපාක සම්බන්ධයෙන් වූ වාර්තා කාර්යාලයේදී පරීක්ෂා කරබලමින් දත්ත රැස්කිරීම ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ සංදර්භය තුළ මෙම පවුල්වල අවශ්‍යතා ගැන සම්පූර්ණ සහ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම අරමුණු කොට ගෙන, ICRC සාකල්‍ය ලෙස දත්ත රැස්කිරීමට හැකිවන අයුරින් ස්වකීය ප්‍රවේශය තවදුරටත් ගැලපෙන පරිදි සකස් කර ගෙන මෙම විෂයයට අදාල කාරකයන්/පාර්ශවකරුවන් හමුවිය. දත්ත රැස්කිරීම 2015 සැප්තැම්බර් මාසයේදී අවසන් කොට 2015 සැප්තැම්බර් මාසයේ සිට නොවැම්බර් දක්වා තොරතුරු සකස්කිරීම සහ විශ්ලේෂණය සිදු කරන ලදී.

රැස්කරණ ලද තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් ICRC ශ්‍රී ලංකාවේ අතුරුදහන් පුද්ගලයන් ගේ පවුල්වල වත්මන් අවශ්‍යතා සහ ප්‍රයෝජනයට ගැනීමට ඇති සම්පත් (හෝ ඒවා නොමැතිකම) සහ මේ දක්වා ප්‍රයෝජනයට ගෙන ඇති සාර්ථකව මුහුණදී පාලනය කරගැනීමේ යාන්ත්‍රණ ගැන සැලකිය යුතු දැනුමක් එකතු කර ගෙන ඇත.

අතුරුදහන්වූ පුද්ගලයන් ගේ පවුල්වල අවශ්‍යතා නිරූපනය කිරීමේ සහ පුළුල් පදනමකින් ඒවා ආමන්ත්‍රණය කිරීමේ මාර්ග නිර්දේශ කිරීම මෙම වාර්තාවේ අරමුණයි. මෙම පවුල්වල බහුවිධ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේදී සාකල්‍ය ප්‍රතිචාරයක් සහ අදාල සියළුම කාරකයන් අතර සමායෝජිත ප්‍රවේශයක් අවශ්‍යවෙයි.

[7] ICRC වාර්තාව : අතුරුදහන්වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් - රාජ්‍ය හා රාජ්‍ය නොවන විශේෂඥයන්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට පෙර පැවති වැදගත් සිදුවීම්වලදී නැගුණු කරුණු අනුව සකස්කරන ලද නිගමනවල සාරාංශය (2003 පෙරවාරි 19 - 21), ඡේදය 104 , පිටුව 90/155, *https://www.icrc.org/eng/assets/files/other/icrc_themissing_012003_en_10.pdf.*

[8] පරිච්ඡේදය 5: මානව හිමිකම්, ඡේදය 5 ,3,7, පිටුව 163, *http://slembassyusa.org/downloads/LLRC-REPORT.pdf.*

[9] චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂවාදී නීතිය , රීතිය 117, *https://www.icrc.org/customary-ihl/eng/docs/v1_rul.*

[10] ICRC වාර්තාව : අතුරුදහන්වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් - රාජ්‍ය හා රාජ්‍ය නොවන විශේෂඥයන්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට පෙර පැවති වැදගත් සිදුවීම්වලදී නැගුණු කරුණු අනුව සකස්කරන ලද නිගමනවල සාරාංශය (2003 පෙබරවාරි 19 - 21), ඡේදය 104 , පිටුව 90/155, *https://www.icrc.org/eng/assets/files/other/icrc_themissing_012003_en_10.pdf.*



Tuan Zaharan/ICRC

# 2. පසුබිම් තොරතුරු

ශ්‍රී ලංකා රජයේ යුද්ධ හමුදාව සහ ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි (එල්ටීටීඊ) අතර පැවති සන්නද්ධ ගැටුම රටපුරා පවුල් දහස් ගණනක් ඔවුන් ගේ අතුරුදහන්වූ ඥාතීන් සොයන පිරිසක් බවට පත්කොට ඇත.

ICRC 1989 දී ශ්‍රී ලංකාවේ රැඳීසිටීම ආරම්භ කළ දින සිට, සන්නද්ධ ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස සම්බන්ධතා ගිලිහීයාමෙන් පසු **අතුරුදහන් වූවන් ලෙස** ඥාතීන් වාර්තා කළ පුද්ගලයන් ලියාපදිංචි කරමින් සිටී.


අදාල පවුල් සහ එම පවුල්වල සාමාජිකයන් විසින් සොයනු ලබන පුද්ගලයන් අතර යළි සබඳතා පිහිටුවීමේ අරමුණින් ICRC, රජය සහ එල්ටීටීඊ පාලනය පැවති ප්‍රදේශවල රෝහල් සහ පුද්ගලයන් රඳවා ගෙන සිටින ස්ථානවල සෙවීමේ යෙදුණු අතර එම සංවිධානය විසින් සොයන පුද්ගලයන්ගේ නම් ලැයිස්තු ගැටුමට සම්බන්ධ පාර්ශව වෙත ලබා දෙන ලදී. තුවාලකරුවන් ඉවත්කරගැනීම පිණිස ගැටුමට සම්බන්ධ පාර්ශව සමග දිගටම සංවාදයක යෙදුණු ජාත්‍යන්තර රතුකුරුස කමිටුව මිනිස් මළ සිරුරු මාරුකරගැනීමේදී මධ්‍යස්ථ මැදිහත්කරුවෙකු ලෙස ක්‍රියා කළේය. මෙම ප්‍රයත්න නිසා ICRC ට බොහෝ පවුල්වල වෙන්වී සිටි සාමාජිකයන් සමග සබඳතා යලි ඇති කිරීමට හැකිවිය.

1989 සිට අදවන විට, සන්නද්ධ ගැටුම පැවති කාලයේදී ඔවුන් ගේ ඥාතීන් විසින් අතුරුදහන් වූවයි සලකන ලද සහ ICRC ට ඒ බව වාර්තා කරන ලද 34,000 කට වැඩි පිරිසෙන් 16000[11] කට වැඩි සංඛ්‍යාවක් තවමත් අතුරුදහන්වූ පුද්ගලයන් ලෙස ඔවුන් ගේ ඥාතීහු සලකති.[12] ICRC අතුරුදහන්වූ පුද්ගලයකු ලෙස නිර්වචනය කරන්නේ ඔහුගේ /ඇයගේ ඥාතීන් ඔහු/ඇය කොහේ සිටීදැයි නොදන්නා, සහ හෝ අතුරුදහන් බව විශ්වාස කටයුතු තොරතුරු මගින් වාර්තා කර ඇති (.....) ජාත්‍යන්තර හෝ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමක, අභ්‍යන්තර ප්‍රචණ්ඩත්ව තත්වයක හෝ කැළඹීමක සම්බන්ධයක් ඇතිව අතුරුදහන්වී පුද්ගලයෙකි.[13] මෙම පුළුල් නිර්වචනය නිසා සන්නද්ධ ගැටුමක් සම්බන්ධයෙන් බලහත්කාරයෙන් අතුරුදහන් කළද, ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන්වුවද, නැත්නම් ඔවුන් ගේ පවුල් සමග පැවති සබඳතා අහිමිවීමෙන් අතුරුදහන් වුවද ඒ සියල්ලන්ම මෙම කාණ්ඩයට ඇතුළු කිරීමට ඉඩසැලසෙයි.

## 2.1 අතුරුදහන් පුද්ගලයන්ගේ ජනවිකාශ වගතුග

ICRC සමග ලියාපදිංචි මුළු පුද්ගලයන් සංඛ්‍යාවෙන් තවමත් අතුරුදහන් අයගෙන්[14], 12% ක් ඔවුන් අතුරුදහන් වන අවස්ථාවේදී බාල වයස්කරුවන් වූ අතර (වයස 0 සිට 17 දක්වා), බහුතරය තරුණ වැඩිහිටියන්ය; අතුරුදහන්වූ පුද්ගලයන් ගෙන් අඩකට වැඩි පිරිසක් ඔවුන් අතුරුදහන්වන අවස්ථාවේදී අවුරුදු 18 ත් 29 ත් අතර වියෙහි පසු වූහ.

ප්‍රස්තාරය 1: අතුරුදහන් වූ අවස්ථාවේදී අතුරුදහන් පුද්ගලයන් ගේ වයස




[11] මෙය ලියන අවස්ථාව වන විට පවුල් 15,688 ක් විසින් සොයනු ලබන, ICRC සමග ලියාපදිංචි කොට ඇති ලැයිස්තු අනුව, අතුරුදහන්වූ පුද්ගලයන් සංඛ්‍යාව හරියටම 16075 කි. (2015 නොවැම්බර් 18)


[12] ICRC සමග ලියාපදිංචි කොට ඇති අතුරුදහන්වූ පුද්ගලයන්ගේ ලැයිස්තුව නිරවශේෂ සහ ස්ථිතික නොවේ. අතුරුදහන්වූ පුද්ගලයන් ගේ පවුල් සහ බලධාරීන් විසින් සපයනු ලබන තොරතුරු පදනම් කරගනිමින් ICRC නිරතුරුව එම ලැයිස්තු යාවත්කාලීන කරයි.

[13] Guiding principles / Model law on the Missing, ICRC 2009, Article 2 “Definitions”, *www.icrc.org/eng/resources/documents/misc/model-law-missing-300908.htm.*

[14] අතුරුදහන්වූ පුද්ගලයන්ගේ බහුතරය (91%) පිරිමි වන අතර ( මුළු අතුරුදහන් වැඩිහිටි පුද්ගලයන් ගෙන් 93% ක් සහ අතුරුදහන් බාල වියේ පසුවන්නන් ගෙන් 76% ක්) මුළු අතුරුදහන් වැඩිහිටි පුද්ගලයන් ගෙන් 7% ක් ගැහැනුය. අතුරුදහන් බාල වයස්කරුවන්ගෙන් හතරෙන් එකක් පමණ (24%) ගැහැනු ළමයි වෙති.


අතුරුදහන් වූවන්ගෙන් බහුතරය පිරිමින්ය. එම සංඛ්‍යාව සම්පූර්ණ අතුරුදහන් වූවන්ගෙන් 93% ක් වන අතර අතුරුදහන් යෞවනයන්ගෙන් 76% කට සමානය. අතුරුදහන් වූවන්ගෙන් 7% ක් කාන්තාවන් වන අතර අතුරුදහන්වූ යෞවනයන්ගෙන් 24% ක් ගැහැණු ළමුන්ය.

**ප්‍රස්තාරය 2: අතුරුදහන් පුද්ගලයන්ගේ වයස සහ ස්ත්‍රී/පුරුෂ අනුපාතය**





ICRC සමග ලියාපදිංචි කොට ඇති අතුරුදහන් පුද්ගලයන්ගේ සහ අදටත් සක්‍රිය මුළු සංඛ්‍යාවේ සංඛ්‍යා ගවේෂණය කරන විට පෙන්නුම් කරන්නේ ගැටුමේ මුල් හෝ අවසන් අදියරේදී අතුරුදහන් වී ඇති පුද්ගලයන්ගෙන් 60% ක් පමණ ඔවුන් ගේ ඥාතීන් විසින් තවමත් සොයනු ලබන බවයි. (පිලිවෙලින් 35% සහ 24%)

**ප්‍රස්තාරය 3: අතුරුදහන් වූ පුද්ගලයා අතුරුදහන් වූ වසර**



රූපය 1: අතුරුදහන්වූ පුද්ගලයන් උපන් දිස්ත්‍රික්කය අනුව




අතුරුදහන්වූ පුද්ගලයන් අතර සෑම දිස්ත්‍රික්කයකම උපන් අය සිටින බව ICRC සතුව පවතින දත්ත පෙන්නුම් කරයි. මේ තත්තවය ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී සහ වෙනත් ආකාරයෙන් අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ද පොදු සත්‍යයකි.

තක්සේරුව සඳහා නියැදි පිහිටුවීමේදී ICRC සමඟ ලියාපදිංචි කොට ඇති අතුරුදහන් පුද්ගලයන්ගේ මෙම ජනවිකාශ වගතුගවල විශේෂ ලක්‍ෂණය සැලකිල්ලට ගනු ලැබීය.

සමස්ත රටම අතුරුදහන්වීම්වලින් පීඩාවට පත්ව ඇති හෙයින් මෙම තක්සේරුව දීපව්‍යාප්තව පැවැත්වීමටත් සියළුම දිස්ත්‍රික්කවල පවුල් මුණගැසීමටත් ICRC තීරණය කළේය.


Tuan Zaharan/ICRC

# 3. මෙම තක්සේරුවේ අරමුණු

සක්‍රිය යුද සටන් සහ හමුදා ක්‍රියාන්විත අවසන්වී දිගුකලක් ගතවී ඇතත් ඇතැම් කාණ්ඩවල පුද්ගලයෝ ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ ආරක්ෂාව දිගටම බුක්තිවිඳිමින් සිටිති: එනම් රැඳවුම් භාරයේ සිටි හෝ සිටින අය, තුවාල ලැබූ සහ රෝගාතුර අය, අතුරුදහන් වූවන්, මියගිය හෝ අවතැන්වූවන්, සන්නද්ධ ගැටුමෙන් පීඩාවට පත් කාන්තාවන් සහ ළමයින්.[15] ඒ ආකාරයෙන් අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්ද සන්නද්ධ ගැටුමේ වින්දිතයන් වන අතර ඔවුන්ට රැකවරණයේ සහ ආධාරවල ප්‍රතිලාභ අත්විය යුතුය.

අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් සන්නද්ධ ගැටුම්වල සමස්ත වින්දිතයන්ගේ උප කණ්ඩායමක් වන අතර බොහෝ අවස්ථාවලදී ඔවුන් ගේ අවශ්‍යතා එම වින්දිතයන්ගෙන් ඇතමුන්ගේ හෝ සියල්ලන්ගේම අවශ්‍යතා වලට අනුරූපය. එසේවුවත් අතුරුදහන්වූ ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට පිළිතුරු නොමැතිවීමෙන් ඇතිවූ අවිනිශ්චිතතාවය මඟින් මෙම පවුල් වෙනත් වින්දිතයන් සමග සැසඳීමේදී විශේෂ පීඩාවකට පත්ව ඇත.

මෙම පවුල්වල අවශ්‍යතා තක්සේරුව කිරීමේ අරමුණවූයේ ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් අද මුහුණපාන සුවිශේෂී දුෂ්කරතා, අවශ්‍යතා සහ එම පවුල්වල අපේක්ෂාවන් ඉගෙන ගැනීම, පවතින සම්පත්, දේශීයව ස්ථාපිත රාමු, උපක්‍රම හා සාර්ථකව මුහුණදී ක්‍රියාකිරීමේ යාන්ත්‍රණවලින් මෙම අවශ්‍යතා ප්‍රමාණවත් අයුරින් ආමන්ත්‍රණයවන්නේ දැයි ඉගෙනගැනීම සහ මෙම හඳුනාගත් අවශ්‍යතා හොඳින් ආමන්ත්‍රණය කළ හැකි ආකාරය සම්බන්ධයෙන් සොයාගන්නා කරුණු පදනම් කරගෙන නිර්දේශ ඉදිරිපත් කිරීමයි. මෙම පවුල්වලට අවශ්‍යව ඇත්තේ මොනවාදැයි පූර්ව උපකල්පනයන්ගෙන් තොරව අතුරුදහන්වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වල යහපත සඳහා තම ක්‍රියාමාර්ගය සකස්කරගැනීමට ශ්‍රී ලංකා රජයට සහ වෙනත් අදාල කාරකයන්ට වටිනා පදනමක් සැපයීම පිණිස මෙය ස්වාධීන දෘෂ්ටිකෝණයකින් සිදුකෙරේ.

වඩාත් නිවැරදිව පවසන්නේ නම් මෙම තක්සේරුව අරමුණු කොට ඇත්තේ:

1) අතුරුදහන්වූ ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට පිළිතුරු නොමැතිවීමෙන් හටගත් ප්‍රත්‍යක්ෂ දුෂ්කරතා සහ සුවිශේෂී අවශ්‍යතා හඳුනාගැනීම.

   අතුරුදහන්වූ ඥාතීන්ට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට පිළිතුරු නොමැතිවීමෙන් ඇතිවූ අවිනිශ්චිතතාවයෙන් අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් විශේෂයෙන් ශෝකයෙන් පසුවන බව සැලකිල්ලට ගනිමින්, මෙම තක්සේරුව මඟින් ශ්‍රී ලංකාවේ අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල විශේෂතා ඇද්දැයි හඳුනාගැනීම. මෙම විශේෂ දුෂ්කරතාවලට හේතුකාරක වූ කරුණු සහ ඒවායේ ආදීනව හඳුනාගැනීම සහ මෙම පවුල්වල සමාජ, සංස්කෘතික සහ දේශපාලන දෘෂ්ටිකෝණයෙන් ඒවා විශ්ලේෂණය කිරීම එහි අරමුණයි.

2) පවතින සම්පත් හඳුනාගැනීම.[16]
   අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල හඳුනාගත් අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස පවතින සේවාවල තත්වය සහ කාර්යක්ෂමතාව ඇතුළු දැනට පවතින සම්පත්වල මෙහෙයුම් ධාරිතාව මෙම තක්සේරුව මඟින් ඇගයීමට ලක්කෙරේ.

3) මෙම තක්සේරුව මඟින්, හඳුනාගත් අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම පිණිස සහ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස ශ්‍රී ලංකා රජයට සහ වෙනත් අදාල කාරකයන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම.

[15] චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ රීති 109 - 111, 112 - 116, 117, 118 - 128, 129 - 133 සහ 134 - 135, *https://www.icrc.org/customary-ihl/eng/docs/v1_rul.*

[16] දේශිය ප්‍රාමාණික රාමුද ඇතුළත්ව.



Tuan Zaharan/ICRC

# 4. තක්සේරුව පැවැත්වීමේ ක්‍රමවේදය

## 4.1. දත්ත රැස්කිරීම

එකතු කළ දත්තවල විෂයපථය සහ පරිමාව වැඩිකිරීමේ පහසුව පිණිස මෙම තක්සේරුවේදී තොරතුරු රැස්කිරීමේ මිශ්‍ර ක්‍රමයක් භාවිත කරන ලදී.

### කාර්යාලයේ පර්යේෂණ

අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා රික්තයක දී විශ්ලේෂණය කළ නොහැකි නිසා එනම් රටේ දේශපාලන සමාජ-ආර්ථික සහ සමාජ-සංස්කෘතික ගතිකයන් මඟහරිමින් එය කළ නොහැකි නිසා ශ්‍රී ලංකාවේ සිදුවූ ගැටුමේ ස්වභාවය සහ ආදිනව ගැන ලිපිලේඛන හා වාර්තා කාර්යාලයේ සිට පර්යේෂණයට භාජනය කරන ලදී.

### අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම

ICRC විසින් 2003 වසරේදී කැඳවන ලද රාජ්‍ය හා රාජ්‍ය නොවන විශේෂඥයන්ගේ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වල පහත දැක්වෙන විශේෂ අවශ්‍යතා පිලිගන්නා ලදී[17]:

- අතුරුදහන්වූපුද්ගලයාට අත්වූ ඉරණම හෝ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට තොරතුරු ලබාගැනීමේ අවශ්‍යතාව (එම පුද්ගලයා මියගොස් ඇත්නම් මියගිය දිනය සහ ස්ථානය, මරණය සිදුවූ ආකාරය සහ මළ සිරුර ඇති ස්ථානය දැනගැනීමේ අවශ්‍යතාව);
- අවමඟුල් /ආගමික වතාවත් කරගෙනයාමේ හැකියාව තිබීමේ අවශ්‍යතාව;
- නෛතික සහ පරිපාලන උපකාර ලබාගැනීමේ අවශ්‍යතාව (ඔවුන්ගේ අයිතිවාසිකම් සහ ක්‍රියාපටිපාටි ගැන තොරතුරු);
- ආර්ථික සහ මූල්‍යාධාර ලබා ගැනීමේ අවශ්‍යතාව;
- මානසික /මනෝසමාජීය ආධාර ලබා ගැනීමේ අවශ්‍යතාව;
- ආරක්‍ෂාවට ඇති තර්ජනවලින් ආරක්‍ෂාවීමේ අවශ්‍යතාව;
- ඔවුන් අත්විඳින ලද දුක්පීඩා සඳහා යුක්තිවිනිශ්චය පිණිස ප්‍රවේශය ලබා ගැනීමේ අවශ්‍යතාව;

ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල දෛනික ජීවිතයට අතුරුදහන්වීමේ හේතුවෙන් බලපාන විවිධ ඵලවිපාක ලේඛනගත කිරීම සඳහා රටේ සියලුම දිස්ත්‍රික්කවල අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් 395 ක්[18] සමඟ අර්ධව්‍යුහගත සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.[19]

ICRC තක්සේරුකරුවන් අර්ධව්‍යුහගත පෝරමයක් යොදා ගත් අතර එයට මෙම අතුරුදහන්වීම නිසා එම පවුල් මුහුණපා ඇති මානසික, මනෝසමාජීය, ආර්ථික, නෛතික සහ පරිපාලන ඇතුළු දුෂ්කරතා සහ යුක්තිය ඉටුවීමේ අවශ්‍යතාව ඇතුළු පිළිගැනීමේ රාමුව තුළ මුහුණපාන අභියෝග පිළිබඳ සංවෘත සහ විවෘත ප්‍රශ්ණ ඇතුළත්විය.

පිළිගැනුම සහ යුක්තිය ඉටුවීම සම්බන්ධයෙන් විශේෂ ප්‍රශ්න ඇසීමක් සිදුනොවීය.[20] එසේවුවත් සම්මුඛ සාකච්ඡා පවත්වන අවස්ථාවේදී, ඔවුන්ට ඇති වඩාත් පීඩාකාරී ගැටළු නිගමනය කරන ලෙස මෙම පවුල්වලින් ඉල්ලා සිටි විට මෙම ප්‍රශ්න නිරායාශයෙන්ම ඉදිරිපත්විය.

මෙම ව්‍යුහය නම්‍යශීලි වූ බැවින්, මෙම තක්සේරු පෝරමය සම්මුඛ සාකච්ඡා පවත්වන "පිටපතක්" ලෙස භාවිත කරන ලදී. එය පවුල් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මෙහෙයවීමේ රාමුවක් විය. ඍජු සම්මුඛ සාකච්ඡා පැවැත්වීම නිසා මෙම පවුල්වල දුෂ්කරතා සහ විසඳිය යුතු ගැටළු ප්‍රමාණිකරණය පිණිස වැඩිමනත් තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි මෙම පවුල්වල පුද්ගලික අත්දැකීම් කෙරෙහි හොඳින් කාලය මිඩංගු කිරීමට ඉඩ ලැබුණි.

### කේන්ද්‍රීය කණ්ඩායම්

දත්ත ලබාගැනීමේ අනුපූරක ප්‍රභවයක් ලෙස කේන්ද්‍රීය කණ්ඩායම්[21] යොදා ගන්නා ලදී. ඔවුන්ගේ විශේෂිත අවශ්‍යතා ගැන ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමේ අරමුණින් දිස්ත්‍රික්ක 11[22] කදී අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල විශේෂ සාමාජිකයන් (දෙමව්පියන්, බිරිඳ ආදී) ගේ කේන්ද්‍රීය කණ්ඩායම් රැස්වීම් 17 ක් පවත්වන ලදී.

කේන්ද්‍රීය කණ්ඩායම් රැස්වීම්වලට සහභාගිවූ සෑම කෙනෙකුටම ඔහුගේ/ඇයගේ පවුලේ සාමාජිකයාට ඇති ඥාතිත්වය සහ පවුලේ කාර්යභාරයට අදාලව ඔහුගේ /ඇයගේ පවුලේ සමාජිකයා අතුරුදහන්වීමේ ප්‍රතිඵලක් ලෙස ඔහු /ඇය මුහුණපා සිටින වඩාත් වැදගත්වන ප්‍රශ්න සම්බන්ධයෙන් ගතික අන්තර් සාකච්ඡාවේදී අදහස් පළකිරීමට අවස්ථාව ලබාදෙන ලදී.

අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල විශේෂ සාමාජිකයන්ගේ රැස්වීම් පැවැත්වීමෙන් තමන්ගේම පවුලේ /නිවසේ සෙසු සාමාජිකයන් ඉදිරියේ තම අවශ්‍යතා පළකිරීමේ අපහසුතා ඇතිව සිටිය හැකි පුද්ගලයන්ට තනිතනිව තම හැඟීම් වඩාත් සුරක්ෂිත පරිසරයකදී පළ කිරීමට ඉඩසලසාදීමක් සිදුවිය.

සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වල සාමාජිකයන්ට එක් විශේෂ අවශ්‍යතා ගොන්නක් සම්බන්ධයෙන් (උදාහරණ; ආර්ථික අවශ්‍යතා, මනෝසමාජීය අවශ්‍යතා, පිළිගැනීමේ අවශ්‍යතා, නෛතික සහ පරිපාලන අවශ්‍යතා ආදිය) තමන් ගේ අවශ්‍යතා ප්‍රකාශ කිරීම තවදුරටත් දියුණුකර ගැනීමට අවස්ථාවක් කේන්ද්‍රීය කණ්ඩායම් විසින් ලබාදෙන ලදී.

[17] මෙම ක්‍රමවේදය පහත සඳහන් වෙබ් ලිපිනයේ ඇත *https://www.icrc.org/eng/assets/files/other/icrc_themissing_012003_en_10.pdf.*
[18] වැඩිවිස්තර සඳහා නියැදි පිළිබඳ උපවගන්තියට යොමුවන්න.
[19] පවුල්වල අවශ්‍යතා තක්සේරුවෙන් ආවරණය කරන ලද ප්‍රදේශ පෙන්වන පහත අමුණා ඇති සිතියම බලන්න.
[20] නගන ලද ප්‍රශ්නයඃ "ඔබගේ අතුරුදහන් ඥාතියා සම්බන්ධයෙන් ඔබ බලාපොරොත්තුවන්නේ කවරාකාරයේ ක්‍රියා මාර්ගයක්ද නැත්නම් පිළිගැනුමක්ද?"
[21] කේන්ද්‍රීය කණ්ඩායමක් යනු එක් එක් සහභාගිකරුට ඔහුගේ /ඇයගේ අදහස් පළ කිරීමට අවස්ථාවක් ලබාදෙන සහ අතිරේක අන්තර් ගතික කණ්ඩායම් සාකච්ඡාවකට අවස්ථාවක් දීමකි.
[22] වව්නියාව, මුලතිව්, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, අම්පාර, මඩකලපුව, තිකුණාමලය, අනුරාධපුරය, මහනුවර සහ කුරුණෑගල.

කේන්ද්‍රීය කණ්ඩායම් පිහිටුවන ලද්දේ පවුල් සමග තනි තනිව සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් පසුවය. පවුල් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම අවසන් කිරීමෙන් පසුව පොදු වැදගත්කමක් ඇති යම් විශේෂ මාතෘකාවක් ඉදිරිපත්වී ඇත්දැයි දැනගැනීම පිණිස ICRC යම් දිස්ත්‍රික්කයක පුරවා බාරදෙන ලද පෝරම විශ්ලේෂණය කරයි. උදාහරණයක් දක්වන්නේ නම් දිස්ත්‍රික්ක කිහිපයක අතුරුදහන්වූ පුද්ගලයන්ගේ භාර්යාවන් තම ස්වාමිපුරුෂයන් නොමැතිවීමෙන් පැනනගින අවමානයට ලක්වීම සහ වෙනස් කොට සැලකීම පිළිබඳ ප්‍රශ්න ගැන කණස්සල්ල පළ කොට තිබිණ. එවිට කේන්ද්‍රීය කණ්ඩායම් ඔවුන්ට සංවේගය දක්වන කරුණු ඉදිරිපත් කිරීම සඳහා ඔවුන්ට අවකාශ සැලසීම සඳහා අවස්ථා සංවිධානය කළ අතර ICRC යට ඔවුන්ගේ තත්වය මැනවින් අවබෝධකර ගැනීමට ඉඩසලසා ගන්නා ලදි.

නියැදියේ ප්‍රමාණය සහ ව්‍යුහය නිර්වචනය කරන අවස්ථාවේදී[23], ශ්‍රී ලංකාවේ කලින් පැවති ගැටුමට සම්බන්ධයක් ඇතිව අතුරුදහන්වූ පුද්ගලයන් ලෙස ICRC සමග ලියාපදිංචි කර තිබූ අයගේ පවුල් 325 ක් පිටරටවල වාසය කරමින් සිටියහ. අතුරුදහන්වූ පුද්ගලයන්ගේ සියළු කාණ්ඩවල පවුල්වල අවශ්‍යතා මෙම තක්සේරුවේ නියෝජනය වන බවට වගබලාගැනීමට ICRC යට අවශ්‍යව තිබූ හෙයින් එම සංවිධානය පිටරට සිටින පවුල් සමග එක් කේන්ද්‍රීය කණ්ඩායමක් සැකසීමට සැලැසුම් කළේය. ස්විට්සර්ලන්තයේ රතු කුරුස සමාජය සමග සහයෝගිතාවයෙන් ස්විට්සර්ලන්තයේ බර්න් නුවර දී පවත්වන ලද කේන්ද්‍රීය කණ්ඩායමකට අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් 8 කට ආරාධනය කරනු ලැබීය. අවාසනාවට එක් පවුලක් පමණක් රැස්වීමට පැමිණි අතර මෙම කාණ්ඩයෙන් මෙම තක්සේරුවේදී අපේක්ෂාකල අකාරයට දත්ත රැස්කරගැනීමට හැකි නොවීය.

## ප්‍රධාන කාරකයන් (පාර්ශවකරුවන්) සමඟ රැස්වීම්

මෙම තක්සේරුවේ විවිධ විෂය පථයන් ගැන විශේෂිත දැනීමකින් හෙබි ප්‍රධාන කාරකයන් /පාර්ශවකරුවන් හමුවී ඇතැම් විෂයයන් ගැන ගැඹුරින් කරුණු විමසා බැලීමක් සිදුවිය. (අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම, අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල ඇති මනෝ සමාජීය දුෂ්කරතා, අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වලට බලපාන ආර්ථික, නෛතික සහ පරිපාලන බාධක මෙන්ම මෙම දුෂ්කරතා ආමන්ත්‍රණය කිරීම පිණිස ප්‍රයෝජනයට ගැනීමට ඇති සම්පත් (එසේ නොමැතිද යන්නත්) පිලිබඳ දත්ත එකතුවක් ගැන[24] සාකච්ඡාවලදී "පැහැදිලිව නොපෙනෙන" තොරතුරු ඉස්මතුවීමට ඉඩදීම පිණිස ඔවුන් සමඟ පැවති සාකච්ඡා මුළුමනින්ම ව්‍යුහගත කිරීමක් කර නොතිබිණි.

දත්ත රැස්කිරීමේ මෙම ක්‍රමය පවුල්වල හඳුනාගත් අවශ්‍යතා ඉටුකිරීම පිණිස සම්පත් සැලසුම්කර ගැනීමට ඉඩ සැපයීය.

# 4.2 නියැදියේ ප්‍රමාණය සහ ව්‍යුහය නිර්වචනය කිරීම

නියැදියේ ප්‍රමාණය සහ ව්‍යුහය නිර්වචනය කරන අවස්ථාව වන විට ශ්‍රී ලංකාවේ කලින් පැවති ගැටුමට සම්බන්ධයක් ඇතිව අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඒකාබද්ධ ලැයිස්තුවක් නොතිබුණි. (මෙය තවමත් අනාගතයේදී සපුරාගත යුතු කාර්යයකි.)

පුද්ගලයන් පැහැරගෙනයාම සහ අතුරුදහන්වීම පිලිබඳ පැමිණිලි විභාග කරන ජනාධිපති පරීක්ෂණ කොමිසමට[25] ගැටුමට සම්බන්ධයක් ඇතිව අතුරුදහන් වූ පුද්ගලයන් 20,000 ක් පමණ දෙනා ගැන පැමිණිලි ලැබී තිබුණු අතර වෙනත් විවිධ මූලාශ්‍ර ඊට වැඩි සංඛ්‍යාවක් සපයනු ඇත.[26]

ICRC යේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ලැයිස්තුවට[27] එම අවස්ථාවේදී පවුල් 15,688 කින් අතුරුදහන් වූ පුද්ගලයන් 16,148 කගේ නම් ඇතුලත් වන අතර එය නියැදි රාමුව සඳහා මූලාශ්‍රය භාවිතා කරන ලදි.

ගුණාත්මක ප්‍රතිඵල වලින් තහවුරු කෙරෙන ප්‍රමාණාත්මක ප්‍රතිඵල අත්කරගැනීම, දත්ත රැස්කිරීමේ තක්සේරු ක්‍රමවේදයේ අරමුණ වූ බැවින්, නියැදියේ ප්‍රමාණය ගණන් බැලීමට පරිගණක විශ්ලේෂණ සූත්‍රය[28,29] භාවිත කරන ලදී. දෝෂයේ ආන්තිකය + හෝ - 5 ලෙසත් විශ්වාසයේ මට්ටම 95% ක් ලෙසත් තබා ගන්නා ලදී.


සඳහන් කළ විචල්‍යයන් යොදාගනිමින්, නියැදියේ ප්‍රමාණයේ සංඛ්‍යාන අදාලත්වයේ නිර්ණායකයේ නියමය සම්පූර්ණ කිරීමට අතුරුදහන් වූ පුද්ගලයන් 15,688 න් 375 ක් සම්මුඛ සාකච්ඡාවට යොදාගත යුතු බව පරිගණක ගණන් බැලීම විසින් යෝජනා කෙරිණි. මෙම නියැදිය මුළු නියැදි රාමුවෙන් 2.39% නියෝජනය කරන බැවින් නියැදි රාමුව ස්තරකරනය පහසු කිරීම සඳහා එය 2.5% ක් ලෙස සැලකීමට එනම් අතුරුදහන්වූවන්ගේ පවුල් 392ක් ඇතුලත්කර ගැනීමට තීරණය කෙරිනි.[30]

මෙම නියැදිය සංඛ්‍යානමය වශයෙන් අදාලවීම පමණක් නොව ICRC සමග ලියාපදිංචි කෙරුණු අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල මුළු සංඛ්‍යාව නියෝජනයවීම පිණිස, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල දුෂ්කරතා සහ අවශ්‍යතා කෙරෙහි යම් බලපෑමක් ඇතිකිරීමට හැකියාවක් තිබිය හැකි කොටස් මුල්කොට ගෙන, නියැදි ව්‍යුහය නිර්වචනය කිරීමට පහත සඳහන් නිර්ණායක තෝරා ගන්නා ලදී. (මෙය සිදු කරන ලද්දේ නියැදි රාමුවේ සිදුකරන ලද ජනවිකාස වගතුග විශ්ලේෂණය පදනම් කරගනිමින් එහි ප්‍රතිඵල යොදා ගනිමිනි.)ඃ

[23] වැඩි විස්තර සඳහා කරුණාකර වගන්තිය 4.2 බලන්න.
[24] ICRC විසින් ජාතික සහ ප්‍රාදේශීය තලයේ බලධාරීන්, ජාත්‍යන්තර /රාජ්‍ය-නොවන සංවිධාන, විද්වතුන්, පර්යේෂකයන් සහ විශේෂඥයන් හමුවිය.
[25] *www.pcicmp.lk,* accessed in December 2015.
[26] වින්දිතයන්ගේ සංවිධාන පුවත්පත් ලිපි ආදිය
[27] අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් සම්බන්ධයෙන් ICRC ඉටුකරන කාර්යයන්හි ප්‍රධාන අරමුණ අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලි කරගැනීමේ ක්‍රියාවලියෙහි නිරතවීම හෝ ඊට උපකාර කිරීමයි. අතුරුදහන් වූ පුද්ගලයන් ගේ නම් ලැයිස්තුව සියළුම සිද්ධි වෙන් වෙන්ව සැකසූ සංග්‍රහයක් වෙයි. එය පදනම් කරගෙන ICRC ඔවුන්ගේ පවුල් සඳහා එම පුද්ගලයාට අදාල පිළිතුරු ලබා ගැනීමට ක්‍රියාකරයි. මෙම නම් ලැයිස්තු සංග්‍රහය එයම ඉලක්ක කරගත් එකක් නොවේ.
[28] මූලාශ්‍රයඃ *http://www.surveysystem.com/sscalc.htm.*
[29] ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශිත "විශාල මානුෂවාදී අර්බුදවල මානසික සෞඛ්‍ය සහ මනෝසමාජීය තත්වයන් සහ අවශ්‍යතා තක්සේරුවඃ මානුෂවාදී සෞඛ්‍ය කාරකයන් සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙවලම් කට්ටලය" 2010 ජනවාරි , *http://mhpss.net/resource/who-toolkit-for-humanitarian-health-actors/.*
[30] අවසානයේදී නියැදියේ ප්‍රමාණය සහ ව්‍යුහය එහි සංඛ්‍යානවල අදාලත්වය සම්බන්ධයෙන් පරීක්ෂා කළ විට, මුළු නියැදි පවුල් සංඛ්‍යාව 395 බවට පත්කිරීම පිණිස පවුල් තුනක් එකතු කිරීමට තීරණය කරන ලදී.

- භූගෝලීය ආවරණයː අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල්වල ICRC ලැයිස්තුව විග්‍රහය, පෙන්නුම් කරන්නේ අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම මෙන්ම පිටරටවලද දිවිගෙවන බවයි. එහෙයින් භූගෝලීය වශයෙන් ඔවුන් බෙදීයාම, පිළිතුරුදීමේදී බලපෑමක් විය හැකි මූලික කරුණක් ලෙස සලකන ලදී. එයට හේතුව දිස්ත්‍රික්කයක සහ පිටරට ආර්ථික සමාජ පරිසරයේ වෙනස්වීමක් ඇති බැවින් ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකින්ම පවුල් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීමටත් විදේශවල දිවිගෙවන අය වෙනුවෙන් කේන්ද්‍රීය කණ්ඩායමක් සංවිධානය කිරීමටත් තීරණය කරන ලදී. එක් එක් දිස්ත්‍රික්කයේ වාසය කරන මුළු පවුල් සංඛ්‍යාවෙන් 2.5% ක් එම දිස්ත්‍රික්යේ සංඛ්‍යානමය වශයෙන් අදාල නියැදියේ ප්‍රමාණය සඳහා අගයක් ලෙස ලබාගන්නා ලදී. පිටරට වාසය කරන පවුල් කණඩායමක් සමග කේන්ද්‍රිය කණ්ඩායමක් සැලසුම් කරනලදී.[31]
- අතුරුදහන්වූ පුද්ගලයන් ගේ ස්ත්‍රී පුරුෂභාවයː ICRC සමග ලියාපදිංචි කෙරුණු අතුරුදහන් වූ පුද්ගලයන්ගෙන් බහුතරය පිරිමින් බව ජනවිකාශ වගතුග විග්‍රහයෙන් පෙන්නුම් කෙරෙයි. එබැවින්, ස්ත්‍රියක හෝ පුරුෂයෙකු අතුරුදහන්වූ විට පවුල්වල අවශ්‍යතාවලට ඇති බලපෑමේ වෙනස්කම් ඇද්දැයි විමසා බැලීම පිණිස, සහ එසේ වන්නේ නම් එම වෙනස්කම් මොනවාදැයි දැනගැනීමට නියැදිය සැකසීම සඳහා මෙම තීරණායකය යොදා ගන්නා ලදී.

**රූපය 2ː එක් එක් දිස්ත්‍රික්කයක් සඳහා පවත්වන ලද සම්මුඛ සාකච්ඡා ගණන**




[31] නියැදියේ ප්‍රමාණය සහ ව්‍යුහය නිර්වචනය කරන අවස්ථාවේදී, අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල් 325 ක් එතෙර දිවිගෙවමින් සිටියහ. කේන්ද්‍රිය කණ්ඩායමක් සංවිධානය කිරීමට හැකි තරම් අඩුම දුරකින් ජීවත්වන අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල් කණ්ඩායමක් දිවිගෙවමින් සිටි එකම රට ස්විට්සර්ලන්තයයි. ස්විස් රතු කුරුස සමාජයේ සහයෝගයෙන් අතුරුදහන්වූවන්ගේ පවුල් අටකට ස්විට්සර්ලන්තයේ බර්න් නගරයට පැමිනෙන ලෙස ආරාධණය කලද අවාසනාවට එක් පවුලක් පමණක් රැස්වීමට පැමිණි අතර මෙම කාණ්ඩයෙන් මෙම තක්සේරුවේදී දත්ත රැස්කරගැනීම අපේක්ෂාවට වඩා අඩුවිය.

- ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ පුද්ගලයන් සහ වෙනත් අතුරුදහන් වූ පුද්ගලයන්: ICRC ය අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල් සමග යෙදුණු අන්තර් ක්‍රියාකාරීත්වයේදී මෙම පවුල් උප කාණ්ඩ දෙකෙහි අවශ්‍යතා අතර පැහැදිලි වෙනසක් ඇති බව දක්නට තිබුණි. පවුල් අවශ්‍යතා තක්සේරුවේදී, මෙම කාණ්ඩකරණය සිදුකරන ලද්දේ මෙම උප කණ්ඩායම් දෙකෙහි වත්මන් අවශ්‍යතාවල සහ එම අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට ඇති සම්පත්වල විචල්‍යයක් තිබිය හැකි යන්න කෙරෙහි යහපත් අවබෝධයක් ඇතිවය. සමස්ත සිද්ධි ප්‍රමාණය පෙන්නුම් කෙරෙන පරිදි, නියැදිය තෝරා ගන්නා ලද්දේ ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ පුද්ගලයන් සහ වෙනත් අතුරුදහන් වූ පුද්ගලයන් අනුපාතයට ගරු කරන ආකාරයෙනි (පිළිවෙලින් 35% සිට 67% දක්වා).
- අතුරුදහන් වූ පුද්ගලයන් ගේ: අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල සුබසිද්ධියට ආධාරයක් හෝ අනර්ථයක් විය හැකි සමාජ, සංස්කෘතික හා ආගමික භාවිතයන් කෙරෙහි ජනවර්ගත්වයේ බලපෑමක් ඇත. මෙම උපකල්පනය ඇතිව ජනවර්ගත්වය වැදගත් මූලාරම්භ කොටසක් ලෙස සලකා කටයුතු කරනු ලැබීය. අනතුරුව මෙම නියැදිය සකස්කර ගන්නා ලද්දේ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වල ලැයිස්තුවෙන් ICRC ට ඇති දත්ත අනුව විමසීම්වල අනුපාතයට[32] ජනවර්ගත්වය නියෝජනය වන ආකාරයෙනි.

මෙම ස්ථර සෑදීමේ තලයේදී අතුරුදහන්වූ දිනය වැනි වෙනත් කරුණු සලකා බැලීමට ඉඩ නොලැබිණි. එසේ වුවත් අහඹු තෝරාගැනීම්වලදී ගැටුම පැවති මුළුකාලයම ආවරණයවීම කෙරෙහි වගබලාගැනීම පිණිස පාලනයක් යොදා ගන්නා ලදී.

පවුල් පදිංචි ස්ථාන, අතුරුදහන් වූ පුද්ගලයා ගේ ස්ත්‍රී පුරුෂභාවය, අතුරුදහන් වූ පුද්ගලයා ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ තැනැත්තෙකුද නැද්ද සහ අතුරුදහන් වූ පුද්ගලයාගේ ජනවර්ගත්වය අනුව නියැදි ස්ථර සාදාගැනීමෙන් පසුව අහඹු නියැදි උත්පාදකයක් භාවිත කරමින් සම්මුඛ සාකච්ඡා සඳහා අහඹු ලෙස පවුල් තෝරා ගනු ලැබූහ.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, පවුල් අවශ්‍යතා තක්සේරුව පැවැත් වූ 2014 ඔක්තෝබර් මාසයේ සිට 2015 සැප්තැම්බර් මාසය දක්වා කාලය තුළදී සම්මුඛ සාකච්ඡා කිරීමට යොදා ගත් අතුරුදහන් වූ පුද්ගලයන් ගේ මුළු පවුල් ගණන 395 කි.


## 4.2.1 අවශ්‍යතා තක්සේරු නියැදියේ පැතිකඩ

මෙම කොටසින් මෙම තක්සේරුව සඳහා සම්මුඛ සාකච්ඡා කළ පවුල් 395 විසින් සපයන ලද තොරතුරු මෙන්ම සම්මුඛ සාකච්ඡා කළ පවුල්වල දත්ත පදනම් කොට ගෙන අතුරුදහන් වූ පුද්ගලයන් ගේ වගතුග පිළිබඳ තොරතුරු සැපයේ.

## අතුරුදහන් වූ වසර

ඉහතින් සඳහන් කළ පරිදි නියැදියේ ස්ථර සෑදීම අතුරුදහන් වූ වසර අනුව සිදු නොකරන ලදී. එසේවුවත් නියැදියේ ජනවිකාශ වගතුග විග්‍රහ කරන විට තක්සේරුව සඳහා සලකා බලන ලද නියැදිය ගැටුම පැවති සියළු කාලපරිච්ඡේද නියෝජනය කරන බව සහ ගැටුම නිමවීමෙන් පසුවද එයට සම්බන්ධයක් ඇතිව අතුරුදහන් වූ පුද්ගලයන් ද ඇතුළත් බව පෙන්නුම් කරයි.

ප්‍රස්තාරය 4: අතුරුදහන් වූ පුද්ගලයා අතුරුදහන් වූ වසර





[32] ICRC තමන්ගේ ලේඛණ වලින් ලබාගත් අතුරුදහන්වූවන්ගේ පවුල් වලින් ලබාගත් තොරතුරු වලට අනුව.

# අතුරුදහන් වූ පුද්ගලයන් ගේ වයස

සම්මුඛ සාකච්ඡා පවත්වන ලද පවුල් 395 න් (75%) ප්‍රකාශ කළේ ඔවුන් ගේ ඥාතියා අතුරුදහන් වූ අවස්ථාව වන විට අවුරුදු 19 ත් 36 ත් අතර වයසේ පසුවූ බවයි. 11% ක් පැවසුවේ තම ඥාතීන් අතුරුදහන් වූ අවස්ථාව වන විට බාලවයස්කරුවන් වූ බවයි.


ප්‍රස්තාරය 5: අතුරුදහන් වූ අවස්ථාවේ එම පුද්ගලයන්ගේ වයස අනුව වර්ගීකරණය




# සම්මුඛ සාකච්ඡා පවත්වන ලද පවුල්

සම්මුඛ සාකච්ඡා වලට සහභාගීවූ සියල්ලෝම අතුරුදහන්වූ පුද්ගලයා ගේ ලඟම ඥාතීහු වූහ. සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූ තැනැත්තා හෝ තැනැත්තිය අතුරුදහන් වූ පුද්ගලයාට ඇති ඥාති සම්බන්ධතාව පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කරයි. එසේවුවත් සම්මුඛ සාකච්ඡාව පැවැත්වෙන අවස්ථාවේදී පවුලේ සෙසු සාමාජිකයන්ද එහි පැමිණ සිටි අතර ඔවුන් මෙම තක්සේරුවට දායක වූ බව සඳහන් කිරීම වැදගත්ය.

ප්‍රස්තාරය 6: අතුරුදහන් වූ පුද්ගලයාගේ, සම්මුඛ සාකච්ඡාවට සහභාගිවූ තැනැත්තාට ඇති සම්බන්ධය




වගුව 1 හි ඉදිරිපත් කරන ඇති ආකාරයට, සම්මුඛ සාකච්ඡා පවත්වන ලද පවුල්වලින් 16% ක් එක් සාමාජිකයෙකුට වඩා අතුරුදහන් පවුල්ය.

සම්මුඛ සාකච්ඡා පවත්වන ලද සියළුම පවුල්වලින් 62% ක් තමන් දෙමළ ජනවර්ගයට අයත් බවත් 35% ක් තමන් සිංහල ජනවර්ගයට අයත් බවත් 3% ක් තමන් මුස්ලිම් ජනවර්ගයට අයත් බවත් ප්‍රකාශ කළහ.

**වගුව: අතුරුදහන් වූ පුද්ගලයන් සංඛ්‍යාව අනුව පවුල් වර්ගීකරණය**

| පවුලකට අතුරුදහන්වූ පුද්ගලයන් සංඛ්‍යාව | සම්මුඛ සාකච්ඡා කරනලද පවුල් සංඛ්‍යාව |
|---|---|
| 1 | 332 |
| 2 | 48 |
| 3 | 11 |
| 4 | 2 |
| 5 | 1 |
| 6 | 1 |


Tuan Zaharan/ICRC


# 5. තක්සේරුවෙන් සොයා ගත් කරුණු

ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වල අවශ්‍යතා පිළිබඳ තක්සේරුව පවත්වන ලද අවස්ථාව වන විට එම පවුල් වල පැවති අවශ්‍යතාවන්ට අදාලව සොයාගත් කරුණු මෙම වාර්තාවේ මෙම කොටසේදී විස්තර කෙරේ. හඳුනාගත් අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස යොදා ගැනීමට ඇති සම්පත් ද එමගින් ගෙනහැර දක්වයි.

කාලය සමඟ අවශ්‍යතා වෙනස්වන බව සහ ඊට බාහිර සාධක ගණනාවක බලපෑම් ඇති බව සටහන් කිරීම වැදගත්ය. "අතුරුදහන්වූ පුද්ගලයන් ගේ ඥාතීන්ට බලපෑමක් ඇතිවන්නේ අතුරුදහන්වූ පුද්ගලයාට ඇති ඔවුන්ගේ සම්බන්ධතාව අනුව ඔවුන් ඔවුන්ගේ වින්දිතත්වය සහ ඔවුන් දිවිගෙවන සංස්කෘතියේ සහ සමාජයේ මැදිහත්වීම මගිනි."[33] වෙනත් වචනවලින් පවසන්නේ නම් අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල් අද ප්‍රකාශ කරන අවශ්‍යතා හෙට ප්‍රකාශ කරන අවශ්‍යතාවලින් වෙනස් අතර අතුරුදහන් වූ පුද්ගලයන් /පුද්ගලයාට ඇති ඔවුන්ගේ සම්බන්ධතාව, සංස්කෘතික පසුබිම, සමාජයේ වෙනස්වීම් ආදියේ ආභාසය අනුව ඒවා සිදුවෙයි.

මානව අවශ්‍යතා ධූරාවලිය පිළිබඳ සිය න්‍යායේදී[34] ඒබ්‍රහම් මස්ලෝ තර්ක කරන්නේ පුද්ගලයකු පහළ මූලික අවශ්‍යතා සංසිඳුවීමෙන් පසුව ධූරාවලි ඉනිමගෙහි ඉහළ පවතින අවශ්‍යතා ආමන්ත්‍රණය කරන බවයි. මෙම ප්‍රවේශය අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වල අවශ්‍යතා හොඳින් අවබෝධ කරගැනීමට අවකාශ සලසයි.[35]

**රූපය 3: අවශ්‍යතා පිළිබඳ මස්ලොව්ගේ ධූරාවලිය**




මූලික අවශ්‍යතා වන්නේ කායික සහ ආරක්ෂාව හා සම්බන්ධ අවශ්‍යතාවන්ය. තක්සේරුවේදී හමුවූ පරිදි සහ වෙනත් රටවලදී ICRC ලබා ඇති අත්දැකීම් අනුව අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් ප්‍රථමයෙන් උත්සාහ දරන්නේ මෙවන් පවුල්වල බහුතරයකගේ පවුලේ ආදායම් උපයන්නා වූ තම අතුරුදහන් ඥාතියා නොමැතිවිට ඔවුන්ට ආහාර සහ වාසස්ථානයක් ලැබෙන බව තහවුරු කරගැනීමටයි. මෙම න්‍යායට අනුව මූලික කායික සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වන අවශ්‍යතා සපුරාලීමක් වූ විට පමණක් මනුෂ්‍යයෙක් පිළිගැනුමේ සහ ගරුකිරීමේ අවශ්‍යතා සපුරා ගැනීමක් අපේක්ෂා කරයි.

තක්සේරු රාමුවේදී[36] අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් ප්‍රකාශ කළ අවශ්‍යතා පුළුල් වශයෙන් මෙසේ වර්ගීකරණය කළහැකිය:

- අතුරුදහන්වූ පුද්ගලයාගේ සිටිනා තැන් දැන ගැනීමේ අවශ්‍යතාවය සහ ඔහුගේ/ ඇයගේ අතුරුදහන්වීම සිදුවූ ආකාරය දැන ගැනීම
- සංවේදනාත්මක අවශ්‍යතා
- ආර්ථික අවශ්‍යතා
- නෛතික සහ පරිපාලන අවශ්‍යතා
- පිළිගැනුම සහ යුක්ති විනිශ්චය අවශ්‍යතා

එක් එක් පවුල් තමන් ලබා ඇති අත්දැකීම් පදනම් කරගෙන තමන්ට ඇති වඩාත් පීඩාකාරී අවශ්‍යතා නිර්වචනය කරන බව දැනගැනීම වැදගත්ය. එක් එක් පවුලේ අවශ්‍යතා එක් විෂය පථයකට හෝ සියල්ලේ සම්මිශ්‍රණයකයක් හෝ ඒවායින් කිහිපයකට විශේෂිත විය හැකිය. එමෙන්ම අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා කාලයත් සමග වෙනස්වෙයි. එක් අවස්ථාවකදී නිරවපේෂයෙන් අවශ්‍යවන දෙයක් එනම් අතුරුදහන් පුද්ගලයා පීවග්‍රහයෙන් සොයා ගැනීම යන අවශ්‍යතාව කාලයත් සමඟ මළසිරුර කොහේ ඇත්දැයි දැනගැනීමේ අවශ්‍යතාවක් ලෙස වෙනස්විය හැකිය.

[33] ICRC වාර්තාව: අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල් - රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශේෂඥයන්ගේ සමුළුවට පෙරාතුව සිදුවූ ක්‍රියාදාමයන්ගේ නිර්දේශයන්ගේ සාරාංශය *https://www.icrc.org/eng/assets/files/other/icrc_themissing_012003_en_10.pdf.*

[34] Maslow, A.H. (1943). "Psychological Review 50 (4) 370–96 - A theory of human motivation", *http://dx.doi.org/10.1037/h0054346.*

[35] Robins, S. (2013), "Families of the Missing: A Test for Contemporary Approaches to Transitional Justice", Routledge, ISBN 978.0-415-81248-1 (hbk).

[36] මෙහි සඳහන් පවුල් විසින් සඳහන් කරනලද අවශ්‍යතා කලාප ඒවායේ වැදගත්කම අනුව සකසන ලද අනුපිළිවෙලකට අනුව නොව සම්මුඛ සාකච්ඡා වලදී භාවිතා කරන ලද ආකෘතියේ සඳහන් පිළිවෙලට ගොනු ර තිබේ.

තක්සේරුව පවත්වන ලද කාලය තුළ සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල් එම අවස්ථාව වනවිට මුහුණදී සිටි විශාලතම දුෂ්කරතා මොනවාදැයි ලැයිස්තුගත කරන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටිනලදී. ඔවුන්ට අවශ්‍ය පරිදි බොහෝ පිළිතුරු හෝ පිළිතුරු කිහිපයක් දීමට හැකියාව තිබුණි. මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙමින් තමන් ඉතා කර්කෂ ආර්ථික තත්වයකින් දිවිගෙවන බවත් (සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වලින් 53%ක් අවම වශයෙන් මෙය ඔවුන්ගේ එක් දුෂ්කරතාවයක් පමණක් බව පැවසූහ.) අතුරුදහන් වූ ඔවුන්ගේ ඥාතියාට අත්වූ ඉරණම කුමක්දැයි පිළිතුරක් නොමැතිවීමෙන් ඇතිවූ බොහෝ පීඩාකාරී සංවේදනාත්මක දුෂ්කරතා මැද දිවිගෙවන බවත් පැවසූහ. (සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වලින් 36%ක් මෙම කාරණය අවම වශයෙන් එක් වරක්වත් ඔවුන්ගේ පිලිතුරෙහි සඳහන් කළහ.)

ඔවුන් ගේ මෙම අවශ්‍යතා ඉතා හොඳින් ආමන්ත්‍රණය කිරීම පිණිස බලධාරීන් කුමන ක්‍රියාමාර්ග ගත යුතු බවට ඔවුන් අපේක්ෂා කරන්නේදැයි ඇසූ විට පවුල් විසින් ඉදිරිපත් කරනලද ප්‍රමුඛතා වල යම් තරමක විෂමතා දක්නට ඇත. සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ පවුල්වලින් 36% ක් අඩු වශයෙන් එක්වරක් වත් පැවසුවේ අතුරුදහන් වූ ඔවුන්ගේ ඥාතියාට අත්වූ ඉරණම කුමක්දැයි හෝ එම ඥාතියා කොහේ සිටීදැයි යන තොරතුර ලැබීමෙන් තමන් දැනට මුහුණපා ඇති අවාසනාවන්ත තත්වය විසඳෙන බවයි. පවුල්වලින් 31%ක් අඩු වශයෙන් එක්වරක් වත් පැවසුවේ ඔවුන් මූල්‍යාධාරයක් බලාපොරොත්තු වන බවයි.

බරපතල ආර්ථික දුෂ්කරතා ඇතත් මෙම පවුල් තවදුරටත් සඳහන් කළේ ඔවුන්ගේ අතුරුදහන්වූ ඥාතියාට අත්වූ ඉරණම කුමක්දැයි හෝ එම ඥාතියා කොහේ සිටීදැයි දැනගැනීමේ, අවශ්‍යතාව ප්‍රධාන බව අවසාන වශයෙන් පැවසිය හැකි බවයි.

**"මට මගේ අතුරුදහන් පුතා ගැන ස්ථිර පිළිතුරක් අවශ්‍යයි. ඔහු කොහේ හෝ ජීවතුන් අතර සිටින බවට මා තුළ තවමත් විශ්වාසයක් පවතිනවා. ඔහු ඉක්මනින් ගෙදර ඒවි. අතුරුදහන් පුද්ගලයන් ගේ පවුල්වලට උපකාර කළයුත්තේත් පිළිතුරු සැපයීමේ වගකීම දැරිය යුත්තේත් ආණ්ඩුවයි."**


**- අතුරුදහන් පුද්ගලයෙකුගේ මවක් -**

## 5.1. තමන්ගේ අතුරුදහන් ඥාතින්ට අත්වූ ඉරණම කුමක්දැයි හෝ එම ඥාතියා කොහේ සිටීදැයි දැනගැනීමට පවුල්වලට ඇති අවශ්‍යතාව

අවාසනාවට අතුරුදහන් ඥාතින්ට අත්වූ ඉරණම කුමක්දැයි හෝ එම ඥාතියා කොහේ සිටීදැයි නොදැනීම හේතුවෙන් එම අතුරුදහන් පුද්ගලයා කායික වශයෙන් නොසිටින නමුත් මානසික වශයෙන් ඔවුන් සමඟ සිටින්නේය.[37]

ඔවුන් ගේ අතුරුදහන් වූ ඥාතීන්ට අත්වී ඇති ඉරණම ගැන තම අභ්‍යන්තර විශ්වාසයන් ප්‍රකාශ කරන ලෙස තක්සේරු රාමුව තුළ එම පවුල්වලින් ඉල්ලා සිටින ලදී. සම්මුඛ සාකච්ඡා පවත්වන ලද පවුල් අතර සිය ප්‍රියාදරයන් මියගොස් ඇතැයි විශ්වාස කරන පවුල් (36% ක්) එම සිද්ධිය සම්බන්ධයෙන් සර්ව සුභවාදී දිගුකල් පවතින අපේක්ෂාවක් සඟවා ගෙන සිටිති. ("ඔවුන් ජීවතුන් අතර සිටිය හැකිය") තමන් ගේ ප්‍රියාදරයන් ජීවතුන් අතර සිටිය හැකියැයි විශ්වාස කරන අය පවා (31% ක්) සැකයේ සෙවනැල්ලක් ඇතිව සහ මේ සිද්ධිය ගැන සර්ව අසුභවාදී දෙයක් ඇතිවිය හැකියැයි සිතා ජීවත් වෙති. ("ඔවුන් මියගොස් සිටිය හැකිය") ඔවුන්ගේ අතුරුදහන් වූ ඥාතීන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි සහ අතුරුදහන් වූ ආකාරය පැහැදිලිකරන, විශ්වාස කළ හැකි තොරතුරු ලැබෙන තෙක් එම පවුල් දිගටම අවිනිශ්චිතතාවයෙන් දිවිගෙවති.

**ප්‍රස්තාරය 7: ඔවුන්ගේ අතුරුදහන් පුද්ගලයන්ට අත්විය හැකි ඉරණම සම්බන්ධයෙන් පවුල් දක්වන ආකල්පය**




පවුලේ සම්භවය හෝ පසුබිම කුමක් වුවත් අතුරුදහන් වූ ප්‍රියාදරයාට අත්වී ඇති ඉරණම සහ එම තැනැත්තා කොහේ සිටිත්දැයි දැනගැනීම සාමාන්‍යයෙන් අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වලට ඇති ඉතා වැදගත් අවශ්‍යතාවලින් එකකි. අතුරුදහන් වූ තම සැමියාට අත්වී ඇති ඉරණම නොදන්නා බිරිඳක් තුළ නොනැසී පවතින වේදනාව, ගැටුම පැවති කාලයේදී මෙම අතුරුදහන් වූ පුද්ගලයා ගේ දේශපාලන සම්බන්ධකමක් පැවති ආකාරයෙන්ම පවතින බව ප්‍රත්‍යක්ෂවෙයි.

**"යුද්ධය අවසන් වුවත් ස්වාමි පුරුෂයා ආපසු ගෙදර ඇවිත් නැති නිසා ඔහු ජීවතුන් අතර නැහැ කියා විශ්වාස කරන්න මට බැහැ. ඔහුගේ සිරුර මම දැක්කෙ නැහැ. මම විශ්වාස කරන්නේ කොහේ හරි ඔහු පනපිටින් ඉන්න පුළුවන් කියල. ඒත් ඔහු අතුරුදහන් වෙලා අවුරුදු අටක් ගතවෙලා. සමහර වෙලාවකදි මට හිතෙන්නෙ ඔහු ජීවතුන් අතර සිටියා නම් ඔහු කොහොම හරි ආපසු ගෙදර ඇවිත් කියලයි. මට විශ්වාසයක් නැහැ මම දන්නේ නැහැ ඔහු ජීවතුන් අතර සිටිනවද මිය ගිහින්ද කියලා."**

**- අතුරුදහන් වූ පුද්ගලයෙකු ගේ බිරිඳ -**

ඔවුන් ගේ අතුරුදහන් වූ ඥාතීන්ට අත්වී ඇති ඉරණම ගැන සියළුම පවුල් එකම විශ්වාසයක් නොදරති. ඔවුන් ගේ විශ්වාසය තීරණය කරන බොහෝ විචල්‍යයන් ඇත. අතුරුදහන්වීම සිදුවීමෙන් පසුව ගතවී ඇති කාලය, ලැබී ඇති තොරතුරු, (හෝ තොරතුරු නොමැතිවීම) මෙම තත්වයන්හිදී කටයුතු කිරීම පිණිස එක් එක් තැනැත්තන් තුළ චිත්ත ශක්තිය ඇතිකරණ යාන්ත්‍රණ වැනි විචල්‍යයන්ද ඒ අතර වෙයි.

[37] Pauline Boss – Ambiguous loss in families of the missing, P39. The LANCET Supplement, Medicine and Conflict, Vol 360, December 2002.

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් තුළ සහ වෙනත් අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල් තුළ, අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සම්බන්ධයෙන් ඇති විශ්වාසයෙහි පූර්ණ වෙනස්කම් පවතින බව මෙම තක්සේරුවේදී හෙලිවිය. ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලින් 9% ක් පමණක් තවමත් තමන්ගේ ප්‍රියාදරයා ජීවතුන් අතර සිටින බව විශ්වාස කරන අතර වෙනත් අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වලින් 43% තුළ එම විශ්වාසය පවතී.

තමන්ගේ අතුරුදහන් වූ ඥාතියා තවමත් ජීවතුන් අතර සිටින බව විශ්වාස කිරීමට හේතුව ඔවුන්ට ඒ සම්බන්ධයෙන් විශ්වාස කිරීමට පිලිගත හැකි වෙනත් සාක්ෂි නොමැතිබව යැයි එම පවුල් විස්තර කළහ. තමන් අතුරුදහන් වූ පුද්ගලයා ගේ සිරුර නුදුටු බවට ඇතැම් පවුල් තර්ක ඉදිරිපත් කළ අතර තවත් අය සාස්තරකරුවන් තමන්ගේ අතුරුදහන් ඥාතියා ජීවතුන් අතර සිටින බව ප්‍රකාශ කොට ඇති බව කීහ. තම අතුරුදහන් වූ පුද්ගලයා ජීවත්ව සිටන බවට ඇතැම් පවුල්වල ඇති විශ්වාසය ආගම මගින් තවත් ශක්තිමත් කොට ඇත. තම ප්‍රියාදරයන් යුද්ධය පැවති කාලයේදී හමුදාවට හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශවයට බාර වූ බව හෝ හමුදාව හෝ ප්‍රතිවිරුද්ධ පාර්ශවය විසින් ඔවුන් අල්ලා ගන්නා ලදැයි පවසන බොහෝ පවුල් තවමත් විශ්වාස කරන්නේ ඔවුන් රහස්‍ය රැඳවුම් මධ්‍යස්ථානවල රඳවාගෙන සිටින බව සහ ඒ අනුව ඔවුන් ජීවත්ව සිටින බවයි.

**"මගේ ස්වාමිපුරුෂයා ජීවත්ව සිටින බව මම තරයේ විශ්වාස කරනවා. ඔහු හමුදාවට බාරවන බව බොහෝ පුද්ගලයන් දැක තිබෙනවා. අපේ ගමේ අය මට කිව්වෙ එල්ටීටීඊ සාමාජිකයන් හඳුනා ගැනීම පිණිස හමුදාව විසින් ඔහු රැගෙන ගිය බවයි. හමුදාවට බාරවූ අය පසුව නිදහස් කළා. ඒ නිසා මගේ ස්වාමිපුරුෂයාත් කොහේ හරි රහසිගත රැඳවුම් ස්ථානයක ජීවත්වෙනවා ඇති. ඒ විතරක් නොවෙයි ඔහු කච්චේරිය අසල සිටගෙන සිටි පිංතූරයක් පත්තරවල පළ කර තිබුණා. මට විශ්වාසයි ඔහු තවම ජීවත්ව සිටින බව."**

**-අතුරුදහන් පුද්ගලයෙකුගේ භාර්යාව -**

**"මම මගේ පුතා ගෙ සිරුර දැක්කෙ නැහැ. ඔහු මියගිය බවට කිසිම සාක්ෂියක් නැහැ. එල්ටීටීඊ සංවිධානය විසින් ආරක්ෂක හමුදාවල අය ඉන්දියාවේ රඳවාගෙන සිටින බවට කටකතාවක් මම අහල තියෙනව. මගේ පුතාත් එහි ඇති. ඔහු තවම ජීවත්ව සිටිය යුතුයි."**

**- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ මව -**

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සාමාජිකයන් හමුවීමට අදාල සන්නද්ධ හමුදාවල නියෝජිතයන් (යුද, නාවික සහ ගුවන් හමුදා) ගොස් ඔවුන් ගේ ඥාතියා (ඥාතීන්) අතුරුදහන් වීම ගැන ප්‍රවෘත්ති සපයා ඇත. එම පවුල්වලට වැඩිමනත් තොරතුරුද (ක්‍රියාන්විතයකදී හෝ ප්‍රහාරයකදී හෝ ගැටුමකදී අතුරුදහන්වීම) ඇතැම් පුද්ගලයන් සම්බන්ධයෙන් අදාල සිද්ධිය ගැන ඇසින් දුටු තොරතුරු ලබාදී ඇති හෙයින් එයින් එම අතුරුදහන්වීම සිදුවූ ආකාරය ගැන විස්තර ලැබී තිබේ. සම්මුඛ සාකච්ඡා පවත්වන ලද ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලින් සියයට පනස් හතක් (57%)ප්‍රකාශ කළේ සන්නද්ධ හමුදා අනුගමනය කළ මෙම ක්‍රියාමාර්ගයේ ප්‍රතිඵලයක් ලෙස තමන්, අතුරුදහන් වූ තම ඥාතීන් මියගොස් ඇති බව විශ්වාස කරන බවයි. මෙම නියෝජිතයන් එම පවුල් කරා පැමිණි අවස්ථාවලදී තවදුරටත් විමර්ශන කරන බවට ඔවුන් සහතිකවී ඇත. සියළුම පවුල් මෙම පිළිතුරුවලින් සම්පූර්ණයෙන්ම සෑහීමට පත්වූ බවක් මෙයින් හැඟී නොයන අතර ඇතැමුන්ට එවන් තොරතුරු ලැබීම අස්වැසිල්ලක් බව දක්නට තිබේ. හේතුව, එමගින් ඔවුන්ට ඔවුන්ගේ අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට අත්වී ඇති ඉරණම පිලිගැනීමට පහසුවක් සැලසී තිබීමයි.

එසේවූවත් සම්මුඛ සාකච්ඡා පවත්වන ලද වෙනත් අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වලින් 25% ක් විශ්වාස කරන්නේ සමහරවිට ඔවුන් ගේ ප්‍රියාදරයන් මියගොස් ඇති බවයි.

**"යුද්ධය ඉවරයි. ඔහු අතුරුදහන්වෙලා වසර ගණනාවක් ගෙවීගිහින්. ඔහු ජීවත්ව සිටිනව නම් මෙලහකට ඔහු ආපසු ඇවිත්. ඒත් මම මගේ පුතාගේ සිරුර දැක්කෙ නැහැ. තාත්තා වශයෙන් මම කොහොමද ඔහු මළා කියා විශ්වාස කරන්නෙ? ඇතැම් නිලධාරීන්ට රටින් බේරිලා පැනයාමට හැකිවූබව මම කටකතාවලින් අහල තියෙනව. ඔහුත් කොහොම හරි පලා යන්න සමත් වෙන්න ඇති."**

**- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ පියා -**

සම්මුඛ සාකච්ඡාවලට සහභාගි කරගත් මුළු පවුල් සංඛ්‍යාවෙන් 68%ක් සිතා සිටින්නේ ඔවුන්ගේ අතුරුදහන් ඥාතියා මියගිය බව හෝ ඔවුන්ට අත්වූ ඉරණම කුමක්දැයි යන්න පිළිබඳව අවිශ්වාසයෙන් පසුවන බව හා ඔවුන් ගේ ප්‍රියාදරයන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු බලධාරීන්ගෙන් තවමත් අපේක්ෂා කරන බවයි. ඔවුන් බලාපොරොත්තු වන තොරතුරුවලට අතුරුදහන් පුද්ගලයා මියගොස්ද නැත්නම් ජීවත්ව සිටීද යන්නට පිළිතුරුද අයත් වුවත් (එයටම පමනක් සීමා නොවෙයි) (19%) ඔවුන් ජීවත්ව සිටිත් නම් සිටින ස්ථානය කුමක්දැයි දැනගැනීමට එම පවුල්වලට අවශ්‍යව ඇත. අතුරුදහන් පුද්ගලයා මියගොස් ඇත්නම් අතුරුදහන්වීම සිදුවූ ආකාරය දන්වන ලෙස ඔවුහු ඉල්ලා සිටිති. 38% ක් අතුරුදහන් වූ ආකාරය විස්තර කරන ලිපිලේඛන අවශ්‍ය බව පවසන අතර 24% කට ඇසින් දුටු සාක්ෂි අවශ්‍යව තිබේ.

මෙම පවුල්වලින් 79%ට ඔවුන් ගේ ඥාතීන් ගේ මළසිරුරු පිළිබඳ තොරතුරු අවශ්‍යව ඇත. ඇතැමුන් මිනිස් මළසිරුරු ආපසු ලබා ගැනීමේ අවශ්‍යතාව ප්‍රකාශ කළ අතර සෙසු අයට අවශ්‍යව ඇත්තේ මිහිදන්කල ස්ථානය දැනගැනීමටයි.

මිනිස් මළසිරුරුවලට සැලකිලි දැක්වීම සහ කළමනාකරණය පිළිබඳ අපේක්ෂා එම පවුල්වල ආගමික සහ සංස්කෘතික පසුබිම හා බැඳී පවතී. සමහර පවුල් එම පුද්ගලයා මියගොස් ඇත්නම් මළවුන්ට බාධාකිරීම ආගමික විශ්වාසයට පටහැනි වන බැවින් මිහිදන් කල ස්ථානය දැනගැනීමට අවශ්‍ය බව ප්‍රකාශ කළ අතර අනික් අය මළ සිරුර නොමැතිව ඔවුන්ට ආගමික හෝ සංස්කෘතික වතාවත් ඉටු කළ නොහැකි නිසා මළ සිරුරු ඉල්ලා සිටියහ. මිනිස් මළසිරුරු හෝ ඒවාට අදාල තොරතුරු නොමැතිව ඇත්ත වශයෙන්ම බොහෝ පවුල්වලට අවසන් ගෞරව දැක්වීමට හෝ ආගමික වතාවත් ඉටු කිරීමට නොහැකිවී තිබේ.

ශ්‍රී ලංකාවේ කලින් පැවති ගැටුමට සම්බන්ධයක් ඇතිව අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් දහස් ගණනක් පවුල් අතුරින් සීමිත පවුල් සංඛ්‍යාවකට[38] පමණක් අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම ගැන සතුටුදායක පිළිතුරු ලැබී ඇත. අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම ගැන පිළිතුරු ලබා ගැනීමට අසමත්වීමෙන් මෙම පවුල්වල පවතින දුක්වේදනා තවත් වැඩිවෙයි. ගැටුම අවසන්වී වසර ගණනාවක් ගෙවී ගොස් ඇතත් මෙම පවුල් තවමත් එම තොරතුරු ඇසීමේ අපේක්ෂාවෙන් පසුවෙති.

[38] ICRC සතු අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ලැයිස්තුවේ දත්තවලට අනුව, වෙන්වූ, රඳවාගෙන සිටින බවට හෝ කලින් පැවති ගැටුම හා සම්බන්ධයක් ඇතිව අතුරුදහන්ව සොයනු ලබන තැනැත්තන් ගැන ලියාපදිංචි කර සිටි පවුල් 764 කට 2009 ජුනි මස 1 දා සිට, අතුරුදහන් වූ තම ඥාතීන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි යන්න සම්බන්ධයෙන් පිළිතුරු ලැබී ඇත.

## 5.2 මනෝ සමාජීය අවශ්‍යතා

මෙම පවුල්වල අවශ්‍යතා තක්සේරුව පවත්වන කාලය තුළ එම පවුල් ප්‍රකාශ කළේ ආර්ථික දුෂ්කරතාවලට පසු ඔවුන් ගේ දෙවැනි විශාලතම ගැටළුව සංවේදනාත්මක ප්‍රශ්න බවයි.

පුද්ගලයෙකුගේ මනෝ විද්‍යාත්මක දුක්වේදනාවන් එම පුද්ගලයා සමාජය සමඟ එක්වී කටයුතු කරන ආකාරයට බලපෑම් සිදුවන අතර සමාජයෙන් ඔවුන්ගේ මානසික තත්වයටද බලපෑමක් ඇතිවිය හැකිය.

සැබැවින්ම අපගේ අත්දැකීම්වල මනෝවිද්‍යාත්මක ලක්‍ෂණ (අපගේ සිතුවිලි, චිත්තවේග සහ හැසිරීම) සහ අප ජීවත්වන සමාජයෙන් අප ලබා ඇති අපගේ පුළුල් අත්දැකීම් (අපගේ සම්බන්ධතා, සම්ප්‍රදායන් සහ සංස්කෘතිය) අතර සමීප සම්බන්ධතාවක් ඇත.[39]

එහෙයින් මනෝවිද්‍යාත්මක අවශ්‍යතා යනුවෙන් දක්වන්නේ මනෝවිද්‍යාත්මක ලක්‍ෂණ සහ සමාජ, සංස්කෘතික, ආගමික සහ ආර්ථික යන සාධක සියල්ලම අදාලව පවතින සහ එකිනෙක මත රඳපවතින එම සාධක සමඟ ඒවායේ ඇති අන්තර් සම්බන්ධතා ඇතුළත් සියළුම අවශ්‍යතාවන්ය.

**"මගේ පුතා අතුරුදහන්වීමෙන් පසුව මට සිනාසෙන හැටි අමතක වුනා."**

**- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ මව -**

තමන්ගේ ප්‍රියාදරයෙකු අතුරුදහන් වීමෙන් ඇතිවන දුක්වේදනා අනෙකුත් සියළුම පාඩු සිදුවීම්වලට වඩා සුවිශේෂී වෙයි. සිදුවූ පාඩුව පැහැදිලිව පෙනෙන කාරණයක්වන මරණයට පත්වීම නිසා ප්‍රියාදරයෙකු අහිමිවීම මෙන් නොව, පුද්ගලයෙකු අතුරුදහන්වීමෙන් ඇතිවන පාඩුව සැකසහිතය. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට දිවිගෙවීමට සිදුවී ඇත්තේ බලාපොරොත්තුවෙන් සහ නෂ්ටාවපේක්‍ෂාවෙන් සහ ඔවුන් ගේ අතුරුදහන් වූ ප්‍රියාදරයන්ගේ සුභසිද්ධිය සම්බන්ධයෙන් පසුතැවිල්ලෙනි. ඔවුන්ගේ ඕනෑම තීරණයක් ගැනීමේ ක්‍රියාවලියේදී කේන්ද්‍රයේ සිටින්නේ අතුරුදහන් වූ ප්‍රියාදරයන්ය. අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වල දෛනික ජීවිතය පසුබෑමකට පත්ව ඇත. අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි නොදන්නා නිසා ඔව්හු සදාකාලිකව ශෝකාකුල තත්වයක පසුවෙති.

අතුරුදහන්වූ ඥාතීන් ජීවත්ව සිටින බවට නැගෙන සිතුවිලි සහ ඊලගට ඔවුන් මියයාමට ඇතැයි නැගෙන සිතුවිලි නිරතුරුව වෙනස්වෙමින් පවතින හෙයින් එම පවුල් සැකයෙන් දිවිගෙවන නිසා මේ තත්වයට සාර්ථකව මුහුණදී නැගී සිටීමේ ක්‍රියාවලිය පීඩාවට පත් ව තිබේ. අතුරුදහන් වූ පුද්ගලයා ගැන තොරතුරු ලබාගැනීමට ගත් ක්‍රියාමාර්ගය නිරර්ථක වූ විට එම පවුල් ඉජ්ඡාභංගත්වයට සහ අසරණභාවයට පත්වෙති. පවුල් හෙම්බත්වීමෙන් ඔවුන්ගේ දෛනික කටයුතුවලට දැඩි හානි සිදුවෙයි. සංස්කෘතික සහ ආගමික වතාවත් සාමාන්‍යයෙන් මියගිය පුද්ගලයන් උදෙසා සිදු කෙරෙන බැවින් එම පවුල්වලට අතුරුදහන් තැනැත්තන් වෙනුවෙන් ආගමික වතාවත් සංවිධානය කිරීමට සහ හඳුනා ගැනීමක් කළ නොහැකි නිසා ශෝකවීමේ නතරවීමක් වෙයි. මරණය නිල වශයෙන් සහතික කිරීමක් නොමැති නිසා නිමාවක් නැත, සෙත්පතා ආගමික වතාවත් නැත, ශෝකයට විසඳුමක් නැත.[40]

ශ්‍රී ලංකාවේ මරණය හා ආශ්‍රිත ශෝකය සහ දුක්වීම දෛනික ජීවිතයේ කොටසක් ලෙස පිළිගැනෙන අතර එය ආගමික වතාවත් පැවැත්වීමෙන් පෙන්නුම් කෙරේ. මෙම වතාවත්වලින් අදහස් කෙරෙන්නේ මියගිය තැනැත්තාට, ජීවත්වන අයට බාධකයක් ඇති නොකොට, සැනසිල්ලෙන් ආධ්‍යාත්මික ලෝකයට හෝ ඊළඟ භවයට පිටත්වීම පිණිස ආගමික විශ්වාස මත පිහිටා සෙත්පැතීමයි. අතුරුදහන් වූ ඥාතීන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි යන්න සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිතතාව හේතුකොට ගෙන එවැනි ආගමික වතාවත් පැවැත්වීමට නොහැකිවීමෙන් අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් දිග්ගැසුණු ආතතියෙන් පෙළෙති. මිනිස් මළ සිරුරු හෝ මරණය සිදුවූ දිනය සහ වේලාව නොදන්නා බැවින් සංස්කෘතික වශයෙන් සහ ආගමික වශයෙන් ඔවුන්ට පැවරී ඇති මෙම වගකීම සම්පූර්ණ කිරීමට මෙම පවුල්වලට හැකියාවක් නැත. මෙම තත්වය මගින් ඔවුන් අසරණ තත්වයට පත්කර ඔවුන්ගේ සුවපත්වීමට තවදුරටත් බාධාකරයි.

සමාජීය වශයෙන් හුදෙකලාවීමෙන් මෙම සුවපත්වීමේ ක්‍රියාවලිය තවත් තීව්‍ර කරයි. මෙම පවුල්වලින් 46%ක් සඳහන් කළේ ඔවුන් තම ප්‍රශ්න ගැන මිතුරන්, ඥාතීන් හෝ අසල්වැසියන් සමග කතා කරන්නේ ඉතා කලාතුරකින් බවත් එසේ නැත්නම් කිසිවිටෙක කතා නොකරන බවත්ය. මෙම පවුල්වල හැඟීම නම් අන්‍යයන් තමන් ගේ වේදනාව අවබෝධ කරගෙන නැති බවයි. නොනැවතී ඉදිරියට ගමන් කරන ලෙස ඔවුන්ට උපදෙස් දෙන හිතවතුන් තමන්ගේ ඥාතියා මියගිය බව සහ ආපසු නොඑන බව විශ්වාස කිරීමට ඔවුන්ව උනන්දු කරති. මෙවන් හේතු නිසා මෙම පවුල් ඔවුන්ගේ ප්‍රජාවෙන් ඔවුන් විසින්ම හුදකලාවීමට පටන් ගෙන ඇත.

**"දැන් මගේ අසල් වැසියන් මම වැන්දඹුවක් බව කියමින් මා අවමානයට ලක්කරනවා. ඔවුන් මගේ මුහුණ දකින්න කැමති නැහැ. ඔවුන් සිතන්නේ මම ඔවුන්ට දුර්භාග්‍ය ගෙනෙන බවයි."**

**- අතුරුදහන් පුද්ගලයෙකුගේ භාර්යාව -**

ඇතැම් අවස්ථාවලදී සංස්කෘතික පුරුදු නිසා හුදෙකලාවීම වැඩිකරයි. ශ්‍රී ලංකාව පුරා, සාමාන්‍යයෙන් ප්‍රජාව විසින් වැන්දඹුවන් ලෙස සලකන, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ භාර්යාවන් අසුභ සහ දුර්භාග්‍ය ගෙනෙන පිරිසක් ලෙස දකින හෙයින් ඔවුහු සංස්කෘතික බාධකවලට මුහුණදෙති. ඔවුන්ට ශුභ සංස්කෘතික සහ ආගමික උත්සවවලට සහභාගිවීමට අවසර නැත. මෙම තත්වය විශේෂයෙන් රටේ ග්‍රාමීය ප්‍රදේශවල දක්නට ඇත. බිරින්දෑවරුන් පොදුවේ වාර්තා කළ දෙයක් වන්නේ ඔවුන්ගේ ප්‍රජාවන්හිදී ඔවුන්ගේ චරිතය[41] ගැන සැකකරන බව සහ ඔවුන්ගේ හොඳනම කැළැල් කිරීමට කටකතා පතුරවන බවයි.[42] ඔවුන් ගේ ප්‍රියාදරයන් අතුරුදහන් වූ පසු තමන් අවමානයට ලක්කිරීම් සහ තමන්ට වෙනස් කොට සැලකීම් සිදුවන බව මෙම පවුල්වලින් 15%ක් පැවසූහ.

[39] මනෝ සමාජීය ක්‍රියාකාරී කණ්ඩායම, 2003 පිටුව 1

[40] Boss, P. (1999). Ambiguous loss: learning to live with unresolved grief. Cambridge: Harvard University. Paperback reprint in 2000.

[41] යම් පුද්ගලයෙකුගේ මානසික සහ ආචාරධර්ම ගතිලක්‍ෂණ අඟවන අකුරු ලක්‍ෂණ

[42] අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සමහර භාර්යාවෝ තමන්ගේ ප්‍රජාවන් ඔවුන් දකින්නේ දුරාචාරවත් හෝ "දුරාචාරවත් චරිතයක් ඇති", එහි ප්‍රතිඵලයක් වශයෙන් "ලිංගිකව කැමැත්තෙන් පසුවන සහ ප්‍රයෝජනය පිණිස සිටින අය වශයෙන් බව ප්‍රකාශ කරති.

**"මම මංගල උත්සව වලට යන්නෙ නැහැ. මම හොඳට ඇඳ-පැලඳගෙන එම ස්ථානයට ගියහම මිනිසුන් පවසන්නෙ මම සතුටින් ඉන්න බවක් පේනවා කියලා. මගේ ස්වාමියා අතුරුදහන් වුනාට මට කිසිම පාඩුවක්, කණගාටුවක් නැති බවයි." ඔවුන් සිතන්නේ**

**- අතුරුදහන් පුද්ගලයෙකුගේ භාර්යාව -**

එදිනෙදා ඔවුන් මුහුණපාන ආතතිය සමග මෙය තවත් සංකීර්ණවෙයි. පවුලේ ආදායම් උපයන්නා අතුරුදහන්වීමෙන් මෙම පවුල් මුහුණපාන ආර්ථික ගැටළු නිසා[43] ඔවුන්ට තමන්ගේ ප්‍රියාදරයා තමන් සමග සිටියේ නම් තමන්ගේ ජීවිතය කෙසේ වියහැකිව තිබුණේදැයි යළි සිතීමට සිදුවී ඇත. අතුරුදහන් වූ පුද්ගලයා ගැන පැහැදිලි නෛතික තත්වයක් නොමැති හේතුව නිසා ඔවුන් මුහුණපාන පරිපාලන අභියෝග විසින් ඔවුන් මරණ සහතිකයක් ලබාගැනීමට අයදුම් නොකළහොත් ඔවුන්ගේ දිවිපෙවත ඇණ සිටින තත්වයකට පත්කරයි.[44] මරණ සහතිකයක් ලබාගැනීමට අයදුම් කිරීම ඔවුන්ගේ අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට ද්‍රෝහිවීමක් ලෙස පිලිගැනේ. දරුවන් හදාවඩා ගැනීම සහ ඔවුන්ගේ පියා යම් දිනක ආපසු පැමිණේයැයි ප්‍රකාශ කිරීමෙන්, කාන්තාවෝ ඔහුගේ පැමිණ සිටීම අවශ්‍ය වන සහ අහිමි වන සෑම අවස්ථාවකදීම නිහඬව කඳුළු බොති.


**"මගේ ස්වාමිපුරුෂයා අතුරුදහන් වන විට මම තුන් මසක ගැබිනියක්. මාත් මගේ ස්වාමිපුරුෂයාත් එකට සිටගෙන ගත් ඡායාරූපයකට මම මගේ පුතාගේ පිංතූරය ඩිජිටල් තාක්ෂණයෙන් එකතු කර ගෙන තියෙනව. ඒ නිසා මගේ පුතාට "පවුලේ ඡායාරූපය" පාසලට ගෙනයන්න පුළුවන් . ඒත් සත්‍ය නම් මගේ පුතා ඔහුගේ පියා හැබැහින් දැකල නැහැ. කවදාවත් දකින්න නොලැබෙන්නත් හැකිය."**

**- අතුරුදහන් පුද්ගලයෙකුගේ බිරිඳ -**

මෙම විෂය[45] සම්බන්ධයෙන් ඇති ප්‍රකාශන වල කරුණු දක්වා ඇති පරිදි, පුද්ගලයන්ගේ සැකසහිත අහිමිවීම මඟින් ඇතිවන මානසික රෝග සාංකාව, දොම්නස සහ දෛනික තත්වයන් හේතුවෙන් පුද්ගලයෙකු මත්ද්‍රව්‍ය අපහරණයට, ප්‍රචණ්ඩත්වයට සහ දිවි නසා ගැනීමට යොමුවීමට හැකිය. මානසික ව්‍යාකූලත්ව සිදුවීම්වලින් පසුව ඇතිවන ඒවා හා සමානව මෙම මානසික රෝග පශ්චාත් ගැටුම් පරිසරයන්හි දක්නට ඇති පොදු මානසික රෝග තත්ත්වයන්ය. මෙම තක්සේරුව මඟින් මෙම සියළු ප්‍රතිඵල ගණන් බලා නැත. එය වඩාත් පොදු මානසික රෝග ප්‍රශ්න වන සාංකාව සහ දොම්නස යන දෙඅංශයට සීමා කෙරිණ.

සම්මුඛ සාකච්ඡා පැවැත්වූ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් අතර පශ්චාත් මානසික ව්‍යාකූලත්ව ආතතිය ගැන පරීක්ෂාවක් කරන ලදී. නියැදියෙන් 51% ක් පමණ සැලකියයුතු අන්දමින් සාංකාවේ ලක්‍ෂණවලින් පෙලෙන බවත් 58%ක් පමණ දොම්නසින් සහ 15%ක ගේ පශ්චාත් චිත්ත කම්පනයෙන් පෙලෙන ලක්‍ෂණ ඇති බවත් පෙන්නුම් කෙරිණ. සෙසු පවුල් සමඟ සැසඳීමේදී ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල මෙම රෝග ලක්‍ෂණ අඩුය.

**ප්‍රස්තාරය 8: ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සහ වෙනත් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් අනුපාතය**




මෙය සාධක කිහිපයකින් විස්තර කිරීමට හැකියාව ඇත. ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට, තොරතුරු ලබාගත හැකි විශ්වාසදායක මූලාශ්‍ර ලෙස තමන් හමුවන, අදාල බලධාරීන්ගෙන් තමන්ගේ අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට අත්වී ඇති ඉරණම ගැන යම් ආකාරයක පිළිතුරක් ලැ බී තිබේ. වැටුප සහ විශ්‍රාම වැටුප ඔවුන්ට ලැබෙන හෙයින් බොහෝ දෙනෙකුට ආර්ථික අමාරුකම් සම්බන්ධයෙන් දෛනිකව අරගලයක යෙදීමේ අවශ්‍යතාවක් නැත. පොදුවේ ඔවුන්ගේ ප්‍රජාවන් ඔවුන්ට විරුවන්ගේ පවුල් ලෙස ගෞරවයෙන් සලකනු ලබති.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සෙසු පවුල්වලට තොරතුරු ලබාගත හැකි විශ්වාසදායක ලෙස ඔවුන් පිළිගනු ලබන මූලාශ්‍රවලින් පිළිතුරු ලැබී නැත. ඔවුන්ට, ඔවුන් ගේ ප්‍රජාවන් උපකාර නොකරන නිසා දෛනික පදනමින් ඔවුහු ආර්ථික දුෂ්කරතාවලින් පෙලෙති.

**"මගේ ස්වාමිපුරුෂයා නොමැතිව මෙහේ දිවිගෙවීම වෘකයන් මැද බැටළුවෙකු ගෙවන දිවියට සමානයි."**

**- අතුරුදහන් පුද්ගලයෙකුගේ බිරිඳ -**


[43] පවුල්වල ආර්ථික අවශ්‍යතා පිළිබඳ වගන්තියට යොමුවන්න.

[44] පවුල්වල නෛතික සහ පරිපාලන අවශ්‍යතා පිළිබඳ වගන්තියට යොමුවන්න.

[45] Boss, P. (2006). Loss, Trauma and Resilience: Therapeutic work with Ambiguous Loss, W.W. Norton Company, INC, ISBN: 978-0-393-70449-5.

මීට පෙර පවත්වා ඇති ගෝලීය අධ්‍යයනවලින් පෙනී ගොස් ඇත්තේ දුප්පත්කම සහ ආර්ථික ආතතිය යන කරුණු සාංකාව සහ දොම්නස වැනි[46] පොදු මානසික සෞඛ්‍ය ප්‍රශ්නවලට බලපාන වැදගත් අවදානම් සාධක බවයි. මානසික ආබාධ ඇති තැනැත්තන් විස්තර කොට ඇත්තේ දිළිඳුකම සහ සමාජ ආර්ථික ගැටළු සංවේදනාත්මක ආතතිය ඇති කරන වඩාත් වැදගත් සාධකවලින් එකක් බවයි.[47,48] මෙම තක්සේරුවේදී සම්මුඛ සාකච්ඡා පවත්වන ලද මුළු පවුල් සංඛ්‍යාවෙන් 56% ක් තමන්ට ආර්ථික දුෂ්කරතා ඇති බව පැවසූහ. මෙයින් 86%ක් පොදු සෞඛ්‍ය ගැටළුවල ඉහල මට්ටමේ මානසික රෝග ලක්‍ෂණ පෙන්නුම් කළහ. (සාංකාව හෝ දොම්නස) මෙයින් පෙනීයන්නේ ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල ආර්ථික ප්‍රශ්න සහ මානසික සෞඛ්‍ය අතර ඉහල සහසම්බන්ධයක් ඇති බවයි.

**ප්‍රස්තාරය 9: ආර්ථික දුෂ්කරතා සහ මානසික සෞඛ්‍ය ගැටළු අතර සහසම්බන්ධතාවය**




තවද අතුරුදහන් වූ පුද්ගලයන්ගේ භාර්යාවෝ පීඩාකාරී දුරකථන ඇමතුම් ලැබීම සහ තමන් ආරක්‍ෂක හමුදා සාමාජිකයන් බව පවසන පුද්ගලයන් හෝ තමන්ගේ ගමේ වෙනත් පිරිමින් අවේලාවන්හිදී කලින් නොදන්වා පැමිණීම සම්බන්ධයෙන් කනස්සල්ලෙන් අදහස් පළකළහ. පවුලේ වැඩිහිටි පිරිමියෙකු නොමැති හෙයින් කාන්තාවන් පීඩාවන්ට හා අතවරවලට ලක්වීමේ අවදානමට පත්ව සිටිති. විශේෂයෙන් එල්ටීටීඊය සමග සම්බන්ධතා ඇතැයි සැක කරන පවුල් නිරතුරුව දැඩි පරීක්‍ෂාවට ලක්වන බවත් එමගින් ඔවුන් ගේ ආරක්‍ෂාව සම්බන්ධයෙන් අතිරේක බියක් ඇතිකරන බවත් ප්‍රකාශ කොට ඇත.[49]

මානසික සෞඛ්‍ය ගැටළු විද්‍යාමාන වුවද, සැකසහිත නැතිවීම පිළිබඳ ප්‍රකාශන වල සඳහන් වන්නේ මෙම විද්‍යාමානවීම් මානසික ගැටළුවකට වඩා සමාජීය හා සම්බන්ධතා පිළිබඳ දුෂ්කරතාවක් ලෙස අවබෝධ කරගත යුතු බවයි. ඒවා මනසෙහි ඇතිවන ගැටළුවකින් විකාශය නොවන අතර එහි මූලාරම්භය ඇත්තේ ආතතිය සහ සැකය චිරස්ථායි කරන බාහිර සිදුවීමක බවයි.[50]

> **"මම උපදේශන සේවාවක් ලබා ගැනීමට ගියහොත් අසල්වාසීන් මා මානසික ලෙඩෙක් කියා කියාවි."**
>
> **- අතුරුදහන් පුද්ගලයෙකුගේ බිරිඳ -**

> **"මා මානසික ලෙඩෙක් නොවේ. මට සිදුවී ඇත්තේ මගේ පුතා නැතිවීම පමණයි."**
>
> **- අතුරුදහන් පුද්ගලයෙකුගේ පියා -**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මානසික සෞඛ්‍ය සත්කාර සේවා සැපයීමට දිවයිනපුරා වෛද්‍ය නිලධාරීන් සහ විශේෂඥ මනෝ චිකිත්සකයන් පත් කරසිටිති. බොහෝ දිස්ත්‍රික්කවල මහ රෝහල් වල මානසික සෞඛ්‍ය ඒකකයක් මෙන්ම පර්යන්ත සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානවල නිතිපතා සායන ක්‍රියාත්මකයි. සෞඛ්‍ය, සමාජ සවිබලගැන්වීම් සහ සුබසාධන අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික්ක හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සේවය කිරීමට උපදේශන නිලධාරීන් 200 දෙනෙකු පත් කොට ඇත. තවත් අතිරේක තනතුරු 150 ක් පමණ පුරප්පාඩුව පවතී. වනිතා කටයුතු අමාත්‍යාංශය රටේ දිස්ත්‍රික්ක හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සේවය කිරීමට උපදේශන සහකාර නිලධාරීන් 200 දෙනෙකු පත් කොට ඇත.

මෙයට අමතර වශයෙන් රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් මනෝසමාජීය මැදිහත්වීම් ක්‍රියාත්මක කරති. එම වැඩසටහන් සාමාන්‍යයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කීපයකට සීමා වුවත් විශාල ලෙස ප්‍රජාව වෙත ළඟාවීමක් පෙන්නුම් කරන අතර උතුරු නැගෙනහිර ප්‍රදේශවල එම වැඩසටහන් වලට වැඩි පිළිගැනීමක් දක්නට ඇත.

කෙසේවෙතත් විශාල මානව සම්පත් හිඟයක් විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත්වල දක්නට ඇත. උදාහරණයක් දක්වන්නේ නම් සෞඛ්‍ය, සමාජ සවිබලගැන්වීම් සහ සුභසාධන අමාත්‍යාංශයට වව්නියාවේ සිටින්නේ එක් උපදේශන නිලධාරියෙකු පමණි. ඔහුට ආවරණය කිරීමට ඇති ජනසංඛ්‍යාව 177,000 කි. මන්නාරමේ එම තනතුර දරන නිලධාරියාට 103,000 ක ජනසංඛ්‍යාවක් ආවරණය කිරීමට ඇත. මෙම පරතරය නිසා මෙම නිළධරයන්ට සිය නිළ රාජකාරි ඉටු කිරීමේදී අවධානය යොමු කිරීමට හැකි පුද්ගලයන් සංඛ්‍යාව සීමා කිරීමට සිදුවන නිසා ආවරණයේ බරපතල පරතරයන් ප්‍රජාව මට්මේදී ඇතිවන බව වාර්තාවෙයි.

තනිපුද්ගල උපදේශනයේදී යොදා ගන්නා මැදිහත්වීමේ ප්‍රවේශය බොහෝ අවස්ථාවලදී සවන්දීම සහ උපදෙස් වලින් සමන්විතය. පුද්ගලයන්ට තනිව උපදෙස් දීමේ ප්‍රවේශයෙන් විශාල පුද්ගලයන් පිරිසක් කරා ළඟාවීම අතින් බරපතල පරතරයන් ඇති කරයි. මනෝසමාජීය සුබසෙත සහ මානසික සෞඛ්‍යය නිවාරණය සහ ප්‍රවර්ධනය ඉලක්කකොට ගත් මැදිහත්වීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් දක්වා නැත.

> **"ඔවුන් මාව අවබෝධ කරගන්නෙ නැහැ. මේ සේරම අවස්ථාවලින් පසුව ඔවුන් මට පවසන්නේ මගේ ස්වාමිපුරුෂයා මියයන්නට ඇති බවත් තවමත් තරුණවියේ පසුවන මම නැවත විවාහයක් කර ගතයුතු බවත්ය."**
>
> **- අතුරුදහන් පුද්ගලයෙකුගේ බිරිඳ -**

[46] Patel V, Kleinman A. Poverty and common mental disorders in developing countries. Bulletin World Health Organisation 2003.
[47] Patel V, Pereira J, Mann A. Somatic and psychological models of common mental disorders in India. Psychological Medicine 1998; 28:135-43.
[48] Aidoo M, Harpham T. The exploratory models of mental health amongst low-income women and health care practitioners in Lusaka, Zambia. Health Policy and Planning 2001; 16:206-13.
[49] වැඩි විස්තර සඳහා 7.7 ඡේදය බලන්න.
[50] Boss, P. (1999). Ambiguous loss: learning to live with unresolved grief. Cambridge: Harvard University. Paperback reprint in 2000; Boss, P. (2006). Loss, Trauma and Resilience: Therapeutic work with Ambiguous Loss, W.W. Norton Company, INC, ISBN: 978-0-393-70449-5.

තාක්ෂණික වශයෙන් බලනවිට මෙම පුද්ගලයන් රැකියාවෙහි නියුක්ත කිරීමට පෙර ලබන පුහුණුවේදී සැමවිටම ප්‍රායෝගික කුසලතා කෙරෙහි අවධානය යොමු කර නැත. ක්ෂේත්‍රයේ සේවයෙහි යෙදෙන පුද්ගලයන්ට අඛණ්ඩව පුහුණු ලබාදෙන ක්‍රමයක් නැති අතර තාක්ෂණික අධීක්ෂණයක් සිදුනොවේ. සංකීර්ණ සිද්ධි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අවශ්‍යකරන කුසලතා සහ සහයෝගය ලබාදීමේ අඩුව නිසා ඇතිවන ප්‍රතිඵලය වන්නේ පෞද්ගලිකව සම්පූර්ණයෙන්ම තමන් යටපත් වීමක් සහ අධෛර්යට පත්වීම සහ බොහෝ විට සපයන සේවාවන්වල ගුණාත්මක භාවයට හානි ගෙනදීමයි. මෙම පුද්ගලයන්ගෙන් බහුතරය ඉලක්ක කොටගත් ප්‍රතිලාභියා කේන්ද්‍රකොට ගත් උපදේශන ප්‍රවේශය පාවිච්චි කිරීමකට වඩා පහසු විසඳුම වන උපදෙස්දීමට නැඹුරුවන බවක් පෙන්නුම් කරයි. ඔවුන් මූලික මානසික සෞඛ්‍ය ප්‍රශ්නවලට දිශානතවී ඇති නමුත් බොහෝවිට සාමාන්‍යයෙන් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් මුහුණපාන සැකසහිත අතුරුදහන්වීම ගැන ඔවුන්ට දැනුමක් නැත. අතුරුදහන් වූ ඥාතින් හට අත්වී ඇති ඉරණම කුමක්දැයි පැහැදිලිව දැනගැනීමක් නැතිව සිටින විට එම පවුල්වලට ස්වකීය ඥාතීන් මියගිය බව පිළිගනිමින් ඔවුන්ගේ දිවිපෙවත ඉදිරියට පවත්වාගෙන යන ලෙස උපදෙස්දීම තාක්ෂණ වශයෙන් සදොස් මෙන්ම සදාචාර සම්පන්නද නොවේ.

ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට උපදේශන සේවා ලබාගැනීමට අවශ්‍ය නැත. ප්‍රජාවන්හිදී උපදේශන සේවය ගැන සිතන්නේ එය මානසික රෝගවලට සම්බන්ධ දෙයක් ලෙසය. තමන් මානසික වශයෙන් රෝගී බව හඳුනා නොගන්නා එම පවුල් තමන්ගේ දුක්වේදනා පිලිගැනීමක් අපේක්ෂා කරති. උපදේශනය තමන්ට ප්‍රයෝජනවත් විය හැකියැයි ප්‍රකාශ කළේ සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ 395 දෙනා ගෙන් දෙදෙනෙකු පමණි. එම පවුල්වලින් සියයට හැත්තෑවක් පැවසුවේ තම ප්‍රශ්නය තේරුම් ගන්නා වෙනත් පුද්ගලයන් සමඟ තමන්ගේ අතුරුදහන් වූ ඥාතීන් සම්බන්ධයෙන් කතා කිරීමට තමන් කැමති බවයි. තමන්ගේ අතුරුදහන් වූ ඥාතීන් අනුස්මරණය කිරීමට කණ්ඩායම් ලෙස පවත්වන අනුස්මරණ අවස්ථාවන්ට සහභාගිවීමට තමන් කැමති බව මෙම පවුල්වලින් 75% ක් පැවසූහ.

# 5.3 ආර්ථික අවශ්‍යතා

තමන්ට වර්තමානයේ වඩාත් පීඩාකාරි ලෙස බලපාන්නේ ආර්ථික දුෂ්කරතා බව සම්මුඛ සාකච්ඡාලට සහභාගි කරගත් මුළු පවුල් සංඛ්‍යාවෙන් 56% ක් පැවසූහ.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සඳහන් කළේ මෙම ගැටුම නිසා විපාක රැසකට තමන් මුහුණදී සිටින බවයි. මෙම විපාකවලින් ඔවුන්ගේ පවුලේ ආදායම් උපයන්නා අහිමිවීම, අවතැන්වීම සහ/හෝ ඔවුන්ගේ දේපළ විනාශවීම, ව්‍යාපාරවලට විශාල ලෙස හානිවීම/වසාදැමීම මෙන්ම අතුරුදහන් වූ පුද්ගලයන් සෙවීමට දරන උත්සාහය වෙනුවෙන් විශාල මුදලක් වැයකිරීමට සිදුවීම වැනි දේවල් තම ආර්ථික තත්වයට පුළුල් වශයෙන් බලපෑ බව ඔව්හු ප්‍රකාශ කළහ.

පෙර පරිච්ඡේදවල සඳහන් කළ පරිදි සැලකිල්ලට ලක්කෙරුණු නියැදියේ අතුරුදහන් වූ පුද්ගලයන්ගෙන් 93% ක් පිරිමිය. ඔවුන්ගෙන් බහුතරය අතුරුදහන් වන අවස්ථාවේදී අවුරුදු 15 ත් 30 ත් අතර වයසේ පසුවූ සිය දිවියෙහි ක්‍රියාකාරි කාලය ගත කළ අයවූහ. එම පවුල් ප්‍රකාශ කළ පරිදි ඔවුන්ගෙන් 63% ක් පවුලේ ප්‍රධාන ආදායම් ඉපයුම්කරුවෝය. මෙයින් බොහෝ තරුණ පිරිමි උදවිය කෙරෙහි ඔවුන්ගේ පවුල් විශ්වාසය තබා තිබුණේ ඔවුන් අනාගතයේ පවුලේ ප්‍රධාන ආදායම් ඉපයුම්කරුවකු වන බවටය.

> **"මගේ පුතා අද සිටියා නම් ඔහුට අපව රැකබලා ගන්න තිබුණා. මගේ ස්වාමිපුරුෂයාගේ දැන් වයස අවුරුදු 65 යි. ඒත් පවුල නඩත්තු කරන්න ඔහුට වැඩක් කිරීමට සිද්ධ වෙලා."**
>
> **- අතුරුදහන් වූ පුද්ගලයෙකු ගේ මව -**

අතුරුදහන්ව සිටින පුද්ගලයන්ගෙන් 41%ක් අතුරුදහන් වන අවස්ථාව වන විට විවාහ වී සිටි බව දත්තවලින් පෙන්නුම් කෙරේ. සම්මුඛ සාකච්ඡා පවත්වන ලද භාර්යාවන්ගෙන් 97%ක් සනාථ කළේ ඔවුන් ගේ ස්වාමිපුරුෂයන් ඔවුන්ගේ පවුල්වල ප්‍රධාන ආදායම් උපයන්නන් වූ බවයි. ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් අතුරුදහන්වීමෙන් පසුව භාර්යාවන්ගෙන් 49%කට පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නන්ගේ කාර්ය ඉටුකිරීමට සිදුවී ඇති බව ඔව්හු වාර්තා කළහ. අතුරුදහන් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ගේ භාර්යාවන් පමණක් සැලකිල්ලට ගතහොත් මෙම අනුපාතය 4.5% ක් දක්වා පහල බසී. මෙයින් පැහැදිලිවන සත්‍යය නම් අතුරුදහන් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ගේ භාර්යාවන්ට ස්වකීය ස්වාමිපුරුෂයන්ගේ වැටුප සහ විශ්‍රාම වැටුප මාසිකව ලැබෙන බවයි. එහෙයින් පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා නොමැති වූවත් එම පවුල් මාසික ආදායමක් ලබති.

ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ගේ භාර්යාවන්ට එසේ වූවත් අනික් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ භාර්යාවෝ කලින් ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් දැරූ සියලු වගකීම් භාරගෙන සිටිති. ඔවුන්ගේ ස්වාමිපුරුෂයන් හෝ පුතුන් මත යැපෙමින් සිටි පවුල් මෙම අතුරුදහන්වීම නිසා දැන් තනිව අරගලයක යෙදී සිටිති. මෙම පවුල් විශේෂයෙන් කාන්තාවන් මුහුණපා ඇති භෞතික ප්‍රශ්න විවිධය. එනම් මුදල් දුෂ්කරතා, ඔවුන්ගේ දරුවන් හදාවඩා ගැනීම, එම දරුවන්ට අධ්‍යාපනය ලබාදීම, (ප්‍රතිපත්තියක් වශයෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නොමිලයේ ලබාදුන්නත් පාසල් පහසුකම් ගාස්තු, අමතර පංති සහ පොත් මිලදී ගැනීම ආදී සැඟවුන වියදම් දැරීමට ඇත) පවුල පවත්වා ගෙනයාමේ කටයුතු ඉටුකර ගැනීමේ අමාරුකම්, දරුවන් නොමැති වයෝවෘද්ධ තැනැත්තන්ට මුදල් වියදම් දැරීම හෝ කාරුණිකව රැකබලාගැනීමට කිසිවකු නොමැතිවීමේ දුෂ්කරතා ඇත.

සම්මුඛ සාකච්ඡා පවත්වන ලද පවුල්වලට අනුව ප්‍රජාවන් තුළ සාම්ප්‍රදායිකව පැවති ඔවුනොවුන්ට ආධාර කරගැනීමේ යාන්ත්‍රණ පමණක් නොව පවුල්වල තිබූ එවැනි ක්‍රමද ගැටුම නිසා නැතිව ගොස් ඇත. තමන්ගේ පවුල විසින්ම නෙරපීම් කරන බවට පැමිණිලි කරන බොහෝ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ භාර්යාවන් ICRC ට හමුවී ඇත. මෙවැනි කාන්තාවන්ගෙන් බහුතරයකට බොහෝදුරට අධ්‍යාපනයක් නොමැති නිසා නුපුහුණු කාණ්ඩයට වැටෙන හෙයින් වාසිසහගත රැකියාවක යෙදීමට හැකි තත්වයක නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ කාන්තාවෝ අනියම් කම්කරුවන් ලෙස සේවය කරමින් ඔවුන්ගේ පවුල් නඩත්තු කරගැනීමට දෛනික ආදායමක් මත රැඳිසිටිති.

> **"මගේ ස්වාමිපුරුෂයා අතුරුදහන් වූ පසු ඔහු සොයා ගැනීමට මට විශාල මුදලක් වැය කිරීමට සිදුවුනා. අපේ පවුලේ මුදල් උපයන කිසිවෙක් සිටියේ නැහැ. මට මගේ පවුලට මුදලින් ආධාර කිරීමට හැකියාවක් තිබුණෙ නැහැ. ආර්ථික තත්වය කොතරම් කරදරදැයි කිවහොත් මට මගේ ළමයින් ඉගෙන ගන්න පාසල් යවන්නවත් මුදල් නැතිවුනා."**
>
> **- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ භාර්යාව -**

ක්‍රියාත්මක රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන්ගේ භාර්යාවන් නොවන, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ භාර්යාවෝ කිහිප දෙනෙක් තමන්ට වන්දි ලැබුණ බව වාර්තා කළහ. ඔවුන් වාර්තාකලේ ලැබෙන මුදල රුපියල් 25,000 සිට රුපියල් 100,000 දක්වා වෙනස්වීම් ඇති අතර එම ගණන රඳ පවතින්නේ වන්දිය ඉල්ලූ අවස්ථාවේදී පැවති ප්‍රතිපත්තිය මතය. මෙම වන්දි ක්‍රමය සඳහා වන ප්‍රවේශය මරණ සහතිකයක් පිළිගැනීම සමඟ සම්බන්ධ කර ඇතිබව වාර්තාවෙයි. එම පවුල් ප්‍රකාශ කළේ අතුරුදහන් වූ පුද්ගලයා මියගොස් ඇති බව තමන් විශ්වාස නොකළත්, ආර්ථික දුෂ්කරතා නිසා වන්දි ඉල්ලා සිටීම පිණිස මරණ සහතිකය පිළිගත් බවයි.


මෙයට අතිරේකව "වන්දිය" යන වචනය බොහෝ පවුල් අපහසුතාවයට පත්කර ඇති අතර ඇතැමුන් අතුරුදහන් වූ පුද්ගලයාගේ නාමයෙන් වන්දිය පිළිගැනීම ප්‍රතික්ෂේප කර ඇත. ඇතැම් පවුල් සඳහන් කළේ බලධාරීන් විසින් ගෙවනු ලබන වන්දිය බාර ගත හොත් එයින් අතුරුදහන් වූ ඥාතියා පිළිබඳ කටයුත්ත අවසන් කිරීමට එකඟතාවයක් ගම්‍යවන බවත් එමනිසා එම කටයුත්ත අවසන් කොට ඔවුන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි යන ප්‍රශ්නවලට පිළිතුර සොයාගැනීමේ ක්‍රියාවලිය අත්හැරදැමීමක් සිදුවේය යන බියක් ඔවුන් තුළ පවතින බවයි. සෙසු පවුල් ප්‍රකාශ කළේ ඔවුන්ගේ අතුරුදහන් වූ ඥාතීන් පිළිබඳ කටයුත්ත අවසන් කිරීම කෙරෙහි මෙයින් බලපෑමක් ඇති නොවන්නේ නම් සහ හුදෙක් තමන්ගේ දුක්වේදනා පළකිරීම පිළිගැනීමක් වශයෙන් පමණක්ම ඔවුන් ගේ ආර්ථික අභියෝග ආමන්ත්‍රණය කරගැනීම පිණිස ආධාරයක් හෝ ප්‍රදානයක් භාරගැනීමට තමන් කැමති බවයි.

වන්දිවලින් ඔබ්බට යන විට පවුලේ වත්කම් (ඉඩම්, බැංකු ගිණුම්, රක්ෂණ හිමිකම් ඉල්ලීම් ආදිය) නිළ වශයෙන් අතුරුදහන් වූ පුද්ගලයාගේ නමින් ලියාපදිංචි කොට ඇති විට පවුලේ එම වත්කම් කළමනාකරණයේදී ඔවුන් තවත් මට්ටමක ප්‍රශ්නවලට මුහුණපාන බව මෙම පවුල් පැවසූහ.

දැනට බලපැවැත්වෙන සමාජ ආරක්ෂණ ප්‍රතිලාභවලින් පවුල් වලින් තුනකින් එකකම පාහේ මුදල් අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය නොකරන බව මෙම තක්සේරුව පෙන්නුම් කර ඇත. විශේෂයෙන් පවුලක මූලික වියදම ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතා රේඛාව වන මසකට එක් පුද්ගලයෙකුට රුපියල් 3838 ට වඩා පහල බැස ඇති විට මෙය දක්නට ඇත.[51]

ප්‍රතිපත්තියක් වශයෙන් මාසික සමෘද්ධි දීමනාවෙන් දුප්පත්ම පවුල්වලට රජයේ නිත්‍ය සමාජ සහන රාමුවේ අත්‍යවශ්‍ය ආධාර ලබාගැනීමට ඉඩසලසා ඇති නමුත් එවැනි දීමනා ලබාගැනීම පිණිස පුද්ගලයෙකුට දීර්ඝ ක්‍රියාවලියක යෙදීමට සිදුවන බව ප්‍රකට කරුණකි. මෙම මාසික දීමනාවට ඉතා සුළු මුදලක් (උපරිමය ශ්‍රී ලංකා රුපියල් 3000 ක්) ඇතුළත් වන අතර ඌන පුරනයක් ලෙස වයෝවෘද්ධ සහ විවිධ ආබාධ සහිත තැනැත්තන්ට මසකට රුපියල් 250 සිට රුපියල් 750 දක්වා දීමනාවක් ගෙවන බව පවුල් සඳහන් කළහ. එහෙත් එය පවුලක් නඩත්තු කිරීමට ප්‍රමාණවත් නොවේ.

ප්‍රස්තාරය 10: පුද්ගලයෙකුගේ මසක ආදායම් සාමාන්‍යය




ගතවූ වසර ගණනාව මුළුල්ලේ රාජ්‍ය සහ රාජ්‍යනොවන සේවා රැසක් උතුරේ සහ නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් සහ වඩාත් පීඩාවට ගොදුරුවූ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කරමින් තිබේ. දැනට ක්‍රියාත්මක වැඩසටහන් පොදුවේ ඉලක්කකොට ඇත්තේ, වෙනත් අය අතර, ආබාධ සහිත තැනැත්තන්, පුනරුත්ථාපනය කරන ලද පුද්ගලයන්, කාන්තාවන් ගෘහමූලිකත්වය දරන පවුල් සහ අවතැන් ජනතාවයි. ඇතැම් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට ඉහත සඳහන් කළ කාණ්ඩ යටතේ දැනට ක්‍රියාත්මක වැඩසටහන්වලින් ප්‍රතිලාභ ලැබී ඇති නමුත් ඒවා ලැබී ඇත්තේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් වශයෙන් නොවේ. මීට අමතරව තමන්ට හිමි ප්‍රතිලාභ පිළබඳව තොරතුරු මෙන්ම එම සේවා ලබා ගැනීම සඳහා ඔවුන් අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය ගැන ප්‍රමාණවත් තරම් තොරතුරුද ඔවුන් සතුව නැත.

සම්මුඛ සාකච්ඡා පවත්වන ලද අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලින් බොහෝ පවුල් ප්‍රකාශ කළේ ඔවුන් ණයගැති බවයි. (60%) ඇතැම් පවුල් සඳහන් කළේ ඔවුන් තමන්ගේ නිවාස ඉදිකරගැනීමට ණය ලබාගෙන ඇති බව, නිවාස යෝජනා ක්‍රමයට දායක මුදල් ගෙවන බව[52], හෝ ළමයින් වෙනුවෙන් අතිරේක අධ්‍යාපන වියදම්[53] දරන බවයි. තවත් අය තමන්ගේ පවුලේ ආදායම දෛනික වියදම් පිරිමසා ගැනීමට ප්‍රමාණවත් නොවන නිසා දැඩි ලෙස ණයගැතියන්වී ඇති බව වාර්තා කලහ. අතුරුදහන් වූ පුද්ගලයා ගැන තොරතුරු සොයා ගැනීමේ අදහසින් සාස්තරකරුවන්ට ගෙවීමටද මෙම පවුල් විශාල මුදලක් වැය කර ඇත. තොරතුරු ලබාදීමට යයි පවසා මුදල් ඉල්ලා සිටින අවස්ථාවලදී ඔවුන් වංචනික ලෙස මුදල් ලබාගන්නා අයට හසුවන අවස්ථාද ඇත. මෙවැනි සාධක ගණනාවක් ඔවුන්ගේ වත්මන් මුදල් තත්වය වඩාත් නරක අතට හැරවීමට දායකවී ඇත. ස්ථිර ආදායම් මාර්ගයක් සහ/හෝ රැකියාවක් නොමැති කම මෙම පවුල්වල ණය උගුලට තවත් බරක් එකතුකර තිබේ. තක්සේරුව පවත්වන අවස්ථාවේදී පවුල්වලින් 12%කට පමණක් තිරසර මාසික ආදායමක් සමඟින් විධිමත් සේවානියුක්තියක් තිබුණි. (එනම් ශ්‍රී ලංකා රුපියල් 15,000 වැඩි) එසේවුවත් 56%ක් සේවාවියුක්තියෙන් පසුවූහ.

අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්, වෙනත් බොහෝ පවුල් මෙන්, ණය උගුලකට මඟපාදන කෙටිකාලීන සහ දිගුකාලීන විපාක ගැන නොතකා ඉහළ පොලී අනුපාතවලට ණය ලබාගෙන තිබුණු බව මෙම තක්සේරුවෙන් අනාවරණය විය. මෙම පවුල් දිගුකාලීන ණය ගොහොරුවක එරී සිටි අතර ඔවුන්ට එම ණය ආපසු ගෙවීමට නොහැකිවීමෙන් ඔවුන් අවසානයේදී එයින් බංකොලොත්භාවයට පත් කරනු ඇත. උග්‍රවෙමින් පවතින තත්වයෙන් මිදීමට තමන් තවත් ණය ලබාගන්නා බව (17%ක්) හෝ තමන්ගේ දේපොල විකුණන බව (7%ක්) ප්‍රකාශ කළහ.


[51] මූලාශ්‍රයඃ ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 2015 ජූනි.
[52] පවුල් ණයගැතිභාවයෙන් පසුවීමට නිවාස යෝජනා ක්‍රමය සමග සම්බන්ධ විවිධ සාධක හේතුවී ඇත. උදාහරණයක් දක්වන්නේ නම්, විශාල නිවසක් සඳහා ඔවුන් තුළ පවතින පුද්ගලික මනාපය/අභිලාෂය, මූල්‍ය සාක්ෂරතාව නොමැතිකම, ප්‍රදානයක් කළමනාකරණයේ ඇති දුර්වලතාව, උද්ධමනය නිසා ගොඩනැගිලි ද්‍රව්‍යවලට ඇති වන බලපෑම, කම්කරු කුලිය ඉහලයාම ආදිය.
[53] ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නොමිළයේ ලබාදෙන අතර මෙයින් අදහස් කෙරෙන්නේ අතිරේක උපකාරක පංති, අතිරේක නිල ඇඳුම් සඳහා දැරීමට සිදුවන වියදම්ය.

**"මම නිවස හදාගැනීමට ණයක් ගත්තා. සතියකට මම රුපියල් 1050 ක් ගෙවන්න ඕනැ. මට ස්ථිර ආදායමක් නැහැ. එය දුෂ්කර තත්වයක්. මම ණය මුදල ආපසු ගෙව්වෙ නැත්නම් බැංකුව මගේ නිවස පවරාගන්නවා. ඇතැම් වෙලාවට මට මගේ දුවට කන්න දෙන්නවත් මුදල් නැහැ. ඊලග කෑම වේල කොහොම සපයා ගන්නද මම දන්නේ නැහැ. හැම කෑමවේලක්ම සපයාගන්නෙ මහත් අරගලයක් කරලයි."**

**- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ බිරිඳ -**

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් වන්දියට අමතරව අතුරුදහන් වූ ඥාතීන් ගේ වැටුප්/විශ්‍රාම වැටුප් සහ නිවාස, වෘත්තීය පුහුණුව, ළමයින් සඳහා ශිෂ්‍යත්ව සහ නීති ආධාර වැනි අතිරේක ප්‍රතිලාභ ගණනාවක් සඳහා සුදුසුකම් ලබති. පහත සඳහන් වගුවෙන් වෙනත් පවුල් හා සැසඳීමේදී, ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සුදුසුකම් ලබන ප්‍රතිලාභ මාලාව පෙන්නුම් කරයි.

**ප්‍රස්තාරය 11: අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වලට ලැබෙන රාජ්‍ය ආධාර**




ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ බොහෝ පවුල් ඔවුන් සුදුසුකම් ලබන ප්‍රතිලාභ සඳහා ප්‍රවේශයේදී දුෂ්කරතාවන්ට මුහුණ නොදෙන අතර බලධාරීන් විසින් සපයනු ලබන විශේෂයෙන්, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ වැටුප් සහ විශ්‍රාම වැටුප් ලබාගැනීමේදී සෑහීමට පත්වන බව වාර්තා කොට ඇත. මෙම ප්‍රතිලාභ නිසා එම පවුල්වලට ආර්ථික වශයෙන් විශාල සෙතක් සැලසෙන නමුත් විශේෂයෙන් විවාහක අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ දෙමව්පියන්ට මුහුණදීමට සිදුවිය හැකි දුෂ්කරතා ගැන ICRCය දැනුවත් කරනු ලැබීය. අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයා අවිවාහක නම් දෙමව්පියන්ට අතුරුදහන් වූ පුද්ගලයාට අදාලවන වැටුප් සහ විශ්‍රාම වැටුප් සහ වන්දි මෙන්ම වෙනත් ප්‍රතිලාභ හිමිවෙයි. එසේවුවත් අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයා විවාහක නම්, නිරායාසයෙන්ම ඔහුගේ බිරිඳ ප්‍රතිලාභ සියල්ලම පාහේ ලබන අතර එම හේතුවෙන් මහළු දෙමව්පියන් විශේෂයෙන් වෙනත් දරුවන් නැති දෙමව්පියන් ආර්ථික වශයෙන් පීඩාවට පත්වීමක් සිදුවෙයි.

මෙම තක්සේරුවේදී පවුල් විසින් වාර්තා කරන ලද පරිදි එම දෙමව්පියන්ට "රණවිරු මාපිය දීමනාව" ලබාගැනීමට අයදුම් කළ හැකිය. එහෙත් අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ දෙමව්පියන් වාර්තා කළේ එයින් තමන් ලබන්නේ සුළු මාසික දීමනාවක් (දෙමව්පියන්ගෙන් එක් අයෙකුට මසකට රුපියල් 750 ක්) බැවින් එයින් ඔවුන්ගේ මුදල් ප්‍රශ්න නොවිසඳෙන බවයි. ඊට අමතරව එම පවුල් වාර්තා කළේ "රණවිරු මාපිය දීමනාව" නිසි වේලාවට සැමවිටම නොලැබෙන බව සහ/හෝ ඇතැම් අයට අයදුම් කිරීමේ කාර්යාවලිය සංකීර්ණ, දීර්ඝ සහ අපහසු නිසා අඩු අධ්‍යාපනයක් ලබා ඇති පවුල්වලට සැලකිය යුතු ගැටළුවක් වී ඇති බවයි.

**"බලධාරීන් ලබාදෙන සියළුම ප්‍රතිලාභ ලැබෙන්නේ මගේ ලේලියටය. මටයි මගේ භාර්යාවටයි ලැබෙන්නේ "රණවිරු මාපිය දීමනාව" මගින් මසකට ගෙවන රුපියල් 750 පමනයි. ජීවත්වන්න එය ප්‍රමාණවත් නැහැ."**

**- ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයෙකුගේ පියා -**

## 5.4. නෛතික සහ පරිපාලන අවශ්‍යතා

මෙම තක්සේරුව පවත්වන ලද අවස්ථාවේදී බහුලව පැහැදිලිවූ ප්‍රධාන ප්‍රශ්නයක් වූයේ පුද්ගලයෙකුගේ තත්වය "අතුරුදහන් පුද්ගලයෙකු" ලෙස ශ්‍රී ලංකාවේ නීතිය මගින් පැහැදිලිව පිළිනොගැනීම අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් පරිපාලන ගැටළු දුෂ්කරතාවලට පමණක් නොව මානසික උභතෝකෝටිකයකට පත්කිරීමයි. මෙම නීතිය මගින් මිනිසුන් මැරුණු හෝ ජීවත්ව සිටින යන ප්‍රවේශයක් තෝරා ගනී.[54] එනිසා ස්වකීය ඥාතීන් අතුරුදහන්ව සිටින පුද්ගලයන්ගේ පවුල් අපේක්ෂා කරන යම් සහන ලබාගැනීම රඳපවතින්නේ ඔහු/ඇය ජීවතුන් අතර සිටින බව ඔප්පු කළ නොහැකිය යන කරුණ මත අතුරුදහන් පුද්ගලයා මියගිය බව නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීම මතය.

**"අප උපදින අවස්ථාවේදී ප්‍රලේඛන කිරීමක් ඇත. අප මළ විට ඒ බව පවසන සහතිකයක් ඇත. මගේ ස්වාමිපුරුෂයා අතුරුදහන්වී ඇත. ඔහු අතුරුදහන් වූ පුද්ගලයකු ලෙස ප්‍රකාශයට පත්කිරීම පිණිස උප්පැන්න සහ මරණ සහතික හැර වෙනත් නෛතික ලියවිල්ලක් තිබිය යුතුය."**

**- අතුරුදහන් පුද්ගලයෙකුගේ බිරිඳ -**

[54] පණතේ දක්වා ඇති හේතු නිසා අතුරුදහන් වී ඇතැයි පවසන පුද්ගලයන්ගේ මරණ ලියාපදිංචි කිරීමට විධිවිධාන සැලසීම පිණිස 2010 අංක 19 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත නීතිගත කරන ලදී. ICRC දන්නා පරිදි මෙම පනත් ක්‍රියාත්මක කිරීම 2013 අගෝස්තු මාසයේදී අංක 1824/3 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2015 දෙසැම්බර් මස 09 දින දක්වා දීර්ඝ කරන ලදී.

මරණ සහතිකයක් ලබාගැනීම මත යැපීමට සිදුවන හෙයින් මෙම පවුල් ඔවුන්ගේ එදිනෙදා අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේදී පහත දැක්වෙන නෛතික සහ/හෝ පරිපාලන බාධක පවතින බවට අවධානයට යොමු කොට ඇත:

- අතුරුදහන් පුද්ගලයාගේ බැංකු ගිණුම භාවිත කිරීමට හෝ වැසීමට නොහැකිවීම;
- අතුරුදහන් පුද්ගලයා විසින් ඇති කරගන්නා ලද රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමේ දුෂ්කරතා;
- අතුරුදහන් පුද්ගලයා විසින් උකස් තබන ලද දේපළ නිදහස් කරගැනීමට නොහැකිවීම;
- දරුවන් පාසල්වල ඇතුළත් කිරීමේ දුෂ්කරතා;
- සේවායෝජකයා විසින් තැන්පත් කරන ලද අතුරුදහන් පුද්ගලයාගේ මාසික වැටුප ලබා ගැනීමට නොහැකිවීම;
- අතුරුදහන් පුද්ගලයාට අයිති ඉඩම් වැරදි ආකාරයෙන් අල්ලා ගත් විට ආපසු ලබා ගැනීමට නොහැකිවීම;
- අතුරුදහන් පුද්ගලයාට අයිති චංචල හෝ නිශ්චල දේපළ යොදා ගනිමින් ගනුදෙනු කිරීමට නොහැකිවීම / දුෂ්කරතා .

මේ අනුව මෙම පවුල්වලට ඇතැම් ප්‍රතිලාභ ලබාගැනීමට සහ ඇතැම් අයිතිවාසිකම් බුක්තිවිඳීමට නම් අතුරුදහන් ඥාතියා මියගිය බව නිලවශයෙන් ප්‍රකාශයට පත් කිරීම හැර වෙනත් විකල්ප නැත. තම ඥාතියා මැරුණු බව සනාථ කරන තුරු බොහෝ අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් (66%ක්) මරණ සහතිකයක් ලබා ගැනීම පිණිස අයදුම් කිරීමට සූදානම් නැති අතර එහි ප්‍රතිඵලය වන්නේ ඔවුන්ගේ දෛනික දිවිපෙවත අඛණ්ඩව පවත්වා ගෙනයාම පිණිස අවශ්‍ය වන සේවා සහ ප්‍රතිලාභ ලබාගැනීමේ ප්‍රවේශයට බාධාවක් ඇතිවීමයි.

**"ඔවුන් මියගිය බව සනාථ කිරීමට අපට ඇති සාක්ෂි මොනවාද? පවුලේ සාමාජික කාඩ්පතට පුද්ගලයෙකුගේ නමක් ඇතුළත් කිරීමටත් අපට ලිපිලේඛන රැසක් පෙන්වන්න සිද්ධ වෙනවා. ඒ නිසා කොහොමද කිසියම් පුද්ගලයෙකු අපෙන් බලාපොරොත්තුවන්නේ කිසිම සාක්ෂියක් හෝ ලිපිලේඛනයක් හෝ නැතිව මරණ සහතිකයක් ලබාගැනීම."**

**- අතුරුදහන් පුද්ගලයෙකුගේ මව -**

මරණ සහතිකයක් ලබා ගැනීම පිණිස ඉල්ලා ඇති පවුල්වලින් බහුතරය එසේ ඉල්ලා ඇත්තේ මූලික වශයෙන් ආර්ථික[55]/ පරිපාලන අවශ්‍යතා නිසා බව මෙම තක්සේරුවේදී හෙළිවිය. මරණ සහතිකයක් ලබාගෙන/ලැබී ඇති[56] / පවුල්වලින් 47%ක් ප්‍රකාශ කළේ ඔවුන්ට විකල්පයක් තෝරා ගැනීමේ හැකියාව තිබුණේ නම්, තමන්ගේ ඥාතියා "අතුරුදහන් පුද්ගලයෙකු" වශයෙන් පිළිගැනීමේ විකල්පය තෝරා ගන්නා බවයි.

මෙම තක්සේරුවේදී අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් යළි යළිත් මතුකළ ගැටළුවක් වූයේ තමන් වෙනුවෙන් පවතින සේවා සහ සමාජ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ගැන දැන ගැනීමට දුෂ්කරතා පවතින බවයි.

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් ඉදිරිපත් කළ කරුණු ලැයිස්තුවක් පහත දැක්වෙයි.

- වන්දි සඳහා හිමිකම් ලබන්නේ කවුද, ලැබෙන වන්දි ප්‍රමාණය සහ වගකීම පැවරී ඇති අධිකාරිය ඇතුළු අනුගමනය කළ යුතු කාර්යාවලිය ගැන එම පවුල් තුළ පැහැදිලි අවබෝධයක් නැතිකම.
- ඉඩම් කට්ටි වෙන්කර දීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් අදාල බලධාරීන්ගෙන් ඔවුන්ගේ අයදුම්පත ගැන විමසීමේදී එම පවුල්වෙත ප්‍රතිචාරයක් ලැබී නොතිබීම.
- අතුරුදහන් වන අවස්ථාව වන විට අතුරුදහන්ව සිටින පුද්ගලයා විවාහවී සිටියේ නම්, බොහෝවිට අතුරුදහන් වූ පුද්ගලයාගේ කලත්‍රයාට වන්දි සහ වෙනත් ප්‍රතිලාභ ගෙවනු ලැබේ. මෙමගින් අතුරුදහන්ව සිටින පුද්ගලයාගෙන් යැපෙමින් සිටි දෙමව්පියන්ට අඩු ආධාරයක් ලැබෙයි.[57]
- "රණවිරු මාපිය" දීමනාව ලැබීමට අදාල ප්‍රශ්න එනම් අඛණ්ඩව සහ ස්ථාපිත කාර්යපටිපාටිය අනුව එය නොලැබීම හෝ යම් කාලපරිච්ඡේදයකින් පසුව එම දීමනාව නතර කිරීම.

සමාජ ප්‍රතිලාභ යෝජනා ක්‍රම වලට ප්‍රවේශය සම්බන්ධයෙන් ඉහතින් සඳහන් කළ බොහෝ ප්‍රශ්න වෙනත් අතුරුදහන් සියළු පුද්ගලයන්ගේ පවුල්වලටත් අදාල වන අතර තක්සේරුව පවත්වන අවස්ථාවේදී අතුරුදහන්ව සිටි පුද්ගලයන්ගේ වෙනත් පවුල් පළ කළ කරුණු මෙසේ සාරාංශයක් ලෙස ඉදිරිපත් කළ හැකිය:

- මරණ සහතිකයක් ලබා ගැනීම, සමෘද්ධි දීමනාව ලබාගැනීම, වන්දි ලබා ගැනීම ආදී තමන්ට හිමි දේ ලබා ගැනීම පිණිස අනුගමනය කිරීමට ඇති කාර්යාවලිය සහ ඒ සඳහා හමුවිය යුතු බලධාරීන් කවුරුන්දැයි යන කරුණු ගැන මෙම පවුල්වලට පැහැදිලි අවබෝධයක් නැතිකම.
- පරිපාලන ක්‍රියාදාමය භාර නිලධාරීන් සමග මුහුණපාන ප්‍රශ්න:
  - ලිපිලේඛන සැකසීමේ අනවශ්‍ය ප්‍රමාදයන් (මරණ සහතිකයක් නිකුත් කිරීමේදී හෝ මරණ සහතිකය පදනම් කොට ගෙන වන්දි ඉල්ලා සිටීමේදී) උදාහරණ දක්වන්නේ නම්, ඉල්ලුම්පත් සැකසීමට නොවුමනා/ පැහැදිලි නොකළ කාලයක් ගතකිරීම, දේශපාලන පක්ෂපාතීකම් ගැන චෝදනා, මෙම ක්‍රියාවලිය ගැන බලධාරීන් විසින් කෙරෙන නොමග යැවීම්;
  - මරණ සහතිකයක් / වන්දියක් සඳහා අයදුම් සකස්කිරීමේ දී අනුගමනය කිරීමට ඇති කාර්යාවලිය නොදැනසිටීම;
  - මරණ සහතිකයක් සඳහා අයදුම්පතක් සකස්කිරීමට ඇති නොකැමැත්ත / ප්‍රත්ක්ෂේප කිරීම නිසා වන්දිය සඳහා හිමිකම වලකාලීම;
  - මුල් පදිංචි දිස්ත්‍රික්කයෙන්[58] ඉදිරිපත් කර නැති අවස්ථාවලදී අයදුම්පතක් සකස්කිරීම ප්‍රතික්ෂේප කිරීම (යුද්ධය කාලයේදී හෝ පසුව පවුල් අවතැන්වී ඇති අවස්ථාවලදී).

[55] වැඩි විස්තර සඳහා පවුල්වල ආර්ථික අවශ්‍යතා ගැන සඳහන් ඡේදය බලන්න.
[56] මෙයින් අදහස් කෙරෙන්නේ අයදුම් කිරීමකින් තොරව මරණ සහතිකයක් ලැබූ ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ පුද්ගලයන් ලෙස සැලකෙන තැනැත්තන්ගේ පවුල් ය.
[57] වැඩි විස්තර සඳහා පවුල්වල ආර්ථික අවශ්‍යතා ගැන සඳහන් ඡේදය බලන්න.
[58] අතුරුදහන් වූ පුද්ගලයා අතුරුදහන් වන අවස්ථාවේ ඔහු /ඇය පදිංචිව සිටි ලිපිනය.

- මරණ සහතික හෝ වන්දි ලබා ගැනීම පිණිස අවශ්‍යකරන ලිපිලේඛන ඉදිරිපත් කිරීමට පවුල්වලට නොහැකිවීම උදාහරණ වශයෙන් හැඳුනුම්පත්, මරණ සහතික ආදිය.
- තමන්ගේ කොටස (ද්‍රව්‍යවලින් හෝ ශ්‍රමයෙන්) ලබාදී දායකවීමට නොහැකිවීම නිසා පවුල් නිවාස හෝ සමාජ සුභසාධක ප්‍රතිලාභ ලබාගැනීම පිණිස සුදුසුකම් නොලැබීම, උදාහරණ වශයෙන් දැඩි ලෙස අවදානමට ලක්ව සිටීම නිසා.
- පවුල් සංතකයෙහි ඇති ලිපිලේඛන රජයේ නිලධාරීන් විසින් වලංගු ඒවා ලෙස නොපිළිගැනීම (එයට හේතුව එම ප්‍රදේශ එල්ටීටීඊ පාලනය යටතේ පැවති අවදියේදී ඒවා එම සංවිධානය විසින් නිකුත් කරන ලද ඒවා වීමයි).

මෙයට අමතරව සෙසු සියළු අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් සඳහා ඇති වන්දි ක්‍රමය සහ ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සඳහා ඇති වන්දි ක්‍රමය අතර අසමපාතයක් ඇතිබව ICRC විසින් නිරීක්ෂණය කරන ලදී.

## 5.5. යුක්තිය ඉටුවීමේ සහ පිලිගැනුමේ අවශ්‍යතාව

සන්නද්ධ ගැටුමේ වෙනත් වින්දිතයන්ට ඇති බොහෝ අවශ්‍යතාවන්ට සමාන අවශ්‍යතා අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල් සඳහා ඇති අතර ඔවුන්ට විශේෂිත තොරතුරු දැනගැනීමේ ප්‍රමුඛ අවශ්‍යතාවක්ද ඇත.[59] තමන්ගේ අතුරුදහන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට මෙම පවුල්වලට ඇති පරම අවශ්‍යතාව, ඔවුන්ගේ ඥාතියා අතුරුදහන්වීම ගැන වගවිය යුතු පුද්ගලයන් කවුරුන්දැයි දැනගැනීමේ අවශ්‍යතාව ඇතුළු වෙනත් අවශ්‍යතා දක්වා ව්‍යාප්තවී ඇත. ඇතැම් පවුල් තුළ තමන්ගේ අතුරුදහන් වූ ඥාතීන්ට අත්වූ ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට ඇති අවශ්‍යතාව සහ යුක්තිය ඉටුවීමේ අවශ්‍යතාව අතර පැහැදිලි සම්බන්ධයක් ඇති බව දැකිය හැකිය.

වෙනත් බොහෝ රටවලදී ICRC ය ලබා ඇති අත්දැකීම්වලින් පෙනීයන්නේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට සැමවිටම පහත දැක්වෙන කරුණු ගැන පිළිගැනුමක් අවශ්‍යව ඇති බවයි:

- අතුරුදහන් වූ පුද්ගලයාගේ ගරුත්වය සහ නෛසර්ගික අගය;
- අතුරුදහන්වීම සිදුවී ඇති බව;
- අපරාධකරුවන්ගේ වගකීම; සහ
- අතුරුදහන්වීම් සිදුවීම ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍යව ඇති පියවර.[60]

වගවීමේ අවශ්‍යතාව සපුරාලීම පිණිස මෙම පවුල් කැමැත්ත පළකරන යාන්ත්‍රණ සම්බන්ධයෙන් බලන විට ICRC ය ලබා ඇති අත්දැකීම්වලින් පෙන්වන්නේ මේවා අධිකරණ සහ /හෝ අධිකරණ නොවන ඒවා විය හැකි නමුත් ඒ සියල්ල, සිදුවී ඇති හානිය සඳහා යුක්තිය ඉටුකිරීමේ සහ පිලිගැනීමේ අවශ්‍යතාවෙන් ඇතිවී තිබෙන බවයි.[61]

ජාත්‍යන්තර මානුෂවාදී නීතිය යටතේ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීමට සහ නඩුපැවරීමට රාජ්‍යයන්ට වගකීමක් ඇත.[62] ඒ අනුව ඕනෑම අතරමැදි ක්‍රියාවලියකදී වගවීමේ යාන්ත්‍රණ වැදගත් කොටසක් ලෙස ICRC ය සලකනු ලබයි.

### 5.5.1. යුක්තිය ඉටුකිරීමේ වැදගත්කම

මෙම වාර්තාවේ 4 වැනි වගන්තියෙන්[63] විස්තර කළ පරිදි මෙම තක්සේරුව පැවැත් වූ අවස්ථාවේදී ICRC ය යුක්තිය ඉටුකිරීම සහ වගවීම ගැන නිශ්චිත ප්‍රශ්න ඇසීමක් නොකළේය. එහෙත් මෙම පවුල් ඔවුන්ගේ ප්‍රමුඛතා ගැන කතාකරද්දී නිරායාසයෙන්ම ඔව්හු මෙම ප්‍රශ්න නැගුහ. එම අරුතෙන් ගත්විට මෙම වාර්තාවේ අඩංගු සොයා ගත් කරුණු මෙම පවුල්වල යුක්තිය ඉටුකිරීමේ අවශ්‍යතාව තක්සේරු කිරීමක් ලෙස නොසැලකිය යුතු අතර එය සම්මුඛ සාකච්ඡාව පැවැත්වූ අවස්ථාවේ ඔවුන්ගේ ප්‍රමුඛතා පෙන්නුම් කිරීමක් ලෙස සැලකිය යුතුය. මෙම අවශ්‍යතාව සම්බන්ධයෙන් පවුල්වල ප්‍රතිචාර අර්ථදැක්වූ අවස්ථාවේදී ICRC ය අතුරුදහන් වූ පුද්ගලයන්ගේ විශේෂිත කාණ්ඩ කෙරෙහි අවධානය යොමු නොකළ බව විශේෂයෙන් සඳහන්කිරීම වැදගත්ය. තමන්ගේ ඥාතීන් අතුරුදහන්වීම සම්බන්ධයෙන් වගවිය යුතු පුද්ගලයන් කවුරුන්දැයි යන්න ගැන හෝඩුවාවක් නොමැතිව පවුල් ගණනාවක් පසුවන අතර සන්නද්ධ ගැටුමක් නිසා පවුලක පුද්ගලයෙකු අතුරුදහන්වීම සෑම අවස්ථාවකදීම එම ගැටුමේ පාර්ශවකරුවකු ගේ ක්‍රියාවක ඍජු ප්‍රතිඵලයක් නොවන බව සැලකිල්ලට ගැනීම වැදගත්ය.

තමන්ගේ අතුරුදහන් ඥාතියා සම්බන්ධයෙන් කුමන ආකාරයේ ප්‍රතිචාරක ක්‍රියාමාර්ගයක් හෝ පිළිගැනුමක් ඔවුන් අපේක්ෂා කරන්නේදැයි ඇසූ විට සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන ලද පවුල්වලින් තුනෙන් එකකට වැඩි පවුල් සංඛ්‍යාවක් පැවසුවේ වෙනත් දේවල් අතර ඔවුන්ට යුක්තිය ඉටුවිය යුතු බවයි. ඔවුන්ගේ අහිමිවීම සහ දුක්වේදනා පිළිගැනීමේ ක්‍රමයක් ලෙස යුක්තිය ඉටුවිය යුතු බව ප්‍රකාශ කරන 34%ක් පවුල්වලින් 17%ක් ඉල්ලා සිටියේ හානිපූරණ යුක්තිය ඉටුකිරීමකි.[64] 11%ක් මනාපය දක්වූයේ විපාකදායි[65] යුක්තිය ඉටුකිරීමකි. 6%ක් එම දෙකම ඉල්ලා සිටිති.

> **"ඇය වෙනුවෙන් මට කිසිම වන්දියක් අවශ්‍ය නැහැ. එය මම මාගේ දුව විකුණලා එම මුදලින් කනවා වගේ දෙයක්. ඒත් යුද්ධය නිසා ආර්ථික දුෂ්කරතා විඳින අයට රජයෙන් ලබාදෙන ආධාරයක් වශයෙන් මම එය බාර ගන්නවා."**
>
> **- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ මව -**

[59] ICRC වාර්තාව: අතුරුදහන් වූවන් සහ ඔවුන්ගේ පවුල් - රාජ්‍ය සහ රාජ්‍ය නොවන විශේෂඥයන්ගේ සමුළුවට පෙරාතුව සිදුවූ ක්‍රියාදාමයන්ගේ නිර්දේශයන්ගේ සාරාංශය (2003 පෙබරවාරි 19-21), p. 83, *https://www.icrc.org/eng/assets/files/other/icrc_themissing_012003_en_10.pdf.*

[60] එම ලියවිල්ලෙහිම.

[61] එම ලියවිල්ලෙහිම.

[62] Customary International Humanitarian Law, Rule 156, 158 and 161, *https://www.icrc.org/customary-ihl/eng/docs/v1_rul.*

[63] තක්සේරු ක්‍රමවේදය සම්බන්ධ ඡේදය/ /Section relating to the Methodology of the Assessment.

[64] හානිපූරණ හෝ වන්දි ගෙවීමේ යුක්තිය යනු වින්දිතයා සහ වරදකරුවා පුනරුත්ථාපන ක්‍රියවලියට සහභාගී වෙමින් අපරාධය නිසා සිදුවූ හානිය සමනය කිරීම සඳහා වෙන වෙනම සහ එකමුතුව ක්‍රියාකිරීමයි *Economic and Social Council (ECOSOC) Resolution 2002/12, Basic principles on the use of restorative justice programmes in criminal matters, http://www.un.org/en/ecosoc/docs/2002/resolution%202002-12.pdf.*

[65] විපාකදායී යුක්තිය යනු වැරදිකරුවන්ට ඔවුන් විසින් චේතනාන්විතව කරනලද හානි වලට ප්‍රමාණාත්මකව දඬුවම් පැමිණවීමයි. *K. M. Carlsmith and J. M. Darley (2008), Psychological Aspects of Retributive Justice, Advances in Experimental Social Psychology, Volume 40, page 193-236, http://www.colgate.edu/portaldata/imagegallerywww/184416d4-5863-4a3e-a73b-b2b6b86e7b60/ImageGallery/Carlsmith_Darley_2008.PDF.*

හානිපූරණ යුක්තිය ඉටුකිරීම කෙරෙහි කැමැත්ත දක්වන පවුල් ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ, දිවි පෙවත හා ජීවනෝපායන් යළි ගොඩනගාගැනීමේ, ඔවුන්ගේ පවුල්වලට උපකාර කිරීමේ, ළමයින්ට අධ්‍යාපනය ලබාදීමේ සහ අවසානයේ මූල්‍ය වශයෙන් ස්වාධීන තත්වයකට පත්වීමේ ක්‍රමයක් ලෙස මුදල් ආධාර ලබාදීම ගැන කතා කළහ.[66] මුදල් කන්දරාවකින් හෝ සේවාවලින් ප්‍රියාදරයෙකුගේ අහිමිවීමේ පාඩුව සම්පූර්ණයෙන් පියවා ගැනීමට නොහැකි වන අතර එය ඔවුන්ගේ දුක්වේදනා පිළිගැනීමට බලධාරීන් ගෙන් ලැබෙන සංඥාවක් ලෙස ක්‍රියාකරනු ලබයි.


හානිපූරණ පැකේජය බාරගැනීම එම පවුල් තමන්ගේ අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට අත්වූ ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට තොරතුරු සෙවීම අවසන්කිරීම පෙන්නුම් කිරීමක් ලෙස බලධාරීන් අර්ථනිරූපනය කළ හැකි බවට ඔවුන් තුළ බියක් ඇති බව මෙම පවුල් පැවසූහ.

## 5.5.2. පිළිගැනුම සඳහා වන අවශ්‍යතාව

සම්මුඛ සාකච්ඡා පවත්වන ලද පවුල්වලින් සියයට විසිතුනක් (23%) කිසියම් ආකාරයක පිළිගැනුමක් ඉල්ලා සිටියහ.[67]

පිළිගැනුම එක් එක් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් විසින් සුවිශේෂී ලෙස අර්ථ දක්වා ඇත. සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ ඇතැම් පවුල්වලට ප්‍රසිද්ධියේ පිළිගැනුම, අතුරුදහන්වීම් සිදුවූ බව පිළිගැනීමකින් යුක්තවෙයි. මෙම කරුණු අනුව ඇතැම් පවුල් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ නමින් පාරක් නම් කිරීම හෝ ඔවුන් සිහිපත් කිරීම පිණිස සිහිවටනයක් ඉදිකිරීම වැනි සංකේතාත්මක ස්මාරකයක් ඉල්ලා සිටියහ. සෙසු පවුල් ඔවුන් ගේ තත්වය අනුව රජය විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් මඟින් පිළිගැනුම සහ අතුරුදහන් වූ පුද්ගලයන් ගේ ජාත්‍යන්තර දිනය හෝ ජාතික වශයෙන් වෙන් කළ දිනයක් වෙනුවෙන් අනුස්මරණ උත්සව මඟින් ඔවුන්ගේ දුක්වේදනා සහ පාඩුව වාර්ෂිකව සිහිපත් කිරීමට මනාපය දක්වති. නිදහසේ කණ්ඩායම් ලෙස රැස්වී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ නමින් විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත්වලදී යම් කාර්යයක් කිරීමට නොහැකිවීම ගැන බොහෝ පවුල් කනස්සල්ල පළකළහ.

**ප්‍රස්තාරය 12: සම්මුඛ සාකච්ඡාවලට සහභාගිවූ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් අපේක්ෂා කරන පිළිගැනුමේ ක්‍රම**




**"අප අදාල ක්‍රියාදාමය අනුගමනය කරමින් දිස්ත්‍රික්කයේ අදාල අයට දැනුම්දීමක් කළත් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට එකට එකතුවී ඔවුන්ගේ අතුරුදහන් වූ ප්‍රියාදරයන් සැමරීමට අවසර ලැබෙන්නේ නැහැ."**

**- අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ සොයුරිය -**

සම්මුඛ සාකච්ඡාවලට සම්බන්ධ[68] වූ ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලින් 45%ක් පමණ සංඛ්‍යාවකට එම පවුල් සහ ඔවුන්ගේ ඥාතීන් "රට වෙනුවෙන්" කර ඇති සේවය පිළිගැනීමේ විශේෂ අවශ්‍යතාවක් ඇති බව ප්‍රකාශ කළහ. එවැනි පිළිගැනුමක් සන්නද්ධ හමුදා විසින් සංවිධානය කරනු ලබන, විශේෂයෙන් ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ නමින් පැවැත්වෙන නිල උත්සවයක ආකාරයෙන් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය ආරක්ෂක හමුදා සාමාජිකයන් වෙනුවෙන් සිත්තුළට කාවදින උත්සව පැවැත්විය යුතු බව එම පවුල් ප්‍රකාශ කළහ. ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ නම් බලධාරීන්ගේ ප්‍රසිද්ධ ලිපිගණුදෙනුවල අඩංගු කොට ඔවුන් ඉටු කළ සේවාව, ක්‍රියාන්විත රාජකාරියේ යෙදීසිටියදී මියගිය ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ සේවාව මෙන්ම විශේෂයෙන් පිළිගනිමින් අගය කිරීමක් මෙම පවුල් අපේක්ෂා කරති. මෙම පවුල්වලින් සුළු සංඛ්‍යාවක් ඔවුන් ගේ අතුරුදහන් වූ ඥාතීන්ට පිරිනමන ලද පදක්කම් ලබා ගැනීමටත් දැනට සන්නද්ධ සහ ආරක්ෂක හමුදා හාරයේ ඇති එම අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පෞද්ගලික බඩුබාහිරාදිය ඔවුන් වෙත ලබා ගැනීමටත් කැමති බව පැවසූහ. තවත් සමහරුන් ප්‍රකාශ කළේ ස්මාරකයක් ඉදිකිරීම හෝ මාර්ගයක් අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ නමින් නම් කිරීම වැනි සංකේතාත්මක ගරුකිරීමක් තමන්ට පිළිගත හැකි පිළිගැනුමක් බවයි.

**"ගැටුම පැවති කාලයේදී අතුරුදහන් වූ මගේ පුතා සහ ඔහු වැනි තවත් අය වෙනුවෙන් හමුදා නිලධාරියෙකු අසිපතක් ඔසවා ගෙන සිටින මෙන්ම ශ්‍රී ලංකා ධජය භාවිත කරමින් ඔහුට ගරුකොට උත්සවය අවසානයේ එම ධජය හකුලා මා අතට බාර දෙන සුදුසු උත්සවයක් පැවැත්වීම කෙරෙහි මම කැමතියි. ඊට අමතරව මගේ පුතා ගේ නමින් ස්මාරකයක් හෝ යම් ආකාරයක සිහිවටනයක් තියෙනවා දැකීමට මම කැමතියි."**

**- ක්‍රියාන්විත රාජකාරියේදී අතුරුදහන් වූ ආරක්ෂක හමුදා සාමාජිකයෙකුගේ මව -**

[66] මෙම වාර්තාවේ 5 පරිච්ඡේදයේ සඳහන් ආකාරයට අවශ්‍යතා ධූරාවලිය හා සැසඳෙන්නේය; පවුල් විසින් ආහාර, නිවස සහ පැවැත්ම වැනි මූලික අවශ්‍යතාවලට ස්වභාවිකවම ප්‍රමුඛතාවය දෙන අතර එම අවශ්‍යතාවයන් ඉටුවීමෙන් පසුව වෙනත් අවශ්‍යතා ගැන සිතීමට පෙළඹෙන්නේය.
[67] සමහර පවුල්වලට "පිළිගැනුම" යුක්තිය ඉටුවීමට සමාන වන්නේය.
[68] මෙම තක්සේරුව සිදුකිරීමේදී පවුල් 129 ක් සම්මුඛ සාකච්ඡාවට භාජනය කරනලදී.



Tuan Zaharan/ICRC

# 6. නිර්දේශ

මෙම වාර්තාවෙන් විස්තර දක්වා ඇති කරුණු පදනම් කොට ගෙන ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ගැටළු ආමන්ත්‍රණය කිරීම පිණිස රාජ්‍ය සහ රාජ්‍ය නොවන, ජාතික සහ ජාත්‍යන්තර පාර්ශවකරුවන්ට උපකාර කිරීම සඳහා නිර්දේශ කට්ටලයක් සම්පාදනය කොට ඇත. අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලිකරගැනීම පිණිස සහ ඔවුන්ගේ පවුල්වලට උපකාර කිරීමට මෙම ක්‍රියාවලියේ යෙදුණු කාලයේදී අතිරේක ආයාසයක් දරන ලදී.

## 6.1. ශ්‍රී ලංකාවේ බලධාරීන් වෙත යොමුකෙරෙන ප්‍රධාන නිර්දේශ[69]

සන්නද්ධ ගැටුමේ ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූ පුද්ගලයන් සොයා ගැනීමට සහ ඔවුන්ට අත්වී ඇති ඉරණම ගැන තොරතුරු[70] ඇත්නම් ඒවා ඔවුන්ගේ පවුල් වෙත සැපයීමට හැකි සෑම පියවරක්ම ගැනීමට ජාත්‍යන්තර මානුෂවාදී නීතියෙන් ගැටුමක එක් එක් පාර්ශවය වෙත වගකීමක් පවරා ඇත. ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ගැටළු විස්තීර්ණ ආකාරයෙන් ආමන්ත්‍රණය කිරීම පිණිස ජාතික බලධාරීන්ට උපකාර කිරීම සඳහා ICRC මෙම තක්සේරුවෙන් සොයා ගත් කරුණු පදනම් කොට ගෙන සවිස්තරාත්මක නිර්දේශ රහස්‍යව ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ඉදිරිපත් කොට ඇත. ශ්‍රී ලංකා බලධාරීන් වෙත ICRC ඉදිරිපත් කළ මෙම නිර්දේශ පහත සඳහන් ප්‍රධාන ගැටළු කේන්ද්‍රීය කොට සකසා ඇත.

### අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමේ අවශ්‍යතාව ගැන කටයුතු කිරීම

1.1. පවුල් පත්ව සිටින අවිනිශ්චිතතාවෙන් ඔවුන්ට සහන සැලසීම පිණිස සහ දැනගැනීමේ අවශ්‍යතාව සපුරාලීම පිණිස හැකි සෑම පියවරක්ම ගැනීම සහ පහත දැක්වෙන ප්‍රධාන අරමුණු සහිතව පාර්ලිමේන්තු පනතකින් ස්වාධීන යාන්ත්‍රණයක්[71] ස්ථාපිත කිරීම:

- 1.1.1. අතුරුදහන් වූ පුද්ගලයන්ට අදාල සිද්ධි වෙන වෙනම විසඳීම තුළින් අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලිකිරීම සහ ඒ පිළිබඳව ඔවුන්ගේ පවුල් දැනුවත් කිරීම.
- 1.1.2. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ජාතික ලැයිස්තුවක් ගොනු කිරීම.
- 1.1.3. අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලිකරගැනීමේ, අතුරුදහන්වීම් නිවාරණයෙහි සහ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල බහුවිධ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේ (ආර්ථික, නෛතික, පරිපාලන සහ මනෝසමාජීය) ක්‍රියාවලිවල නිරතව සිටින රජයේ ආයතනවල සහ වෙනත් සංවිධානවල කටයුතු සම්බන්ධීකරණය සහ විධිමත් කිරීම

1.2. අ) යහපත් තාක්ෂණික අධිකරණ වෛද්‍ය ධාරිතාවන් සංවර්ධනය කිරීම සහ එම පහසුකම් අතුරුදහන් වූ පුද්ගලයන්ගේ මළ සිරුරු පිරික්සුම, ආපසුලබාගැනීම සහ හඳුනාගැනීම පිණිස යොදාගැනීමට තිබීම;

ආ) අතුරුදහන් වූ පුද්ගලයන්ගේ මරණ සම්බන්ධයෙන් මළ සිරුරු ආපසු ලබාගැනීම, හඳුනාගැනීම සහ හැකිවිට ඒවා ආපසු බාරදීම ඇතුළු පූර්ණ විමර්ශන සිදුකිරීමට වරමක් ලබාදෙන සුදුසු නෛතික රාමුවක් සම්මත කරගැනීම; සහ

ඇ) මෙම නෛතික රාමුව අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි යන්න පිළිබඳව ඔවුන්ගේ පවුල්වලට කාර්යක්ෂමව සහ සඵලදායි ලෙස තොරතුරු ලබාදීම ප්‍රවර්ධනය පිණිස අදාල සියළු පාර්ශවකරුවන් අතර සන්නිවේදනය, සහයෝගිතාව සහ සම්බන්ධීකරණය වර්ධනය කරයි.

### මනෝසමාජීය අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

1.3. පහත දැක්වෙන ක්‍රියාමාර්ග ඔස්සේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල මනෝසමාජීය අවශ්‍යතා ආමන්ත්‍රණය කරනු ලබයි.

- 1.3.1. පුරප්පාඩුව පවතින උපදේශන තනතුරු මනෝසමාජීය උපදේශන උපාධිධාරීන්ගෙන් පිරවීම. උපදේශන නිලධාරීන් සඳහා ඇති පුහුණු අවස්ථා වැඩිකිරීම සහ විවිධ රේඛීය අමාත්‍යාංශ මඟින් සිදුකෙරෙන උපදේශන සේවා සියල්ල ආවරණය වන පරිදි සමර්පිත සම්බන්ධීකරණ ආයතනයක් පිහිටුවීම.
- 1.3.2. ප්‍රදේශයේ පවතින සම්පත් සහ සම්සුරුවන් (හිතවතුන්) මෙම පවුල්වල යහපත පිණිස ආධාර කරන දිස්ත්‍රික්ක මූල ආධාරයක ස්වරූපයෙන්, පවුල්වල අවශ්‍යතා සඳහා සංවිධානාත්මක සහ සම්බන්ධීකරණයකින් යුත් ආධාර ක්‍රමයක් තිබිය යුතු නිසා මනෝසමාජීය ආධාරක සේවා ක්ෂේත්‍රවල වැඩකරන රාජ්‍ය නොවන සංවිධානවලට සහ ප්‍රජා මූල සංවිධානවලට පුළුල් ප්‍රවේශයක් සැපයීම.

1.4. සැකසහිත අහිමිවීම සහ ඒ පිළිබඳව උපදේශනයෙන් මැදිහත්වීමේ න්‍යාය සහ සායනික මනෝසමාජීය විෂය මාලාවල මෙන්ම සමාජ ක්‍රියාකාරකම් විෂයමාලාවල ආශ්‍රිත මැදිහත්වීමේ මාර්ගෝපදේශ[72] තෘතීය අධ්‍යාපන මට්ටමේදී ඒකාබද්ධ කිරීම.

1.5. ඔවුන්ගේ අතුරුදහන් වූ ඥාතීන් අනුස්මරණය කිරීමේදී සැමට ආරක්ෂාව ඇතැයි යන හැඟීමක් දනෙන, පවුල්වලට කණ්ඩායම් ලෙස සාමකාමීව එක්රැස්වී සමරු වැඩසටහන්[73] සංවිධානය කිරීමේ නිදහස සලසන පරිසරයක් සැකසීම.

---

[69] පවුල්වල අවශ්‍යතා තක්සේරුව පිළිබඳ රහස්‍ය වාර්තාවක් 2016 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකාවේ බලධාරීන්වෙත ඉදිරිපත් කරන ලදී.
[70] චාරිත්‍රානුකූල ජාත්‍යන්තර මානුෂවාදී නීතියෙහි රීති 117 *https://www.icrc.org/customary-ihl/eng/docs/v1_rul.*
[71] උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිසමේ (2011) අවසන් වාර්තාවේ නිර්දේශ 9.48 සහ 9.50 බලන්න.
[72] Boss, P (2006), Loss, Trauma and Resilience: Therapeutic work with Ambiguous Loss, W.W.Norton Company, INC, ISBN:978-0-393-70449-5.
[73] Boss, P (2006), Loss, Trauma and Resilience: Therapeutic work with Ambiguous Loss, W.W.Norton Company, INC, ISBN:978-0-393-70449-5.

## ආර්ථික අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

1.6. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සියළුම පවුල් ගැටුමේ වින්දිතයන් ලෙස පිළිගැනීම සහ ඔවුන්ගේ ප්‍රයෝජනය පිණිස සේවා සහ ප්‍රතිලාභ සැපයීමේදී ඒකාකාරී බවක් පැවතීම සහ වෙනස්කොට සැලකීමක් නොවන බවට වගබලාගැනීම සහ ඔවුන්ට සේවා සැලසීම.

1.7. වත්මන් සංදර්භය තුළ, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් මුහුණපාන දුෂ්කරතා ආමන්ත්‍රණය කිරීම පිණිස විශේෂිත සමාජ ප්‍රතිලාභ පැකේජයක් (ගොන්නක්) සැලසුම් කිරීම. එසේ කිරීමේදී, මෙම පැකේජ නම් සටහන් කිරීමට විශේෂ අවධානය යොමු කිරීම වැදගත්ය (එය කෙසේද යත් 'වන්දිය' යන වචන භාවිත නොකිරීම සහ හානිපූරණ පැකේජයක් ආකාරයෙන් සමාජ ආධාරය නොසැපයීම).

1.8. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් සඳහා ඇති සමාජ ආධාර යෝජනා ක්‍රම සහ ඒවා ලබා ගැනීමට ප්‍රවේශවීමේ කාර්යපටිපාටිය සාරාංශ කොට විස්තර කරන තොරතුරු ඔවුන් වෙත ලබාදීම.

## නෛතික සහ පරිපාලන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

1.9. අතුරුදහන් වූ පුද්ගලයන් සඳහා නෛතික තත්වයක් පිළිගැනීම සහ ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පරිපාලන රාමුව පිහිටුවීම. එසේ අවශ්‍ය වන පවුල් සඳහා දක්නට නොමැති සහතික ක්‍රමය හඳුන්වාදීම මගින් එම පවුල්වලට අතුරුදහන් වූ පුද්ගලයා මියගිය බව ප්‍රකාශයට පත් නොකොට තම ප්‍රියාදරයන් නොමැතිවීමෙන් පැනනගින නෛතික සහ පරිපාලන ප්‍රශ්න ආමන්ත්‍රණය කිරීමට ඉඩලැබේ.

1.10. අදාල සහතික හා ලිපිලේඛන (උප්පැන්න සහතික, විවාහ සහතික, හැඳුනුම්පත්, ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිවීම ආදිය) ලබාගැනීම ඇතුළු සේවා සහ ප්‍රතිලාභවලට ප්‍රවේශය පිණිස අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට පහසුකම් සැලසීම පිණිස පවතින රීති සහ ක්‍රියාපටිපාටි සංශෝධනය කිරීම සලකා බැලීම.

1.11. විවිධ නෛතික සහ පරිපාලන කාර්යපටිපාටි සහ ඔවුන්ගේ අවශ්‍යතා ගැන භාෂාත්‍රයෙන් මහජනතාවට තොරතුරු සැපයීම.

## පිළිගැනුම සහ යුක්තිය ඉටුවීමේ අවශ්‍යතා

1.12. සියළු අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල සමීප සහභාගිත්වයෙන් ඔවුන්ගේ අතුරුදහන් වූ ඥාතීන් පිළිබඳ මතකය රැකගැනීමට අවශ්‍ය අනුස්මරණය කිරීම වෙනුවෙන් කැපවන දිනයක් වැනි ක්‍රමයකින් පවුල්වල අවශ්‍යතාව පිළිගැනුමේ මාර්ග සලකා බැලීම.

1.13. මෙම පවුල්වල වගවීමේ සහ යුක්තිය ඉටුවීමේ අවශ්‍යතාව ප්‍රමාණවත් අයුරින් ආමන්ත්‍රණය කිරීම පිණිස කුමන ආකාරයේ සංක්‍රාන්ති යුක්ති විනිශ්චය යාන්ත්‍රණයක් පිහිටුවිය යුතුදැයි තීරණය කිරීම සඳහා අදහස් විමසීම්වලට අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් ඇතුළත් කර ගැනීම.

# 6.2. සෙසු පාර්ශවකරුවන් සඳහා නිර්දේශ

අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලි කරගැනීමේ සහ අතුරුදහන් වූ පුද්ගලයන් ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස පහත දැක්වෙන ක්‍රියා මාර්ග මගින් ඔවුන්ගේ මූලික වගකීම සපුරාලීමට රාජ්‍ය බලධාරීන්ට උදව් කරන ලෙස ICRC ය සෙසු පාර්ශවකරුවන්ගෙන් ඉල්ලා සිටී.

1.1. අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලි කරගැනීම ප්‍රවර්ධනය සහ ඒ වෙනුවෙන් අරමුදල් සැපයීම.

1.2. සන්නද්ධ ගැටුමට සම්බන්ධයක් ඇතිව අතුරුදහන් වූ සියළු පුද්ගලයන්ගේ පවුල් ප්‍රමුඛතාව යොමුවන කාර්යයක් ලෙස සලකා, ඔවුන්ගේ හඳුනාගත් බහුවිධ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ඔවුන්ගේ යහපත උදෙසා වැඩසටහන් සම්පාදනය කිරීම, සහ මෙම අවශ්‍යතා ප්‍රමාණවත් ලෙස සහ සාකල්‍ය ලෙස ආවරණය කිරීම පිණිස ප්‍රමාණවත් අරමුදල් වෙන්කිරීම ගැන සලකා බැලීම.

1.3. සංක්‍රාන්තීය යුක්තිය පිළිබඳ කාරණයේදී අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වල ප්‍රශ්න ගැන සංවාදය දිගටම පවත්වා ගෙනයාම සහ එම කාර්යාවලියට අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල් ඇතුළත් කිරීම දිරිගැන්වීම.

1.4. ගැටුමෙන් වින්දිතයන් බවට පත්වූ සියළු කාණ්ඩවලට උපකාර කිරීමේදී දරන ප්‍රයත්න ද්විවිධවීමක් නොකර ඇතිවිය හැකි සියළුම පරතරයන් ආවරණය වන අයුරින්, ප්‍රමාණවත් ලෙස ආධාර උපකාර කරන බව සහතික කිරීමට, බලධාරීන් සමග, අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වල බහුවිධ අවශ්‍යතාවලට සමකාලීන කරන ලද ප්‍රතිචාරයක් දැක්වීම ගැන වගබලා ගැනීමට හැකිවන අයුරින්, ඒ සම්බන්ධයෙන් දරන ප්‍රයත්න සම්බන්ධීකරණය කිරීම.



Tuan Zaharan/ICRC

# 7. ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූ පුද්ගලයන් සහ ඔවුන්ගේ පවුල්වලට හිතකරලෙස ICRC ඉටුකරන කාර්යයන්

ICRC 1989 දී මෙරට සිය සේවා ඉටුකිරීම නිත්‍ය වශයෙන් ආරම්භ කළ දින සිට ශ්‍රී ලංකාවේ කලින් පැවති සන්නද්ධ ගැටුමට සම්බන්ධයක් ඇතිව අත්අඩංගුවට ගැනීම්, පවුල්වලින් වෙන්වීම් සහ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වාර්තා කරන ලද සිද්ධි ලියාපදිංචි කිරීමේ සහ විසඳීමේ යෙදී සිටී. වර්තමානයේදී ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී අතුරුදහන් වූ ආරක්ෂක හමුදා නියුක්තියන් 5100 කට වැඩි පිරිසක් ගැන වාර්තාකිරීම් ඇතුළු ICRC වෙත රටේ සෑම ප්‍රදේශයකින්ම ඉදිරිපත් කොට ඇති අතුරුදහන්වූවන් පිළිබඳ නොවිසඳුනු සිද්ධි සංඛ්‍යාව 16000 ඉක්මවයි.

අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට පවුල්වලට ඇති අවශ්‍යතාව ප්‍රවර්ධනය කිරීම පිණිස ICRC නිරතුරුව අදාල බලධාරීන් සමග සංවාදයක යෙදී සිටී. අතුරුදහන් වූ පුද්ගලයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලි කරගැනීමට සහ ඔවුන් ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට බලධාරීන් දරන ප්‍රයත්නවලදී ඉල්ලා සිටින අවස්ථාවලදී මෙම සංවිධානය බලධාරීන්ට විශේෂඥ මාර්ගෝපදේශ සපයයි.

ගතවූ වසර ගණනාව තුළ ICRC සන්නද්ධ ගැටුමේ වින්දිතයන්ට සෘජුව ආධාර ලබාදීමේ සිට දේශීය ව්‍යූහයන් සහ බලධාරීන් දරන ක්‍රියාමාර්ගවලට සහාය වෙමින් සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතියෙහි දක්වා ඇති ඔවුන්ගේ වගකීම් සහ බැඳීම් සපුරාලීමට ක්‍රියාකාරීන් උනන්දු කිරීම දක්වා විවිධාකාරයේ ක්‍රියාමාර්ග ගෙන ඇත.

මරණ සහතිකයට විකල්පයක් ලෙස දක්නට නොමැති සහතිකයක සංකල්පය ශ්‍රී ලංකාවේ නීතියට හඳුන්වාදීමට ICRC 2011 වසරේ සිට බලධාරීන් සමඟ සංවාදයක යෙදී සිටී. ICRC විසින් යෝජනා කර ඇති පරිදි, අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ අභිලාෂයන් සුරක්ෂිත කිරීම සඳහා 'දක්නට නොමැති සහතිකයක්' මගින් ඔහුගේ /ඇයගේ ඥාතීන්ගේ සහ යැපෙන්නන්ගේ ඉක්මන් අවශ්‍යතා ආමන්ත්‍රණය කරන අතර, අතුරුදහන් වූ පුද්ගලයාගේ දේපළ සහ වත්කම් කළමනාකරණය පිණිස තාවකාලික විධිවිධාන යෙදීමට ඉඩ සලසයි.

වෙනත් ගැටළු අතර, අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි දැනගැනීමට පවුල්වලට ඇති අවශ්‍යතාවට පිළිතුරුදීම පිණිස සහ ඔවුන්ගේ බහුවිධ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට රජයේ සියළු ආයතනවල කාර්යයන් සම්බන්ධ කිරීමට සහ විධිමත් කිරීමට හැකිවන පරිදි ජාතික යාන්ත්‍රණයක් පිහිටුවීම සම්බන්ධයෙන් ICRC ය කරුණු ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල අවශ්‍යතා ගැන වඩාත් හොඳින් අවබෝධ කරගැනීමට හැකිවන පරිදි විස්තීර්ණ තක්සේරුවක් කිරීමට සහ එයින් සොයා ගන්නා කරුණු අනුව මෙම අවශ්‍යතා හොඳින් ආමන්ත්‍රණය කරන්නේ කෙසේදැයි නිර්දේශ ඉදිරිපත් කිරීමට ICRC කළ යෝජනාව ශ්‍රී ලංකාවේ රජය විසින් 2014 දී පිළිගන්න ලදී.

ICRC ය අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල යහපත පිණිස ඉටු කරන මානුෂීය කාර්යයන්ගේ කොටසක් ලෙසින් සහ පවුල්වල අවශ්‍යතා තක්සේරුව මඟින් හඳුනාගත් ඔවුන්ගේ බහුවිධ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම පිණිස දේශීය සංවිධානවල සහභාගිත්වයෙන් සහ ශ්‍රී ලංකා රජයේ සහ පළාත් බලධාරීන්ගේ එකඟත්වය ඇතිව දිස්ත්‍රික්ක ගණනාවක අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල් සඳහා උපකාරක වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.

මෙම උපකාරක වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණ වන්නේ ස්වකීය ඥාතීන් අතුරුදහන්වීම නිසා හටගත් දුෂ්කරතා සම්බන්ධයෙන් කටයුතු කරගෙනයාමට අතුරුදහන් පුද්ගලයන්ගේ පවුල්වල ලඟම ඥාතීන්ගේ හැකියාව ශක්තිමත් කිරීමයි. මෙම වැඩසටහන මඟින් විශේෂයෙන් ආමන්ත්‍රණය කෙරෙන්නේ:

- එම පවුල්වල මනෝ සමාජීය ආතතිය අඩුකිරීමෙන් සහ පුද්ගලයන්, පවුල් සහ ප්‍රජා මට්ටමේදී ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය වැඩිකරමින් දෛනික ප්‍රශ්න සහ වගකීම්වලට මුහුණදීමට ඔවුන්ගේ ධාරිතාවන් සවිමත්කිරීම අරමුණු කොට ගෙන මනෝසමාජීය ආධාර මාර්ගයෙන් පවුල්වල මානසික අවශ්‍යතාවන්. තනිපුද්ගලයන්ට කරන ආධාර මඟින් එකිනෙකාට උපකාර කරගන්නා කණ්ඩායම් බිහිකිරීම මඟින්ද එය සිදු කෙරේ.
- පවුලේ ප්‍රධාන ආදායම් උපයන්නා හෝ වෙනත් ආර්ථික ආධාර දායකයෙකු අතුරුදහන්වීමෙන් සිදුවී ඇති බලපෑම ඉලක්ක කොට ගත් ආධාර වැඩසටහන් මාර්ගයෙන් වඩාත් පීඩාවට පත්ව සිටින පවුල්වල ආර්ථික අවශ්‍යතා; සහ
- වර්තමාන පළාත් පාලන සහ රාජ්‍ය නොවන සේවා සැපයුම්කරුවන්ට යොමුකිරීම් මාර්ගයෙන් නෛතික සහ පරිපාලන අවශ්‍යතා. උදාහරණයක් වශයෙන් සජීවීකරණ සහායිකාවෝ, සමෘද්ධි, නිවාස ණය, ක්ෂුද්‍ර ණය, ආදී දැනට පවතින විවිධ සහන යෝජනා ක්‍රමවලින් ප්‍රයෝජන ගැනීමට අයදුම් කිරීමට සහ ඒවා ලබාගැනීමට පරිපාලන කාර්යපටිපාටි මාර්ගයෙන් පවුල්වලට ආධාර කරති. ඔවුන් වාසය කරන ප්‍රදේශයේ සේවාවලට ප්‍රවේශවීමෙන් මෙම පවුල්වලට අවශ්‍ය නම් ඔවුන්ගේ පරිපාලන දුෂ්කරතා ආමන්ත්‍රණය කිරීම පිණිස සහතික ලිපිලේඛන ලබාගනිතිඃ ඉඩම් හිමිකම් පැවරීම, ඔවුන්ගේ අතුරුදහන් ඥාතීන් ගේ වත්කම් සඳහා ප්‍රවේශය, විශ්‍රාම වැටුප්, දක්නට නොමැති සහතික ආදිය.

නොවැම්බර් මාසයේදී අනුරාධපුරයෙන් ආරම්භ කරනලද වැඩසටහන, පසුව 2015 දෙසැම්බර් මාසයේදී මන්නාරම දිස්ත්‍රික්යේත්, 2016 මාර්තු මාසයේදී ත්‍රිකුණාමලය දිස්ත්‍රික්යේත් දියත් කරන ලදී. 2016 වසරේදි ශ්‍රී ලංකාවේ තවත් පවුල් කරා එය ව්‍යාප්ත කෙරේ. ICRC විසින් සැලසුම් කරන ලද මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ එම ප්‍රදේශවල හවුල්කාරිත්ව සංවිධාන සහ බිම් මට්ටමේ සත්කාර සේවා සැපයුම්කරුවන් මාර්ගයෙනි.

අවාසනාවට අතුරුදහන් පුද්ගලයන්ගෙන් ඇතැමුන් ඔවුන්ගේ අතුරුදහන්වීමෙන් පසුව මිය යන්නට ඇත. මේ හේතුව නිසා ඔවුන්ගේ අනන්‍යතාවය ඔවුන්ට ආපසු ලබාදීම සහ ඔවුන් ආපසු ඔවුන්ගේ ඥාතීන්ට භාර දීම සඳහා, මිනිස් මළසිරුරු සෙවීම, ආපසු ලබා ගැනීම සහ විශ්ලේෂණය කිරීම, අතුරුදහන්වූවන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි පැහැදිලි කරගැනීමේ කාර්යාවලියෙහි අත්‍යවශ්‍ය කොටසකි. මෙම කාර්යයන් ඉටුකළ යුත්තේ, කාලයකට පෙර මියගිය පුද්ගලයන්ගේ සැකසහිත හෝ නරක්වී ඇති මළසිරුරු - අස්ථි - ගොඩගැනීමට ගැලපෙන ආකාරයෙන් වළවල් හෑරීම සහ ඒවා විශ්ලේෂණය කිරීම ගැන අවශ්‍යවන නිශ්චිත නිපුණතා මාලාව සම්බන්ධයෙන් පුහුණුව ලත් විශේෂඥයන් විසිනි. මෙය විශේෂයෙන් වැදගත්වන්නේ බොහෝ මළ සිරුරු එකට සමූහ මිනීවළවල්වල වළලා ඇති අවස්ථාවලදීය. එයින් සුවිශේෂී සහ සංකීර්ණ අභියෝග ඉදිරිපත් විය හැකිය.

ICRC ශ්‍රී ලංකාවේදී තනි හෝ සමූහ මිනීවළවල්වලින් මළ සිරුරු ගොඩගැනීම හෝ ඒවා හඳුනා ගැනීම හෝ වැනි අධිකරණ වෛද්‍ය විමර්ශන සිදු නොකරන අතර එයට හේතුව මෙරට දැනටමත් අධිකරණ වෛද්‍ය පද්ධතියක් ක්‍රියාත්මකවීමයි. එසේවුවත් ICRC දැනට ක්‍රියාත්මක ආකෘතියට ආධාර සපයයි.

ශ්‍රී ලංකාවේ අධිකරණ වෛද්‍ය විශේෂඥයෝ නිතිපතා මැතදී මියගිය අය සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය විමර්ශන සිදුකරති. එසේවුවත් බොහෝ රටවල මෙන් මෙම විශේෂඥයෝ මිනිස් ඇට ගොඩගෙන විශ්ලේෂණය කිරීමට විශේෂයෙන් සමූහ මිනීවළවල්වල ඇති මිනිස් ඇටකටු විශ්ලේෂණය කිරීමට අවශ්‍ය කරන විශේෂිත නිපුණතාවන්හි විශේෂ ප්‍රවීනත්වයක් ලබා නැත. මේ හේතුව නිසා ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය ව්‍යාඨවේදීන් ගේ විද්‍යාලය සමග සම්බන්ධීකරණයකින් කොළඹ විශ්ව විද්‍යාලයේ දී අධිකරණ වෛද්‍ය මානව විද්‍යාව සහ පුරා විද්‍යා විද්‍යාපති වැඩසටහනක් ස්ථාපිත කිරීමට උදව් කරයි. එය මිනිස් ඇට ගොඩගැනීම සහ විශ්ලේෂණය සම්බන්ධයෙන් විශේෂඥ ඥානය යොමුකිරීමක් වෙයි. කොළඹ අධිකරණ වෛද්‍ය සහ ධූලක විද්‍යා ආයතනයේ ශික්ෂණ රසායානගාරයක් පිහිටුවීමටද ICRC ආධාර කරන අතර අධිකරණ වෛද්‍ය මානව විද්‍යා රසායානාගාරයක් ලෙස ක්‍රියාත්මක වන එම රසායනාගාරයේදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඇටකටු විශ්ලේෂණය කළ හැකිවෙයි. මෙම විද්‍යාපති වැඩසටහන ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම වත්මන් අධිකරණ වෛද්‍ය වෘත්තිකයන් පමණක් ඉලක්ක කරගෙන සිදුවන්නක් නොව, එය අතුරුදහන් වූ පුද්ගලයන්ගේ මළසිරුරු හෝ ඇට කැබලි ගොඩ ගෙන විශ්ලේෂණය කිරීමේ රටේ දිගුකාලීන ප්‍රයත්නයන් සඳහා මෙම විශේෂඥ ඥානය ස්ථිර ලෙස මුල්බැස ගැනීම පිණිස වැඩපිළිවෙලක් සපයමින් රටෙහි මෙම අංශයේ තිරසර විශේෂඥ ඥානය සහතික කිරීමට උපකාර වෙයි.

ඉල්ලීමක් ලැබුණ හොත් සහ තමන්ගේ වරම සමග ගැලපෙයි නම් ICRC ය අතුරුදහන් වූ පුද්ගලයන්ගේ මළසිරුරු හෝ ඇට කැබලි වෘත්තීයමය වශයෙන් සහ සවිස්තරාත්මකව කළමනාකරණය කරන බවට වගබලා ගැනීම පිණිස උපකාර කිරීම සඳහා අඛණ්ඩව තාක්ෂණික සහ ප්‍රතිපත්ති මට්ටමින් විශේෂඥ මාර්ගෝපදේශ සහ ආධාර සපයනු ලැබේ.



Tuan Zaharan/ICRC

# 8. අවසාන නිගමනය

ස්වකීය ප්‍රියාදරයන් අතුරුදහන්වීමේ ප්‍රතිඵලයක් ලෙස අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට දැනෙන හැඟීම් විවිධාකාර වන්නාසේම මානසික සහ සමාජීය යන විෂය දෙකම සම්බන්ධයි. ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්කවලින් පිරිමි, ගැහැණු, වැඩිහිටියන්, බාලවයස්කරුවන්, සිංහල, දමිළ සහ මුස්ලිම්, හමුදා සාමාජිකයන්, එල්ටීටීඊ සමාජිකයන් අතුරුදහන්වීම නිසා පවුල් දහස් ගණනකට මෙම මානසික සහ සමාජීය දුක්වේදනා වල බර අත්කර දී ඇත. ඥාතීන්ගේ අතුරුදහන්වීමේ ඵලයක් ලෙස ඇතිවූ මෙම දුක්වේදනා සහ අභියෝග නිමාවක් දැකීම පිණිස විසඳගැනීම කිසිම ආකාරයකින් සරල නොවන නමුත් මෙම තක්සේරුවෙන් සොයාගත් කරුණු මෙම අවශ්‍යතා සහ අභියෝග ආමන්ත්‍රණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට සහ ඊට ආධාර කිරීමට අවශ්‍ය තොරතුරු සපයන බව අපේක්ෂා කෙරේ.

ICRC ය පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවලදී අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් ප්‍රකාශ කළ තත්වයන්ගේ සාරාංශයක් මෙම වාර්තාවෙන් සපයන බැවින් ඔවුන් මුහුණපා සිටින වඩාත් පීඩාකාරී අවශ්‍යතා සහ අභියෝග ගැන ඍජු විස්තර බෙදාගැනීමට ක්‍රමයක් සපයයි. එහෙයින් එය පවුල්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රයත්න ඉලක්ක කර තිබෙන බව සහ ගැලපෙන බව තහවුරු කරන මෙවලමක් ලෙස මෙය සැලකිය යුතුය.

මේ අතර ICRC අතුරුදහන් වූ ප්‍රියාදරයන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි යන තොරතුරු සෙවීමේදී එම පවුල්වලට දිගටම උපකාර කරනු ලබයි. මෙම පවුල් එදිනෙදා, අතුරුදහන් වූ ඥාතීන්ට අත්වී ඇති ඉරණම සහ ඔවුන් කොහේ සිටිත්දැයි නොදන්නා නිසා ඇතිවූ අවිනිශ්චිතතාවෙන් දිවිගෙවීමේදී, අභියෝගවලට මුහුණදීම සඳහා මෙන්ම මෙම ගැටළු ආමන්ත්‍රණය කිරීමේදී බලධාරීන්ට සහ වෙනත් පාර්ශවකරුවන්ට ICRC අඛණ්ඩව ආධාර කරයි.

මෙම කටයුතු සම්බන්ධයෙන් හෝ මෙම වාර්තාවෙහි අන්තර්ගතයෙන් පැනනැගිය හැකි යම් වෙනත් සාකච්ඡාවක් ගැන පිටකවරයෙහි පිටුපස සපයා ඇති සම්බන්ධතා විස්තර අනුව කොළඹ ජාත්‍යන්තර රතු කුරුස දූත මණ්ඩලය සමග සම්බන්ධවීමට පාඨකයන්ට ඇරයුම් කෙරේ.

**"මම මගේ ස්වාමිපුරුෂයා මියගියාද නැත්නම් ජීවත්ව සිටිනවාද යන්න නොදැන ගතවූ වසර 23 මුළුල්ලේ මගේ ජීවිතය ගෙවෙනවා. මගේ ළමයින් සියළු දෙනාම විවාහ වෙලා ජීවත් වෙනවා. ඒත් මම ගතකරන්නේ හුදකලා ජීවිතයක්. මම චෛතසිකව සහ මානසිකව විඩාවට පත්වෙලා. කවුරු හරි මගේ ස්වාමිපුරුෂයාට වුනේ කුමක්දැයි මට කියනව කියල මට විශ්වාසයි."**

**- අතුරුදහන් පුද්ගලයෙකුගේ භාර්යාව -**

**මෙහෙවර**

අපක්ෂපාතී, මධ්‍යස්ථ සහ ස්වාධීන සංවිධානයක් වන ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සුවිශේෂි මානුෂවාදී මෙහෙවර වන්නේ සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්හි වින්දිතයන් ගේ ජීවිත සහ ගරුත්වය ආරක්ෂා කිරීම සහ ඔවුන්ට ආධාර සැපයීමයි. ජාත්‍යන්තර මානුෂවාදී නීතිය සහ විශ්ව මානුෂවාදී මූලධර්ම ප්‍රවර්ධනය කරමින් සහ ශක්තිමත් කරමින් මිනිසුන්ගේ දුක්වේදනා නිවාරණයටද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ප්‍රයත්න දරයි. 1863 දී පිහිටුවන ලද ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ජිනීවා සම්මුති සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ මුල් සංවිධානයයි. මෙම කමිටුව සන්නද්ධ ගැටුම් සහ වෙනත් ප්‍රචණ්ඩ තත්වයන්හිදී මෙම සංවිධානය ඉටු කරන ජාත්‍යන්තර කාර්යයන් මෙහෙයවීම සහ සම්බන්ධීකරණය කරයි.

ICRC

0133/259 11.2016 250